ISSN 1391 - 1031
2019 ජනවාරි
24 වෙළුම 09 කලාපය

ආධාරය රු 40/=

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

"අවසාන විග්‍රහයේදී දේශපාලන නිදහස සහ පංති අරගලය පිළිබඳ මහා ප්‍රශ්න විසඳෙන්නේ බලය අනුවම පමණි. මෙම බලය සූදානම් කිරීම හා සංවිධානය කිරීමත්, ආරක්ෂාව සඳහා පමණක් නොව ප්‍රහාරය සඳහාද, එය ක්‍රියාශීලී ලෙස උපයෝගී කර ගැනීමත් අප සතු කාර්යය වන්නේය."

**ලෙනින්**
**තෝරාගත් කෘති 03 වැනි වෙළුම, 28 වැනි පිටුව**

## 05
## ප්‍රජාතන්ත්‍රවාදය...



ජ.වි.පෙ. ඇතුළු එම බලවේග ඉදිරිපිට ඇත්තේ එකිනෙක බැඳුණු ක්‍රියාමාර්ග දෙකකි. ඉන් පළමුවැන්න මේ පාර්ලිමේන්තුව තුළම 20වැනි සංශෝධනය...

## 07
## ආර්ථිකයේ අගාධය...



විසර්ජන පනතේ රජයේ සේවා වියදම ලෙස උපරිමයට වියදම් කළ හැකි (ණය වාරික හා පොලී හැර) සේවාවන්ගේ සීමාව...

## 09
## සමාජවාදය ගැන...



"නිෂ්පාදනය සිදු කරන්නේ ලාභය උදෙසාය. භාවිතය සඳහා නොවේ. වැඩකළ හැකි සහ වැඩ කිරීමට අපේක්ෂා කරන අයට...

## 11
## පළමු සමාජ පරිවර්තනය...



ප්‍රාථමික සමාජයේ සූරාකෑම නොවූයෙත් පංති නොපැවතුණේත් මිනිසුන් සවිඥානිකව එවැන්නක් ප්‍රතික්ෂේප කළ නිසා නොව එකී සමාජයේ පැවති නිෂ්පාදන...

සංවාදය.................. 03
තරුණ.................. 04
ආවර්ජනා.................. 06
ජාත්‍යන්තර.................. 08
කාන්තා.................. 10
කාලීන.................. 12
වේදිකාව.................. 13
විශ්ලේෂණ.................. 14




# පුළුල්තම ජනතා මධ්‍යස්ථානය එළිදැකීම මේ වසරේදී!

වසර 70ක දේශපාලනය ප්‍රතික්ෂේප කරමින් රට හදන, රට රකින ප්‍රතිපත්ති සහිතව ජාතික විද්වත් සංවිධානය ඇතුළු සිවිල් සංවිධානත්, වමේ හා ප්‍රගතිශීලී විවිධ සංවිධානත් ඒකාබද්ධ කරගනිමින් පුළුල්තම ජනතා මධ්‍යස්ථානය මේ වසරේ මැද භාගය වන විට එළිදැක්වීමට නියමිත බව නියමුවා වෙත වාර්තා වේ.

හුදු මැතිවරණ ප්‍රකාශනයකින් ඔබ්බට යන ලාංකේය ඉතිහාසයේ මෙබඳු පුළුල් ප්‍රතිපත්තිමය වැඩපිළිවෙළක් පදනම්කරගනිමින් ගොඩනැගුණු මධ්‍යස්ථානයක් නොමැති අතර මෙය ලාංකේය දේශපාලනයේ එබඳු දේශපාලන බලවේගයක නවමු අත්දැකීම වනු ඇත.

රටට තවත් පවතින සමාජ ආර්ථික දේශපාලන ක්‍රමය තුළ ඉදිරියට යා නොහැකි බව අවබෝධ කර ගත් විවිධ සමාජීය හා වෘත්තික බලවේගයන්හි ඉදිරිගාමී පිරිස් ජාතික විද්වත් සංවිධානය ලෙස රට හදන, රට රකින මෙම ප්‍රතිපත්තිමය වැඩපිළිවෙළ සකස් කරන ලද අතර එම වැඩපිළිවෙළ මෙම වසරේ පෙබරවාරි මාසයේදී පමණ ජනතාව හමුවේ තැබීමට අපේක්ෂිතය.

අනතුරුව එම වැඩපිළිවෙළ පදනම් කරගනිමින් වසර 70ක් පුරා ඉටු නොවුණු රටේ සහ ජනතාවගේ අපේක්ෂාවන් ඉටුකිරීම වෙනුවෙන් ජනතාවාදී පාලනයක් ගොඩනැගීම ඉලක්ක කරගත් පුළුල් ජනතා මධ්‍යස්ථානය ජනතා විමුක්ති පෙරමුණේද දායකත්වය ඇතිව ගොඩනැගීමට සැලසුම් කර ඇතැයි මේ පිළිබඳව කරන ලද විමසුමකදී ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා නියමුවා වෙත ප්‍රකාශ කළේය.

"මෙම මධ්‍යස්ථානය ජනතාවට අලුත් දේශපාලන අත්දැකීමක් වේවි. ඒ වගේම වසර 70ක අසාර්ථක පාලනයන්ගෙන් හෙම්බත් වුණු මේ රටේ අතිමහත් ජනතාව මෙම මධ්‍යස්ථානය ඉත සිතින් වැළඳ ගනීවි. පවතින විනාශකාරී, කොල්ලකාරී ආර්ථික රටාව පරාජය කරන සහ සාධාරණ, ප්‍රජාතන්ත්‍රවාදී දියුණු සමාජයක් වෙත ජනතාවට ප්‍රවේශය ලබා දෙන ජනතාවාදී පාලනයක් එය විසින් ඉතා ඉක්මණින් ජනතාවට ජයග්‍රහණය කර දෙනු ඇති." ටිල්වින් සිල්වා සහෝදරයා විශ්වාසය පළ කළේය.

## සැබෑ ජනතා ජයග්‍රහණයක් වෙනුවෙන් වූ අරගලයට ජ.වි.පෙ. සූදානම්

### ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා



ඔක්තෝබර් 26 දේශපාලන කුමන්ත්‍රණයෙන් මුළු රටටම හානියක් කර ඇති බැවින් එහි බරපතළකම සෙවීමට පාර්ලිමේන්තුවේ කොමිසමක් පත්කළ යුතු බව අවධාරණය කළ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා, ජනතාව තමන්ට ලබාදී තිබෙන මන්ත්‍රීධුර හයෙන් කළ හැකි උපරිම දේ කරන නමුත් පාර්ලිමේන්තුවේදීද අගමැතිවරයෙක් පත්කිරීමට කිසිදු කණ්ඩායමකට සහාය ලබානොදෙන බවත් සැබෑ ජනතා ජයග්‍රහණයක් වෙනුවෙන් වූ අරගලය ඉදිරියටත් ප්‍රගතිශීලී ජනතාව සමග සිදුකිරීමට ජ.වි.පෙ. සූදානම් බවත් කියා සිටියේය.

ඔහු මෙසේ පැවසුවේ පසුගිය 14වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකට සහභාගි වෙමිනි. දෙසැම්බර් 13වැනි දින ලැබුණු ඓතිහාසික නඩු තීන්දුව පිළිබඳ ජනතා විමුක්ති පෙරමුණේ ස්ථාවරය ප්‍රකාශ කිරීම සඳහා මෙම මාධ්‍ය හමුව පැවැත්විණි. වැඩිදුරටත් අදහස් දැක්වූ විජිත හේරත් සහෝදරයා මෙසේද පැවසීය.

"ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දුන් තීන්දුවක් ඓතිහාසික එකක්. පසුගියදා සිදුවුණු දේශපාලන කුමන්ත්‍රණය පරාජය කරන්න ජ.වි.පෙ. ලෙස අපි තීරණාත්මක ක්‍රියාමාර්ග ගත්තා. පාර්ලිමේන්තුවේදී, අධිකරණයේදීත් නොබියව, නොපැකිළව අරගල කළා. ඒ වගේම මහපාරේ ප්‍රගතිශීලී ජනතාව සමග අරගල කළා. එම අරගලයේ තීරණාත්මක තීන්දුවක් ලෙස අධිකරණය විසින් දේශපාලන කුමන්ත්‍රණයේ පරාජය සනිටුහන් කළා. එම තීන්දුව ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ලැබුණු වැදගත් තීන්දුවක්. එය එක්සත් ජාතික පක්ෂය හෝ රනිල් වික්‍රමසිංහගේ ජයග්‍රහණයක් නොවේ. එම නඩු තීන්දුව 19වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් ලබපු ජයග්‍රහණයක්. ප්‍රගතිශීලී ජනතාවගේ ජයග්‍රහණයක්.

ජනාධිපතිවරයා විසින් දිගින් දිගටම ව්‍යවස්ථාව උල්ලංඝනය කළොත් රට තවත් අවුල් වෙනවා. මීට වඩා භයානක තත්වයක් ඇතිවිය හැකියි. එවැනි තත්වයකට එරෙහිව ජනතා නැගිටීම් ඇතිවිය හැකියි. එනිසා අපි ජනාධිතිවරයාට කියන්නේ එවැනි තත්වයක් ඇතිවීමට ඉඩ ලබා නොදෙන ලෙසයි. කුමන්ත්‍රණය ඇතිවෙන මොහොතේදී අපි කිවුවා, ඒක පරාජය කළ යුතුයි කියලා. ඒ වගේම ඒක පරාජයට පත්කළා. දැන් කළ යුතුව තිබෙන්නේ විධායක ජනාධිති ක්‍රමය අහෝසි කිරීමත් ඉතාම කෙටි කාලයකින් මැතිවරණයකට යාමත් පමණයි. මේ මොහොතේ හදන ආණ්ඩුවට ජනතාවගේ සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමටවත් ජනතාවගේ අනෙකුත් ප්‍රශ්නවලට විසඳුම් ලබාදීමටවත් හැකියාවක් නැහැ."

**යුක්තිගරුක දේශයක්!   සාධාරණ සමාජයක්!!   නිවහල් මිනිසෙක්!!!**

# සටන් බිම

## අධ්‍යාපන සමුපකාරයේ (EDCS) වාරණය ඉවත් කෙරේ



අධ්‍යාපන සමූපකාර සමිතියේ වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලයට සාවද්‍ය චෝදනා එල්ලකරමින් අධිකරණය මගින් සිදු කළ වාරණය පසුගිය 13 දින ඉවත් කරන ලදී.

අධ්‍යාපන ආමාත්‍යාංශයේ සේවයේ නියුතු සාමාජිකයෙකු ඇතුළු සාමාජිකයින් 04 දෙනෙකු විසින් අධ්‍යාපන සමූපකාරයේ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු පසුගිය ඔක්තෝබර 12වැනිදා සිට අත්හිටුවූ අතර මේ හේතුවෙන් දීපව්‍යාප්තව පිහිටා ඇති එහි දිස්ත්‍රික් කාර්යාල 21ක සාමාජිකයින් 195,000කගේ සාමාජික සේවාවන් සම්පූර්ණයෙන් ඇනහිට තිබිණි.

කෙසේ නමුත් මෙම පැමිණිල්ල නැවත විභාගයට ගත්පසු අධ්‍යක්‍ෂක මණ්ඩලයට සිදු කළ වාරණය ඉවත් කිරීමට කටයුතු කෙරිණි. මෙම වාරණය ඉවත් කිරීමෙන් පසු අධ්‍යක්‍ෂ මණ්ඩලය පිළිගැනීමේ උත්වයක් අධ්‍යාපන සමූපකාරයේ පැවැති අතර එහිදී ලංකා ගුරු සේවා සංගමයේ ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා පැවසූයේ අධ්‍යාපන සමූපකාරය තුළ පසුගිය කාලයේ සිදු කළ දූෂණ වංචාවලට හවුල් වූ නිලධාරීන් කිහිප දෙනෙකුගේ වුවමනාව මත 800ක් පමණ වන අධ්‍යාපන සමූපකාර සේවකයින් හා ලක්ෂ දෙකක් පමණ වන සාමාජිකත්වයේ වුවමනාවන් යට කිරීමට කිසිසේත් ඉඩ දිය නොහැකි බවය.

## රාජ්‍ය සේවා කළමනාකරණ සහකාර නිලධාරීන්ගේ 18වැනි සමුළුව මුළුදෙයි




රාජ්‍ය සේවා කළමනාකරණ සහකාර නිලධාරීන්ගේ සංගමයේ 18වැනි නියෝජිත සමුළුව පසුගියදා කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. සේවා ගැටලු විසඳාගැනීමට, ප්‍රජාතන්ත්‍රවාදය දිනාගැනීමට, වැඩකරන ජනතා බලයක් ගොඩනැගීමට රාජ්‍ය හා පළාත් රාජ්‍ය කළමනාකරණ සේවාව පෙළගස්වන යන තේමාව යටතේ මෙම සමුළුව ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. රාජ්‍ය සේවා කළමනාකරණ සහකාර නිලධාරී සංගමයේ සභාපති යූ. පලිහවඩන, ලේකම් චන්දිම විමලසුරේන්ද්‍ර ඇතුළු නියෝජිතයින්ගේ විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් මෙම සමුළුව පැවැත්විණි.

## වරාය සමුපකාර බැංකුවෙන් 5 වසර සිසුන්ට ශිෂ්‍යාධාර




සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතිය මගින් මෙහෙයවන වරාය සමුපකාර බැංකුව මගින් වාර්ෂිකව පිරිනමන 5 වසර ශිෂ්‍යාධාර ලබාදීමේ උත්සවය පසුගිය 14 දින මහරගම තරුණ සේවා සභා ශාලාවේදී පැවැත්විණි. 'ඔබේ මුදල් ඔබේ දරුවට' තේමාව යටතේ පහ වසර ශිෂ්‍යත්වය සමත් දරුවන් විශාල පිරිසකට ශිෂ්‍යාධාර හා තිළිණ ලබාදීම මෙහිදී සිදු වූ අතර ඒ සඳහා සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතියේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති, එම සමිතියේ ලේකම් චන්‍ද්‍රසිරි මහගමගේ සහෝදරුවරු ඇතුළු සමුපකාර බැංකු නිලධාරීහු සහභාගි වූහ.

## ඒකඟතා කඩකර දේශපාලන පත්වීම් ලබාදුනහොත් නැවතත් වෘත්තීය ක්‍රියාමාර්ග - මහින්ද ජයසිංහ

දේශපාලන පලිගැනීම් මත අධ්‍යාපන පරිපාලන සේවය විදුහල්පති සේවය ඇතුළු සේවාවන්ට පත්වීම් 1014 ක් ලබා දීමට එරෙහිව තම සංගමය ගෙන ගිය වෘත්තීය ක්‍රියාමාර්ග හමුවේ එම පත්වීම් අත්හිටවුවද නැවත වරක් රාජ්‍ය සේවා කොමිසන් සභාව මගින් එම පත්වීම් නැවත ලබාදීමට කටයුතු කරන්නේ නම් දැඩි වෘත්තීය ක්‍රියාමාර්ග ගැනීමට සිදුවන බව ලංකා ගුරුසේවා සංගමයේ ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා පවසයි.

මේ පිළිබඳව ජනාධිපතිවරයා වෙත ලිපියක් ලියා ඇති එම සංගමය මෙම පත්වීම් නිර්දේශ කිරීමට පෙර මේ අය සඳහා මුල්‍යමය සහනයක් ලෙස වැටුප් වර්ධක ගණනාවක් ලබාදී ඇති බවය. එය අදාළ සේවා ව්‍යවස්ථාවන් හා ආයතන සංග්‍රහය උල්ලංඝනය කරමින් අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් සිදුකර ඇති බවත් එයද නීති විරෝධී ක්‍රියාවක් බවත් ඔහු අවධාරණය කර ඇත.

## රු. 1000/- වැටුප් වැඩිවීම ඉල්ලා රට පුරා වතු කම්කරු උද්ඝෝෂණ



වතු කම්කරු දෛනික මූලික වැටුප රුපියල් 1000/- දක්වා ඉහළ දමන ලෙස ඉල්ලමින් දියත්වෙන වර්ජන සහ විරෝධතා රට පුරා දියත් වෙමින් ඇත. මේ වනවිට කඳුකරයේ කම්කරුවන් දෛනික සේවා කටයුතු සඳහා වාර්තා නොකර සතියකට ආසන්න වෙමින් තිබේ.

මස්කෙළිය වැවිලි සමාගමට අයත්, මස්කෙළිය, බ්‍රන්ස්වික් තේ වතුයායේ කම්කරුවෝද පසුගියදා එම වත්තේ තේ කර්මාන්ත ශාලාව ඉදිරිපිටදී උද්ඝෝෂණයක නිරත වූහ.

එමෙන්ම පසුගියදා දෙනියාය වතු කම්කරුවන් විසින් විරෝධතාවයක් පැවැත්වූ අතර එම විරෝධතාවයේ නියුතු කම්කරුවන් හමුවීමට ගිය ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු මන්ත්‍රී, මාතර දිස්ත්‍රික් නායක සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා එම කම්කරුවන්ගේ ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡාවකද නිරත විය. මෙම අවස්ථාවට සමස්ත ලංකා වතු කම්කරු සංගමයේ ලේකම් ජේ.එම්.ඒ. ප්‍රේමරත්න සහෝදරයාද සහභාගි විය.

මෙහිදී උද්ඝෝෂණයට එක්ව සිටි කම්කරුවන් කියා සිටියේ, දැඩි වෙහෙසක් දරා සේවා කටයුතුවල නිරතව සිටින තමන්ට දිනක මූලික වැටුප ලෙස අවම රුපියල් 1000ක මුදලක් වතු සමාගම්වලට දිය හැකි බවත් සමාගම් විසින් වාර්ෂිකව අධික ලාබයක් උපයමින් සිටින බවත්ය.

# එතෙරින්...

## මධු සහෝදරිය තරුණ සම්මේලනයේ උප සභාපති ධූරයට!



සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ජාත්‍යන්තර කටයුතු ලේකම් මධු කල්පනා සහෝදරිය ලෝක ප්‍රජාතන්ත්‍රවාදී තරුණ සම්මේලනයේ (WFDY) උප සභාපති ධූරය සඳහා තේරී පත්වී ඇත. සමාජවාදී ශිෂ්‍ය සංගමයේ විධායක සභික ධූරයක් දරන ඇය විවෘත විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂිකාවක් වන අතර නීති විද්‍යාලයේ නීති උපාධියද සම්පූර්ණ කරන ලදී. පක්ෂයේ පූර්ණකාලීන දේශපාලනයේද නියුතු මධු සහෝදරිය ඉදිරියේදී WFDY උප සභාපති ලෙස හංගේරියාවේ බුඩාපෙස්ට් මූලස්ථානයේ කටයුතු සඳහා පූර්ණකාලීනව අනුයුක්ත කරනු ඇත.

## නලින් හේවගේ ඩුබායි ඉල් මහ විරු සමරුවට

ඩුබායිහි පැවති 29වන ඉල්මහ විරු සමරු වැඩසටහන සඳහා දකුණු පළාත් සභා ජ.වි.පෙ. මන්ත්‍රී, පක්ෂයේ මධ්‍යම කමිටු සාමාජික නලින් හේවගේ සහෝදරයා සහභාගි විය.





## ජනතා විමුක්ති පෙරමුණේ අලුත් අවුරුදු පණිවුඩය

**අලුත් අවුරුද්දේ පුද්ගලික ජීවිතය මෙන්ම පොදු දේශපාලනය අරභයා අසාර්ථක බව පසක් කරගත් සියලු ආකල්ප පසෙකලා අලුතින් සිතා අලුත් තීරණ ගැනීමට සූදානම් වන්නැයි ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා ශ්‍රී ලාංකේය ජනතාව වෙත 2019 වෙනුවෙන් අලුත් අවුරුදු පණිවිඩයක් නිකුත් කරමින් ප්‍රකාශ කර සිටී. එම පණිවිඩය සම්පූර්ණයෙන් මෙසේය.**

අප දැනට භාවිතා කරන දින දසුනට අනුව වසරක් ඉකුත්වී ගොස් 2019 නව වසරට එළඹ තිබේ. වසරක් ගෙවී නව වසරක් උදාවන විටම 'සුබ නව වසරක් වේවා'යි අපි එකිනෙකාට සුබ පතා ගැනීම, සුබ පැතුම් පත් යැවීම සම්ප්‍රදායක් ලෙස සිදුකරමු. මෙසේ සිරිතක් ලෙස වසර ආරම්භයේදී අප එකිනෙකාට සුබ පතා ගත්තද එය හුදු ප්‍රාර්ථනයකට වැඩි දෙයක් වන්නේ නැත. සැබැවින්ම අපේ සමාජයේ සාතිශය බහුතරයකට සුබපැතුම්වලින් පසුව එළඹි වසරවල් සුබ වූයේ නැත. සත්‍යය වූයේ එයයි. එය එම සුබපතුවන්ගේ ප්‍රාර්ථනාවල අවංකත්වය පිළිබඳ ගැටලුවක් නොවේ; පුළුල් සමාජ ආර්ථික, දේශපාලන සංදර්භයක් තුළ බැඳී පවතින්නකි.

අප 2018 වසර නිමාකොට 2019 නව වසරට පා තබන්නේ වසර 70ක් පුරා ලාංකේය සමාජය සෑම වසරක් පසා කරගසා ගෙන පැමිණි සමාජ, ආර්ථික හා දේශපාලන අර්බුද හා අභියෝග රැසක් සමඟය. අලුත් වත්කම් නූපදවන රටේ ආර්ථිකය අන්තයටම පිරිහී ඇත. රට ගොඩනංවීම පිළිබඳ කිසිදු දැක්මක් නොමැති පාලකයෝ රට මත තව තවත් ණය බර ගොඩගසන අතර ජනතාව බදු බරින් සහ ජීවන බරින් මිරිකා දමමින් සිටිති. ඇමති වරදාන, වරප්‍රසාද ලෝභයෙන් තව තවත් ජාතික ධනය කොල්ලකති. පරාජිත හිටපු පාලකයෝ තමන් බලයේ සිටියේදී මහජන ධනය කොල්ලකෑමට එරෙහිව නීතිය ක්‍රියාත්මක වීම වළකාගැනීමට සියලු උත්සාහ ගනිති. විෂම චක්‍රයක් ලෙස ක්‍රියාත්මක වෙමින් ඇත්තේ මෙයය.

වංචාව, දූෂණය, හොරකම ඉහළ සිට පහළ දක්වා පැතිරී ඇති ලංකාව ලෝකයේ දූෂිතම රටවල් අතර පළමු තැනට පත්ව ඇතැයි පසුගිය කාලයේ ජනමාධ්‍ය වාර්තා කර තිබුණි. ඉදින් තත්වය මෙසේනම් අප එකිනෙකට සුබපතා ගත්තද නව වසර කෙසේනම් සුබ වනු ඇත්ද? නව වසරේ අප සැම අලුතින් සිතා බැලිය යුතු කරුණ වන්නේ එයය.

පසුගිය වසර නිමාවූයේ මෙරට ප්‍රජාතන්ත්‍රවාදය අභියෝගයට ලක්කරමිනි. එබැවින් ව්‍යවස්ථානුකූල ඒකාධිපති ක්‍රමයක් වෙනුවට ප්‍රජාතන්ත්‍රවාදය සවිමත් වූ පාලන ක්‍රමයක් සකසා ගැනීමේ වගකීමද නව වසරේ අප ඉදිරිපිට පවතී.

කෙසේ වෙතත් අප අසුභවාදී විය යුතු නොවේ. නව වසර සුබ කර ගැනීමේ මඟක් අප ඉදිරියේ තිබේ. ඒ, අප ජනතාවක් ලෙස මෙතෙක් අනුගමනය කරන ලද අසාර්ථක සමාජ, ආර්ථික, දේශපාලන ගමන්මඟින් ඉවත්ව නව ගමනකට ප්‍රවේශ වීමෙනි. ඒ වෙනුවෙන් අලුත් අවුරුද්දේ නව දේශපාලන තීරණයක් ගැනීමට තරම් ලාංකේය සමාජය සමත් නම් නව වසරින් එළඹෙන ඉදිරි අනාගතයද නියත ලෙසම සුබ වනු ඇත. ඒ සඳහා ගතවූ වසරේ නොවැටහීම මත කරගසා ගෙන ආ සියලු දේ අවබෝධයෙන් අතහැර දමා නව අදහස්, සිතුවිලි හා ආකල්පවලින් සමාජය දෙස බලා තීරණ ගැනීමට අප එඩිතර විය යුතුව තිබේ.

නව වසර එළඹෙනුයේ අපට ඒ පිළිබඳව නව නිමිත්තක් සපයමිනි. එබැවින් අලුත් අවුරුද්දේ පුද්ගලික ජීවිතය මෙන්ම පොදු දේශපාලනය අරභයා අසාර්ථක බව පසක් කරගත් සියලු ආකල්ප පසෙකලා අලුතින් සිතා අලුත් තීරණ ගැනීමට සූදානම් ශ්‍රී ලාංකේය ඔබ සැමට ඒ සඳහා ධෛර්යය පතන අපි, එළඹෙන නව වසර එහි සැබෑ අර්ථයෙන්ම සුබ වනු ඇතැයි ප්‍රාර්ථනය කරමු.

නව වසර වෙනසකටය. ඒ වෙනස කළ යුත්තේද අපමය!

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

## අනතුරුදායකයි පරෙස්සමෙන් පරිහරණය කරන්න

පුපුරන ද්‍රව්‍ය හෝ වස විස අඩංගු නිෂ්පාදන වල ඉහත වැකිය මුද්‍රණයකර තිබීම අනිවාර්යයකි. ඒ එම නිෂ්පාදනය පරිහරණය කරන පාරිභෝගිකයාගේ ආරක්ෂාව සඳහාය. දැන් මෙම අවවාදය අධිපතිවාදී ජනමාධ්‍ය සඳහාද ගැලපෙන බව පෙනේ. ඒ ලොව පුරාම මෙන්ම ලංකාවේද ප්‍රධාන ජනමාධ්‍ය ආයතන (රූපවාහිනී නාලිකා, එෆ්එම් නාලිකා හා ප්‍රධාන පුවත්පත්) හැසිරෙන ආකාරය සමාජයට හානිකර නිසාය.

ප්‍රාග්ධනය මූලික වූ ප්‍රාග්ධන හිමි පංතිය විසින් පාලනය කරනු ලබන පංති සමාජයක ප්‍රධාන ජනමාධ්‍ය ප්‍රාග්ධන හිමි ධනපති පංතිය වෙනුවෙන් කටයුතු කරන්නේය යන්න හෝ ඔවුන් ලාභය සඳහා කටයුතු කරන්නේය යන්න විස්මය දනවන කරුණක් නොවේ. එය පැහැදිලි සත්‍යයකි. එසේ වුවත් සමාජයක් තුළ ජනමාධ්‍ය කටයුතු කිරීමේදී කිසියම් හෝ සදාචාරයක් රැකීම, සමාජයට හානිකර ලෙස අසත්‍ය හා මිත්‍යාවන් පැතිරවීමෙන් වැළකිය යුතුය. එක්තරා කාලයක සමහර රටවල ජනමාධ්‍ය තුළ එවැනි ආචාරධර්මයන් නොතිබුණාද නොවේ. එහෙත් දැන් සියල්ල කණපිට පෙරළී ඇත.

එක් අතකින් අධිරාජ්‍යවාදයත්, ධනවාදයත් බරපතළ අර්බුදයකට යාමත් ඒ මත සමාජයේ සියලු සාරධර්ම බිඳවැටී 'ශුද්ධ වූ සියල්ල කෙලෙසීමත්' විසින් නිර්මාණය කළ සමාජ අර්බුදයට ජනමාධ්‍යද ගොදුරුවී තිබේ. අනෙක් අතට අධිරාජ්‍යවාදය හා ධනේශ්වර පාලක කණ්ඩායම් විසින් ජනතාවගේ චින්තනය පාලනය කොට ඔවුන් 'චින්තන වහලුන්' බවට පත්කර තබා ගැනීමට ජනමාධ්‍ය යොදාගනිමින් සිටියි. ලෝකයේ මෙන්ම අපගේ රටවල ජනමාධ්‍ය හිමි ප්‍රාග්ධන හිමියෝද තම ලාභ වෙනුවෙන්, පැවැත්ම වෙනුවෙන්, කළු සල්ලි සෙවීමේ සමාජ විරෝධී කටයුතු ආවරණය කර ගැනීම වෙනුවෙන් පාලක කණ්ඩායම්වල අතකොළු බවටද පත්ව සිටිති. එහි ප්‍රතිඵලය වී ඇත්තේ, සමාජය තුළ අසත්‍ය හා මිත්‍යාව පැතිරවීමත් මිනිසුන් නිදහස් චින්තනය සහිත සිතන මතන මිනිසුන් වෙනුවට චින්තන වහලුන් බවට පත් කිරීමත්ය.

මෑත කාලයේ ලොව තොරතුරු තාක්ෂණය තුළ ඇතිවූ තාක්ෂණික විප්ලවයේ ප්‍රතිඵල හෙවත් විද්‍යාවේ දියුණුවද මේ ආයතන තම ප්‍රතිග ාමී කාර්යය සඳහා පහසුවක් කරගෙන තිබේ. පොදුවේ ගත්විට දැන් පවතින්නේ, මාධ්‍ය විසින් හසුරුවන දේශපාලන චින්තනයක් හා සමාජයකි. මෙය සමාජ සංවර්ධනයට බරපතළ බාධාවක්ව තිබේ.

සීඑන්එන්, බීබීසී වැනි ප්‍රබල ජනමාධ්‍ය අධිරාජ්‍යවාදය වෙනුවෙන් ලොව පුරා මත නිර්මාණය කළ ආකාරය අපි පසුගිය කාලයේ දුටුවෙමු. ඒ අනුව ඉරාකය ආක්‍රමණය කර ඉරාක වැසියන් (ළමුන් හා කාන්තාවන්ද ඇතුළු) දහස් ගණන් මරා දැමීම, ඉරාකය තුළ 'ප්‍රජාතන්ත්‍රවාදය' තහවුරු කිරීමේ මානවාදී ක්‍රියාවක් ලෙස අර්ථදැක්වීය. ඇමරිකා එක්සත් ජනපදය මානව හිමිකම් රැකදෙන්නා විය. එහෙත් ඒ අතරම ලොව කිසිදු රටක් ආක්‍රමණය නොකළ හැමදෙනාටම උදව්කරන කියුබාව 'ප්‍රජාතන්ත්‍රවාදය නැති' රටක් ලෙස හංවඩු ගසන ලදී. ඔවුන්ට අනුව ෆිදෙල් ඒකාධිපති නායකයෙක් විය. එක්සත් ජනපද ජනමාධ්‍ය තම රටවැසියන් නොමඟ යැව්වේ එසේය.

මෙම ඛේදවාචකය ලංකාව තුළද තිබේ. ලංකාවේද ජන ජීවිතයට විශේෂයෙන් රූපවාහිනිය කරන බලපෑම විශාලය. පුවත්පත්ද එසේමය. ලංකාවේද බොහෝ ජනමාධ්‍ය ආයතන හිමියෝ සාධාරණ නොවන හා සදාචාර විරෝධී මාර්ගවලින් මුදල් උපයන අයය. ඒ නිසා ඔවුහු ධනපති දේශපාලන පක්ෂ හා නායකයන් වෙනුවෙන් කටයුතු කරමින් සිටිති. ඉන් සිදුව ඇත්තේ, සත්‍ය තොරතුරු දැනගැනීමට ජනතාවට ඇති අයිතිය හා මාර්ග අහෝසි වීමය; එපමණක් නොව අසත්‍ය තොරතුරුවලින් ජන මනසත්, ජන මතයත් විකෘති කිරීමය. ලංකාවේ පසුගිය දිනවල ඇතිවූ ආණ්ඩු පෙරළි කුමන්ත්‍රණයේදී රටේ ප්‍රධාන ජනමාධ්‍ය හැසිරුණු ආකාරය දෙස බලන විට මෙය හොඳින් පෙනේ. ඉතාම පැහැදිලි දේශපාලන කුමන්ත්‍රණයක් ජයග්‍රහණය කරවීම සඳහාත් එය සාධාරණය කිරීම සඳහාත් ලංකාවේ ජනමාධ්‍ය හැසිරුණු ආකාරය සැබැවින්ම පිළිකුල් සහගතය. මේ ඔවුන් 'සෙල්ලම් කරන්නේ' රටක ජනතාවගේ චින්තනය සමගය. සත්‍ය දැන ගැනීමට ඇති අයිතිය සමගය. ප්‍රශ්නය බරපතළ වන්නේ ඒ නිසාය.

ජනතාවට දේශපාලනයේදී බොරු කියන, වෙළඳ දැන්වීම් මගින් සමාජයේ ආචාරධර්ම හා සදාචාරයත් විනාශකරන, තොරතුරු පළකිරීමේදී මිනිසුන්ගේ පෞද්ගලික අනන්‍යතාවයන් හා ගරුත්වයන් පවා නොසලකා කටයුතු කරන, මෙම වැරදි හා සමාජ විරෝධී ජනමාධ්‍ය භාවිතාවට එරෙහි හඬක් සමාජය තුළින්ම පැමිණිය යුතුව තිබේ. දැනටමත් විවිධ තරුණ කණ්ඩායම් සිවිල් සමාජ සංවිධාන මෙම විරෝධය හා විවේචනය පළකරන්නට පටන්ගෙන තිබේ. එය හොඳ ආරම්භයකි. එයට පොදු ජනතාවද එක්විය යුතුව තිබේ. මන්ද ජනමාධ්‍යවල පාරිභෝගිකයා යනු ජනතාවය. ජනතාව බොරු ඇහීම හා බොරු කියවීම ප්‍රතික්ෂේප කරන්නේ නම් මෙම අධිපතිවාදී ජනමාධ්‍ය හිමියන්ට තම හැසිරීම වෙනස් කිරීමට සිදුවේ. එබැවින් මෙම වැරදි මාධ්‍ය භාවිතාවට එරෙහිව ජනතාවගේ පැත්තෙන් නැගෙන විරෝධය හා අප්‍රසාදය පුළුල් විය යුතුය.

අනෙක් අතට ඒ සමගම විකල්ප තොරතුරු සන්නිවේදන ක්‍රම යොදාග ැනීම හා එය වගකීමෙන් යොදාගැනීමද මෙයට දියහැකි තවත් ප්‍රබල පිළිතුරකි. දැනටමත් ෆේස්බුක් වැනි සමාජජාල මගින් මෙය ආරම්භ වී තිබේ. එය සංයමයක් සහිතව නිවැරදිව යොදා ගන්නේ නම් අධිපති මාධ්‍යවල මෙම ඒකාධිකාරය බිඳවැටෙනු ඇත.

එබැවින් ජනතාවට සත්‍ය තොරතුරු පවසන මාධ්‍ය භාවිතයක් වෙනුවෙන්, සමාජ සාරධර්ම හා සදාචාරය උල්ලංඝනය නොකරන මාධ්‍ය භාවිතාවක් වෙනුවෙන්, ප්‍රතිගාමිත්වයට සේවය නොකරන ප්‍රගතිගාමී මාධ්‍ය භාවිතාවක් වෙනුවෙන් සටන්කිරීමට දැන් කාලය පැමිණ තිබෙන බව අප හැමදෙනාම අවබෝධ කර ගත යුතුය.

# ගොඩනගන පෙරමුණෙන් රටට නව දේශපාලන සංස්කෘතියක්



ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රචාරක ලේකම්
**විජිත හේරත් සහෝදරයා**

***නියමුවාඃ- 2019 හා 2020 වර්ෂයන් මැතිවරණ වර්ෂයන් බවට තීන්දු වී අවසන්. මේ අතර ජනතා විමුක්ති පෙරමුණේද බුද්ධිමතුන්ගේද දායකත්වය ඇතිව නිර්මාණය වන පුළුල් දේශපාලන පෙරමුණක් පිළිබඳ මහත් කුතුහලයක් සමාජය තුළ වර්ධනය වෙමින් තිබෙනවා. ගොඩනැගෙන නව දේශපාලන බලවේගය පිළිබඳව යමක් කිවුවොත්.***

***විජිත හේරත් සහෝදරයාඃ-*** 2019 ජනාධිපතිවරණය අනිවාර්යයෙන් පැවැත්විය යුතු වෙනවා. ඒ වගේම තවත් පළාත් සභා තුනක නිල කාලය අවසන් වෙනවා. ඒ අනුව ගත්තොත් පළාත් සභා සහ ජනාධිපතිවරණ දෙකම 2019ට නියමිතව තිබෙනවා. 2020 අවුරුද්දේ පාර්ලිමේන්තු මැතිවරණයක් තිබිය යුතුයි. ඊට පෙරාතුව 2/3න් යෝජනාවක් අනුමත කරලා තිබ්බොත් හැර 2020ත් මැතිවරණ වසරක්.

මේ 2019 සහ 2020 ඉදිරියට එන මැතිවරණවලට මුහුණ දීම සඳහා මේ රටේ විද්වතුන්, සිවිල් සංවිධාන වෘත්තිකයන් මෙන්ම උගත් බුද්ධිමත් කලාකරුවන් සියලු ප්‍රගතිශීලි බලවේග අද එක පෙරමුණකට එකතු වෙමින් තියෙනවා. පහුගිය කාලේ තුළ රට තුළ ඇති වුණු බරපතළ ආර්ථික සමාජීය කඩා වැටීම හමුවේ මේ විද්වතුන් අද පෙරමුණට ඇවිත් තියෙනවා. ඒ නිසා මේ රට හදන, මේ රට රකින සැබෑ ජනතාවාදී පාලනයක් අද ජනතාව ඉල්ලා සිටිනවා. අන්න ඒ ජනතාවාදී පාලනය ගොඩනැගීම සඳහා විවිධ සංවිධාන සහ පුද්ගලයන් නව දේශපාලන පෙරමුණක් විදිහට එකතුවීමට සූදානමින් සිටිනවා. මේ උගත් බුද්ධිමත් පිරිසත් එක්ව ගොඩනගන පුළුල් සන්ධානය මේ වසර තුළ දී අනිවාර්යයෙන් ගොඩනැගෙනවා. මේ පුළුල් බලවේගය, මේ පුළුල් දේශපාලන පෙරමුණෙන් තමයි ඉදිරි මැතිවරණවලට අප ඉදිරිපත් වෙන්නේ. ඒ ගොඩනැගෙන පෙරමුණ තමයි මේ රට රකින්නේ, මේ රට හදන්නේ, අලුත් දේශපාලන සංස්කෘතියක් රටට ඉදිරිපත් කරන්නේ.

දැනටමත් ඒ සියලු කටයුතු අවසන් වෙමින් තිබෙනවා. ජාතික විද්වත් සංවිධානය මගින් රට හදන වැඩපිළිවෙළක් ලබන පෙබරවාරි මාසයේ ඉදිරිපත් කිරීමට සූදානමින් ඉන්නවා. කෘෂිකර්මය, අධ්‍යාපනය, සෞඛ්‍ය ක්‍රීඩා සංස්කෘතිය ඒ වගේම ජාතික සමගිය විවිධ ක්ෂේත්‍ර 10ක් ඔස්සේ කොහොමද මේ රට ගොඩනගන්නේ කියන එක ජාතික විද්වත් සංවිධානයෙන් ප්‍රතිපත්ති සහිත වැඩපිළිවෙළක් ඉදිරිපත් කරනවා.

> පහුගිය කාලේ තුළ රට තුළ ඇති වුණු බරපතළ ආර්ථික සමාජීය කඩා වැටීම හමුවේ මේ විද්වතුන් අද පෙරමුණට ඇවිත් තියෙනවා. ඒ නිසා මේ රට හදන, මේ රට රකින සැබෑ ජනතාවාදී පාලනයක් අද ජනතාව ඉල්ලා සිටිනවා. අන්න ඒ ජනතාවාදී පාලනය ගොඩනැගීම සඳහා විවිධ සංවිධාන සහ පුද්ගලයන් නව දේශපාලන පෙරමුණක් විදිහට එකතුවීමට සූදානමින් සිටිනවා. මේ උගත් බුද්ධිමත් පිරිසත් එක්ව ගොඩනගන පුළුල් සන්ධානය මේ වසර තුළදී අනිවාර්යයෙන් ගොඩනැගෙනවා. මේ පුළුල් බලවේගය, මේ පුළුල් දේශපාලන පෙරමුණෙන් තමයි ඉදිරි මැතිවරණවලට අප ඉදිරිපත් වෙන්නේ. ඒ ගොඩනැගෙන පෙරමුණ තමයි මේ රට රකින්නේ, මේ රට හදන්නේ, අලුත් දේශපාලන සංස්කෘතියක් රටට ඉදිරිපත් කරන්නේ.

ඒ වැඩපිළිවෙළ මත විද්වත් සංවිධානයත් ජනතා විමුක්ති පෙරමුණත් එක් වූ පුළුල් පෙරමුණක් ගොඩනැගීමට අප දැනටමත් සාකච්ඡා කරමින් ඉන්නවා. ඒක තමයි හෙට දවසේ රට ගොඩනගන බලවේගය බවට පත් වෙන්නේ.

***නියමුවාඃ- මෑත කාලීන දේශපාලනයේ බිහිසුණුම කුමන්ත්‍රණයක් පරාජය කරනු ලැබුවා. එහෙත් කුමන්ත්‍රණකරුවන් තවමත් නිදැල්ලේ. මේ පශ්චාත් කුමන්ත්‍රණ වකවානුව ජ.වි.පෙ. තේරුම් ගන්නේ කොහොමද?***

***විජිත හේරත් සහෝදරයාඃ-*** ඒක ඇත්ත. ලංකාවේ ඉතිහාසයේ සිද්ධ වෙච්ච බිහිසුණුම දේශපාලන කුමන්ත්‍රණය තමයි ඔක්තෝබර් 26වැනිදා ඇති වුණේ. ඒ කුමන්ත්‍රණය පරාජයට පත්කරන්න ජනතා විමුක්ති පෙරමුණ ප්‍රබලව කටයුතු කළා. ඍජුව මැදිහත් වුණා. අපි ආරම්භයේදීම කිවුවා, මේ කුමන්ත්‍රණය අනිවාර්යයෙන්ම පරාද කරනවා කියලා. ඒ කිවුවා වගේම අපි අපේ කර්තව්‍යය ඉෂ්ඨ කරනු ලැබුවා. එය දැන් අවසානයයි.

කුමන්ත්‍රණය පරාද කළාට පස්සේ එතනින් එහාට තියෙන්නේ ඒ කුමන්ත්‍රණයට සහභාගි වූවන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක වීම. අපි දැනටමත් පාර්ලිමේන්තු පනතක් මගින් විශේෂ කොමිසමක් පත් කරන ලෙස යෝජනා කර තිබෙනවා. මොකද මේ කුමන්ත්‍රණය නිසා රටේ ආර්ථිකය කඩා වැටුණා. ඒ වගේම සමාජය ආපස්සට ගියා. මේකට වගකිය යුත්තන්ට අදාළව නීතිය ක්‍රියාත්මක විය යුතුයි. ඒකට අපි එවැනි යෝජනාවක් ඉදිරිපත් කරලා තියෙනවා. මේ කුමන්ත්‍රණය පරාද කළාට ඒ දේශපාලන බල වුවමනාව පරාජය වෙලා නැහැ. මෛත්‍රිපාල මහත්තයට ඊළඟ ජනාධිපති අපේක්ෂකයා විදිහට නැවත ඡන්දෙට ඉදිරිපත්වීමේ වුවමනාව එහෙමම තියෙනවා. රාජපක්ෂ කණ්ඩායමට තමන්ගේ හොරකම් වංචා වසා ගැනීමේ ඒ වුවමනාව එලෙසම තියෙනවා. ඔවුන් බල පිපාසාවෙන් පෙළෙනවා. අද විපක්ෂ නායකකමට පොර කන්නෙත් ඒ නිසා. එ වගේම තමයි රනිල්ගේ යූ.එන්.පී. ආණ්ඩුව මේ කුමන්තණය පරාජයට පත් කළ ගමන් තමන්ගේ ඇමති මණ්ඩලය වැඩි කර ගන්න 19වැනි සංශෝධනය ඇතුලෙන් රිංගන්න හදනවා. දැන් හදනවා, තමන්ගේ බලය වැඩි කර ගන්න තව තව ඇමතිවරු හදා ගන්න.

ජනතාව බලාපොරොත්තු වුණේ මේක නෙමෙයි. තුන් පැත්තෙන්ම ගත්තොත් මෛත්‍රිපාල-මහින්ද-රනිල්

15 වැනි පිටුවට



# Yes We Can

## දෙවනි ඉනිම හා අඹ යාලුවෝ

අපි බලන්නේ දෙවනි ඉනිමය. අපේ රටේ පාලකයන් සෙල්ලම් කරන්නේද දෙවනි ඉනිමය. එයත් අවසාන භාගයය. දෙවනි ඉනිම අවසාන භාගය සෙල්ලම් කරන අපේ රටේ පසුගාමී ධනවාදයට අවශ්‍ය වන්නේ, දෙවැනි ඉනිමට චියර් කරන තරුණ පරම්පරාවකි. පසුගියදා මාතරදී තරුණයෙකු පිහියකින් ඇන ඝාතනය කිරීමෙන් පසු මුහුණු පොතේ වැඩිහිටියෙක් ලියා තිබුණු වැකියක මෙසේ සඳහන් විය. "දෙවනි ඉනිම බලපු උන් ගුටි ඇනගත්තාට අඹ යාලුවෝ බලපු අපි නම් එහෙම නැහැ" කියාය. මුහුණු පොතේ ලීවාට දෙවනි ඉනිම බලපු උන් මරාගන්නා තුරු කාර් ඇතුළට වී, බයික් උඩට වී බලා සිටියේ අඹ යාලුවො බලපු උන්ය. පාලකයාට දෙවනි ඉනිමක් සෙල්ලම් කිරීමට පාර කපා දුන්නේද මේ අඹ යාලුවන් බලපු උන්මය. ඒ නිසා මේ ඛේදවාචකය දෙවනි ඉනිම බලපු උන්ට හෝ අඹ යාලුවෝ බලපු උන්ට හෝ පවරා ගැළවීමට නොහැක.

2018 වසර නිමවූයේ වෙනදා මෙන්මය. මහ දවාලේ 17 හැවිරිදි තරුණයෙකු විසින් 19 හැවිරිදි තරුණයෙකුට පිහියකින් ඇන මරා දැමුවේ මාතරදීය. බේරුවලදී 17 හැවිරිදි පාසල් තරුණයෙකු මිය යන්නේ එම පාසලේම 15 හැවිරිදි තරුණයෙකුගේ පහරදීම නිසාය. එමෙන්ම මොණරාගලදී 23 හැවිරිදි පෙම්වතා විසින් තම 22 හැවිරිදි පෙම්වතියගේ ගෙල සිරකර මරාදමන්නේ සාහසික ලෙසය. මෙම සිදුවීම පිරිසක් විසින් සාවදානව රූගත කරන්නේද සාහසික ලෙසය. එමෙන්ම ලංකාවේදී අත්අඩංගුවට ගත් දෙවනියට ලොකුම කුඩු තොගය හමුවන්නේද 2018 වසර නිමාවීමට පෙරය. රටේ ප්‍රජාතන්ත්‍රවාදයට මරු පහරක් එල්ල කළ දින පනහේ නිර්ලජ්ජිත කුමන්ත්‍රණය සිදු වූයේද වසර අවසන් වීමට ආසන්නයේය.

2018 වසර තුළ සිදු වූ මිනී මැරුම්, අපරාධ හා දූෂණ වංචා 2017ට වඩා අඩුවක්නම් දක්නට නොලැබුණි. අපරාධ හා මිනී මැරුම් දිනෙන් දින ඉහළ ගියේය. දිවිනසා ගැනීමේ අගයද ඉහළ අගයක් ගැණුනි. තරුණ වයසේ සිටින සිය දෙනෙකුගෙන්, නව දෙනෙක් (9%) සියදිවි නසාගැනීමට උත්සහ දරා ඇත. 2016දී ජනගහනයෙන් 0.1% ක් වූ මත්කුඩු (හෙරොයින්) භාවිතය පිළිබඳ අගය මේ වසර අවසන් වන විට 0.5%ත් ඉක්මවා ගොස්ය. හෙරොයින් නිසා අත්අඩංගුවට ගත් ප්‍රමාණය සැප්තැම්බර් මාසයේදී 29.32% ක් වූ අතර ඔක්තෝබර් මාසයේදී 37.74%ක් දක්වා 8.42%කින් වැඩි වී ඇත. එච්අයිවී ආසාදනය නිසා අප රටේ වසරකට මියයන ප්‍රමාණය 2016දී 47 ක්වූ අතර මේ වන විට 50 ඉක්මවා ගොස්ය.

දිනෙන් දින ඉහළ අගයක් ගන්නා අපේ රටේ තරුණ ජීවිත මෙන්ම අපේ රටද ගිලගන්නා අපරාධ හා ඛේදවාචකයන් දෙස සිදුවීම් ලෙස බලා හෝ එය එක් පරම්පරාවකින් තවත් පරම්පරාවකට වරද පටවා හෝ අහක බලාගැනීමට නොහැක. අඹ යාලුවෝ බලපු පරම්පරාවද, දෙවනි ඉනිම බලන පරම්පරාවද මේ ඛේදවාචකයේ ගොදුරු බවට පත් වී හමාරය. ඒ නිසාම මේ සමාජ ඛේදවාචකයෙන් රට ගොඩගැනීමටනම් දෙවනි ඉනිමට පාර කපාදුන් අඹ යාලුවන්ටද, දෙවනි ඉනිමට චියර් කරන තරුණ තරුණියන්ටද සුවිශාල වගකීමක් ඇත. දෙවනි ඉනිමේ අවසන් පන්දු වාර කිහිපය සෙල්ලම් කරන අපේ රටේ පසුගාමී ධනපති ක්‍රමය පරාජය කළ යුතුය. ඒ වෙනුවෙන් මේ වසරේදී කළ යුතු දේ බොහෝය. ඒ වෙනුවෙන් ශක්තිමත්ව අධිෂ්ඨානශීලීව පෙළගැසෙමු..!!




# කුමන්ත්‍රණයට එරෙහිව තරුණයෝ එක්වෙති...

පසුගිය ඔක්තෝබර් 26 දින ලාංකේය ඉතිහාසය තුළ අපකීර්තිමත් දිනයක් විය. ඒ, ජනාධිපතිවරයෙකු විසින් නීතිය බල්ලට දමමින් ව්‍යවස්ථා විරෝධි කුමන්ත්‍රණයක් කළ බැවිනි. වත්මන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් කුමන්ත්‍රණයක් මගින් ඒ වන විට සිටි අගමැතිවරයා ඉවත්කර මහින්ද රාජපක්ෂ මහතාට ලබා දුන්නේය. එයින් නොනැවතුණු ඔහු අලුත් කැබිනට් මණ්ඩලයක් හා ඇමති මණ්ඩලයක් පත්කර එවකට තිබූ යහපාලන ආණ්ඩුව පෙරළා දැමුවේය. ඒ 2015 දී ඔහුව ජනාධිපති කළ හැටදෙලක්ෂයක ජනවරමට පිටුපාමිනි. නමුත් තමන්ට බහුතරය ඇතැයි පැවසූ ජනාධිපතිවරයා සිතූ පරිදි එය එසේ නොවීය. ලක්ෂ 50-60කට මුදලට මන්ත්‍රීවරු ඩැහැ ගැනීමේ ව්‍යාපෘති ඒකාබද්ධ විපක්ෂය, මෛත්‍රී ප්‍රමුඛ කණ්ඩායම් හා එ.ජා.ප.ය විසින් මේ අතර ඇරඹීය. ඊනියා ආණ්ඩුව බහුතරය හදාගැනීම සඳහා විවිධ උපක්‍රම යෙදුවුවත් අවසානයේ බහුතරය නොමැති බව හැඟුණ හෙයින් ඊළඟ තුරුම්පුව ජනාධිපතිවරයා විසින් දියත් කරන ලදී. ඒ පාර්ලිමේන්තුව විසුරුවා හරිමිනි. ඊනියා ආණ්ඩුවට බහුතරය හදාගැනීමට ප්‍රබල බාධාවක් වූයේ ජ.වි.පෙ. විසින් ගත් තීරණ නිසාය. මේ සිදුවූයේ ආණ්ඩු විරෝධි කුමන්ත්‍රණයක් බවත් රටේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ඊට එරෙහිව සියලු බලවේග සමග එක් වී එය පරාජය කරන බවත් ජ.වි.පෙ. විසින් අවධාරණය කළේය.




එය සත්‍ය වූයේ නොවැම්බර් 13 අධිකරණය විසින් ආණ්ඩුව විසුරුවා හැරීමට ජනාධිපති විසින් ගත් තීන්දුව තාවකාලිකව අත්හිටුවීමත් සමගය. ඉන් පසුව පාර්ලිමේන්තුව රැස්වූ අවස්ථාවන්වලදී ඊනියා ආණ්ඩුවට බහුතරය නැති බව ඔප්පු විය. පාර්ලිමේන්තු සම්ප්‍රදායන් කඩකරමින් හා විනය විරෝධි ලෙස හැසිරුණු ඔවුන් පාර්ලිමේන්තු පැමිණීම මගහැරියහ. පසුව සත් විනිසුරු මඩුල්ලක් මගින් විභාග වූ නඩුවේ තීන්දුව වූයේ ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීම ව්‍යවස්ථා විරෝධි බවයි. සියලු කුමන්ත්‍රණකරුවන්ට අන්ත පරාජයට පත්වීම ඇරඹුණේ ඉන් පසුය.

මෙම සිදුවීමේදී අපේ රටේ මාධ්‍ය හැසිරීම සම්බන්ධව කාගේත් කථාබහට ලක් විය. මාධ්‍ය ඔවුන්ගේ දේශපාලන න්‍යාය පත්‍රයන් දියත් කළෝය. රාජ්‍ය මාධ්‍ය හා බොහෝ පුද්ගලික මාධ්‍ය හිරිකිතයකින් තොරව මෙම කුමන්ත්‍රණයට හවුල් වූ බව සක්සුදක් සේ පැහැදිලි විය. සමහර මාධ්‍ය කුමන්ත්‍රණකරුවන්ගේ පැත්ත නොගත්තත් ඔවුන්ද ක්‍රියා කළේ ඊට විරුද්ධ දේශපාලන පක්ෂවල න්‍යාය පත්‍රයන්ය. මෙහිදී රටේ ජනතාවගේ පැත්ත සිටිමින් ජනතාවට සත්‍ය පැවසීමට කිසිදු මාධ්‍යයක් සමත් වූ බවක් පෙනෙන්ට නොතිබුණි. එය ඛේදවාචකයක් වගේම රට ඉදිරියේ ඇති ඉතා භයානක අනතුරකි. එය එසේ වන්නේ ජනමාධ්‍ය යනු රටේ ජනතාවගේ මනසට විශාල බලපෑමක් සිදු කිරීමට හැකි බව නිසාය. ඒ බව පසුගිය රාජපක්ෂ සමයේ ලැබූ අත්දැකීම් ඕනෑවටත් වඩා තහවුරු කරයි. මෙහිදී සත්‍ය හෙළිකිරීමට සමාජමාධ්‍ය ක්‍රියාධරයන් ගත් උත්සාහය ජනසමාජයට යම් සාධාරණයක් ඉටු වූබ පැවසිය යුතුමය. එසේ නොවන්නට මුළු රටම කුමන්ත්‍රණකරුවන්ගේ ගොදුරක් බවට පත්වන බව නිසැකය.

මාධ්‍යය මගින් මෙම කුමන්ත්‍රණය සාධාරණීය කිරීමට එරෙහිව රටේ බුද්ධිමත් ජනතාව තුළින් විරෝධයක් මතුවිය. විශේෂයෙන් රටේ තරුණ තරුණියන් ෂෝෂල් මීඩියා භාවිතා කරමින් මාධ්‍යයට හා කුමන්ත්‍රණ කරුවන්ට එරෙහිව පෙළගැසුනහ. රටේ තැන් තැන්වල මාධ්‍ය සාකච්ඡා හා විරෝධතා ක්‍රම ක්‍රමයෙන් මතුවන්ට විය. ඒ හරහා රටේ යහපත් දේශපාලන සංස්කෘතිකයක් ගොඩනැගීම හා ප්‍රජාතන්ත්‍රවාදයට රැකගැනීම වෙනුවෙන් නව සංවිධාන බිහිවිය. තැන් තැන්වල කුඩා කණ්ඩායම් ලෙස සිටි තරුණ තරුණයින් හා විවිධ ක්ෂේත්‍රවල පිරිසක් එක් වූහ. දෙසම්බර් 02 දින අලුත් පියාපත් සංවිධානය විසින් නිදහස් චතුරශ්‍රයේදී පැවැති විරෝධතාවය කාගේත් කතාබහට ලක්විය. සම්ප්‍රදායෙන් ඔබ්බට ගොස් නව පන්නයේ විරෝධතාවයන් එහි දක්නට ලැබීම විශේෂත්වයකි. ඉන් නොනැවතුණු එම ප්‍රගතිශීලි කණ්ඩායම් මෙම කුමන්ත්‍රණයටත් මාධ්‍ය විසින් මෙම කුමන්ත්‍රණයට සහයෝගය දැක්වීමටත් විරුද්ධව විශාල විරෝධතාවයක් දෙසැම්බර් 12 වැනි දින ලිප්ටන් වටරවුමේ දී පැවැත් විය. ඒ සඳහා විශාල සංවිධාන ප්‍රමාණයක් එකතු වීම පැසසුමට කරුණකි. අධිකරණය මගින් ලබාදුන් තීන්දුවත් රටේ තරුණයන්, කලාකරුවන්, මාධ්‍යවේදීන්, ප්‍රගතිශීලි පිරිස් විසින් ගෙන ගිය අරගලයක් නිසා කුමන්ත්‍රණකරුවන් පරාජයට පත් කිරීමට හැකිවිය. මෙහිදී බුද්ධිමතුන්ගේ හා තරුණ පිරිසගේ මැදිහත්වීම අපේ රට යහපත් සමාජයක් බවට පරිවර්තනය කිරීමේ බලාපොරොත්තුව තව තවත් විශ්වාසක කළ හැකි බව පැවසියම යුතුය.

## නත්තල්

අහුමුළු අතගගා
පරිභෝජනවාදයේ
ණය එක්ක ගිලෙන
නුඹලා..
වහලුන්ගේ යදම් බිඳ
වර්ණවත් කළ මිනිසත්කම්
අනේ යේසුස්...
තවත් වහලුන්
යදම් නොමැතිමුත්
දිව්‍යලොව දකිමින්
අපායක පැහෙන
වහලුන්
ස්වර්ගය පෙනි පෙනී
වහල් ජීවිත ගෙවන
අපූරුව කල් මර මර
කියා දෙනු මැන
නත්තලේ අරුතෙන්
ස්වර්ගය දකින හැටි






### සානාවේ ඇරුම පුදුම මිනී පෙට්ටි



අප්‍රිකානු මහද්වීපයට අයත් ඝානා රාජ්‍යයේ යමෙකු මියගිය විට ඔහුගේ ජීවිතය පිළිබිඹු වන ආකාරයට මිනී පෙට්ටිය සැකසීම ඔහුට කරන ගෞරවයක් ලෙස සලකේ. මෙම රාජ්‍යයේ එකිනෙකාට ආවේණික වූ මිනී පෙට්ටි නිර්මාණය කරන ස්ථාන ඇති අතර ඒවා "සේත් කානේ ක්වෙයි" ලෙස හඳුන්වයි.
ඒ අනුව මිරිස් කරලක හැඩය ගත් මිනී පෙට්ටි ගොවීන් සඳහාම වන අතර කුඩා දරුවන් වෙනුවෙන් ගුවන් යානයක හැඩය ගත් මිනී පෙට්ටි වඩාත් ප්‍රචලිතය. එරට වැසියන්ගේ ආදායම දිනකට ඩොලර් 03 ක් පමණ වන අතර එම උපයන මුළු මුදලම එකතු කර ඩොලර් 1000ක් වටිනා මිනී පෙට්ටියක් සැකසීම අරුම පුදුම කාරණයකි.

### ග්‍රීන්ලන්තයේ අයිස් දියවීම පස් ගුණයකින් වේගවත් වෙලා



ග්‍රීන්ලන්තයේ අයිස් දියවීම පසුගිය දශක දෙකේ බලාපොරොත්තු වූ මට්ටමට වඩා පස්ගුණයකින් වැඩි වී ඇති බව අනාවරණය වී ඇත. මේ සඳහා ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම මූලිකම හේතුව වී ඇත.
මෙතෙක් කලක් චන්ද්‍රිකා ඡායාරූප මගින් හඳුනාගත් අතර මෙවර අයිස් තට්ටුවේ හරය වෙත විදීමක් සිදු කරමින් එහි ඝනකම නිරීක්ෂණය කරමින් දියවීමට ගතවන කාලය නිරීක්ෂණය කිරීමට එක්සත් ජනපද හා නෙදර්ලන්ත පර්යේෂකයෝ සමත් වී සිටිති.

### සිංගප්පූරුවේ හොඳ නින්දක් ලබන්නේ හරි අඩක්



සිංගප්පූරුවේ වෙසෙන වැඩිහිටියන් අතරින් හොඳ නින්දක් හිමිවන්නේ හරි අඩකට පමණක් බව සමීක්ෂණයකින් හෙළි වී ඇත. අධිවේගයෙන් දියුණු වන සිංගප්පූරුව වැනි රටක ජනතාවගෙන් අඩක්ම ප්‍රමාණයක් විවේකයක් නොලබන අතර අඩු ආදායම් ලබන වැසියන් බොහෝ දෙනෙක් ලබන්නේ පැය 04කට අඩු නින්දකි. මේ අතරම සමීක්ෂණයට අනුව මෙම ජනතාවගෙන් හතරෙන් පංගුවක් අද වන විට සතියකට එක් රාත්‍රියක් හෝ නිදිවරමින් සිටින බවත් අනාවරණය වී තිබේ.

### මාර්ග තදබදයට පරිසර හිතකාමී විදුලි ස්කූටරයක්



බ්‍රිතාන්‍යයේ ජනාකීර්ණ වීදිවල විදුලියෙන් ක්‍රියාකරන පරිසර හිතකාමී ස්කූටර් සේවයක් ආරම්භ කිරීමට නියමිතය. එමගින් දිනපතා දැඩිව මුහුණ දෙන වාහන තදබදය හා පරිසර දූෂණය අවම කරගත හැකිබව එරට බලධාරීන් පවසා තිබේ. බැටරිවලින් ක්‍රියාකරන මෙම ස්කූටරය හැසිරවීම ඉතා පහසු වන අතර එය භාවිත කළ හැකි වන්නේ උදෑසන 7.00 සිට රාත්‍රී 9.00 දක්වා සීමා වූ කාලයකටය.

# ප්‍රජාතන්ත්‍රවාදය ඡන්ද පොරොන්දුවක සිර නොවීමට නම්




පසුගිය ඔක්තෝබර් 26දා මෛත්‍රී - මහින්ද එක්ව ආණ්ඩු බලය කොල්ලකෑම සඳහා කළ දේශපාලන කුමන්ත්‍රණය සමග රට තුළ ඊට එරෙහිව සටන් පෙරමුණු දෙකක් ක්‍රියාත්මක විය. එකක් වූයේ එ.ජා.ප.ය හා ඊට හිතවත් අයගේ පෙරමුණය. අනික ජනතා විමුක්ති පෙරමුණ මූලික කරගත් විවිධ දේශපාලන හා සිවිල් සංවිධාන හා පුද්ගලයන්ගෙන් සංයුක්ත වූ ප්‍රජාතනත්‍රවාදය රැක ගැනීමේ සටනය. කුමන්ත්‍රණයෙන් පසු ගෙවුණු දින 50ක පමණ කාලය තුළ පාර්ලිමේන්තුවේ විශ්වාසභංග යෝජනා දෙකකින් පිට පිටම ලැබූ පරාජය හමුවේත්, අධිකරණයෙන් ලද තීරණ දෙකක පරාජය හමුවේත් මහින්ද රාජපක්ෂට සිය නීති විරෝධී අගමැතිකම අත්හරින්නට සිදුවිය. එහි ප්‍රතිඵලය ලෙස රනිල් අගමැති ධුරයේ දිවුරුම් දෙන ලදී. එම දිවුරුම්දීමත් සමග එ.ජා.ප.යේ සටන නිමා විය. මන්ද ඔවුන්ගේ සටනේ අරමුණ රනිල්ට යළි අගමැතිකම ලබා ගැනීම යන පටු සීමාවේ තිබූ නිසාය.

එහෙත් ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයන්ගේ සටන රනිල් අගමැතිවීම නිසා නතරවන්නේ නැත. ඒ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමේ අරගලය තවදුරටත් ඉතිරිව පවතින නිසාය. එය රනිල් අගමැති වීමෙන් විසඳී නැති නිසාය.

ලංකාවේ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයට බරපතළම හානිකරන සාධකය වනුයේ මෙරට පවතින විධායක ජනාධිපති ක්‍රමයයි. එය අහෝසි කිරීම ප්‍රජාතන්ත්‍රවාදය පැත්තෙන් අත්‍යාවශ්‍ය කරුණකි. කුමන්ත්‍රණය පරාජය වීමත් සමග කුමන්ත්‍රණය පිළිබඳ පරීක්ෂණ පවත්වා කුමන්ත්‍රණකරුවන් සියලු දෙනාට නීතියෙන් දඬුවම් දීමේ යෝජනාවක් ජ.වි.පෙ. රට හමුවේ තැබුවේ එම කුමන්ත්‍රණය ලංකාවේ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයට පවා මාරන්තික ප්‍රහාරයක් එල්ල කළ නිසාය. එසේම රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කර ගැනීමේදී විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම අත්‍යාවශ්‍ය කරුණක් නිසා ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ජ.වි.පෙ. විසින් ආරම්භ කරනු ලැබූ සටන, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ සටන බවට දැන් පරිවර්තනය කරනු ලැබ තිබේ. ඔක්තෝබර් 26 දේශපාලන කුමන්ත්‍රණයේදී ඊට එරෙහිව ජ.වි.පෙ. සමග අත්වැල් බැඳගත් සියලු සංවිධාන හා පොදු ජනතාවද එම සටන්පාඨය ඉටුකර ගැනීම වෙනුවෙන් අඛණ්ඩව පෙනී සිටී. එය සුභවාදී දෙයකි.

සමාජවාදී විප්ලවයේ හා වමේ ව්‍යාපාරයක් ගොඩ නැගීමේ පැත්තෙන් බැලූවිට පවා ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය ඊට අත්‍යාවශ්‍ය සාධකයක් බව ප්‍රතික්ෂේප කළ නොහැක. ධනපති පංතිය විසින්ම ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය අහෝසි කරන්නේ නම් එවැනි තත්වයකදී වුවද තම දේශපාලනය කරගෙන යාමට වම සූදානම් විය යුතුය. එහෙත් ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය බිඳක් හෝ පවතින්නේ නම් එය ආරක්ෂා කර ගැනීමත් එය පුළුල් කර ගැනීමත් ඒ වෙනුවෙන් සටන් කිරීමත් වමේ ව්‍යාපාරයක වගකීමකි. මන්ද ලෙනින් කී ලෙසම පංතිය සංවිධානය කිරීමේ කාර්යයේදී එය ඉතා වැදගත් වන නිසාය. ජ.වි.පෙ. ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් සටන් වදින්නේ එම පුළුල් අරමුණෙනි. එසේ නොමැතිව ධනේශ්වර හෝ සුළු ධනේශ්වර පටු අර්ථයකින් නොවේ.

විධායක ජනාධිපති ක්‍රමය මුළුමනින් අහෝසි කිරීම නොව එහි අසීමිත බලතල සුළු ප්‍රමාණයකින් අඩුකිරීමේ ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණයන් පවා කෙතරම් ප්‍රබල හා වැදගත් දැයි අපට පෙන්වන ප්‍රබලම සාක්ෂිය වූයේ පසුගිය දේශපාලන කුමන්ත්‍රණයයි. 19වැනි සංශෝධනය ක්‍රියාත්මකව නොතිබුණේ නම් ස්ථිර ලෙසම එම කුමන්ත්‍රණය ජය ගන්නා අතර ඉන් වමේ ව්‍යාපාරය ලෙස ජ.වි.පෙ.ට මුහුණ දීමට සිදුවන දේශපාලන අභියෝගය විශාලය. ජනාධිපතිවරයා විසින් අත්තනෝමතික ලෙස තම අභිමතය හා තම පටු දේශපාලන න්‍යාය පත්‍රය වෙනුවෙන් පාර්ලිමේන්තුව විසුරුවා හැරීම නීති විරෝධී බව ශ්‍රේෂ්ඨාධිකරණය මගින්ම ප්‍රකාශයට පත්කර ගැනීමට හැකිවූයේ 19වැනි සංශෝධනය නිසාය. එමගින් වසර හතරහමාරක් යන තුරු ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවීමට නොහැකි බව සඳහන් කර තිබූ නිසාය.

එසේම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේදී මෙන්ම මෙම සමස්ත ක්‍රියාවලිය තුළදීම අධිකරණයේ හැසිරීම අතීතයට සාපේක්ෂව ස්වාධීන ලෙස පවත්වාගෙන යාමට අධිකරණයට හැකි වූයේද අධිකරණයේ විනිසුරුවරුන් පත්කිරීමේ බලය ජනාධිපතිවරයාගෙන් ඉවත් කොට එය ව්‍යවස්ථා සභාවට හා අධිකරණ සේවා කොමිෂන් සභාවට පවරා තිබීම නිසාය. එයද 19වැනි සංශෝධනයේ ජයග්‍රහණයකි. එබැවින් ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අතීතයේ ජ.වි.පෙ. සිදු කළ මැදිහත්වීම අපතේ නොගිය බව ඉතා පැහැදිලිය.

> ජ.වි.පෙ. ඇතුළු එම බලවේග ඉදිරිපිට ඇත්තේ එකිනෙක බැඳුණු ක්‍රියාමාර්ග දෙකකි. ඉන් පළමුවැන්න මේ පාර්ලිමේන්තුව තුළම 20වැනි සංශෝධනය සම්මත කොට විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා සටන් කිරීමත් ඒ සඳහා එ.ජා.ප.යට ශ්‍රීල.නි.ප.යට ඇතුළු පක්ෂවලට බලපෑම් කිරීමය. ඒ වෙනුවෙන් දැවැන්ත ජනමතයක් හැදීමය. ඒ අතරම ඔවුන් එය මෙම පාර්ලිමේන්තුව තුළ ඉටුකිරීමට සූදානම් නොමැති නම් ඒ සඳහා වන දැවැන්ත සමාජ බලවේගයක් නිර්මාණය කර ඊළඟ මැතිවරණයකදී එම බලවේගය පාර්ලිමේන්තුවේ බලය අත්පත් කරගැනීම හෝ අවම වශයෙන් තීරක බලයක් ලබාගැනීමය.

ප්‍රජාතන්ත්‍රවාදය රැකගැනීමේ සටනේදී දැන් අප අභිමුව තිබෙන ප්‍රධාන කාර්ය වන්නේ, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමය. පාර්ලිමේන්තුවේ දැනට පවතින මන්ත්‍රී සංයුතියේ ස්වභාවයත් ආණ්ඩුවේ ප්‍රතිවිරෝධතාත් මහින්ද රාජපක්ෂට ඊළඟ ජනාධිපතිවරණයකදී තරග කිරීමට නොහැකිවීමත් පසුගිය දිනවල ජනාධිපතිවරයා ලෙස මෛත්‍රීපාල මහතාගේ හැසිරීමේ අනතුරුදායක ස්වභාවයත් යන කරුණු නිසා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ වඩා වාසිදායකම තත්වය දැන් මතුවී තිබේ. මේ මොහොතේ හොඳින් නිරීක්ෂණය කළ විට පෙනෙන සත්‍යය වන්නේ, විධායක ජනාධිපති ක්‍රමය රැකගැනීමට උත්සාහ කරන අයට වඩා එය අහෝසි කිරීමට සටන් කරන බලවේග ප්‍රමාණයෙන් විශාල බවය. එය හොඳ තත්වයකි.

විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා වන සාමාජීය උනන්දුව හා උත්සාහය තීව්‍ර වෙමින් තිබියෙදී එම අවශ්‍යතාවය තම ඊළඟ මැතිවරණ ජයග්‍රහණය සඳහා කොල්ලකෑමේ උත්සාහයක් එ.ජා.ප.යේ පැත්තෙන් දැන් මතුවෙමින් තිබේ. අපේ රටේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ උත්සාහයන් කිහිපයක්ම අතීතයේදී එක් එක් ධනපති පක්ෂ විසින් තම බලය වෙනුවෙන් කොල්ලකන ලදී. මෙයද එයම නැවත සිදුකිරීමට දරන උත්සාහයකි.

1994 දී චන්ද්‍රිකා කුමාරතුංග ද, 2005දී හා යළි 2010දී මහින්ද රාජපක්ෂද, 2015දී මෛත්‍රීපාල සහ එ.ජා.ප.යද තම බලය වෙනුවෙන් මෙම සටන් පාඨය යොදාගත් අතර බලය ලබාගත් වහාම එය අත්හැර දැම්මෝය. දැන් එම පැරණි නාඩගම රඟදැක්වීමට රනිල් ප්‍රමුඛ එජාපය සූදානම් වන බව පෙනේ. ප්‍රජාත්‍රන්ත්‍රවාදය ගරුකරන සැබෑ බලවේග ඉඩ නොදිය යුත්තේ එයටය.

විධායක ජනාධිපති ක්‍රමය වෙනස්කරන ව්‍යාවස්ථා සංශෝධනයකදී හෝ නව ව්‍යාවස්ථාවක් සැකසීමේදී එය පාර්ලිමේන්තුවේ සම්මත කර ගැනීමට තුනෙන් දෙකක බලයක් අවශ්‍ය වේ. වත්මන් පාර්ලිමේන්තුවේ කිසිදු තනි පක්ෂයකට එවැනි බලයක් නැත. ඉන් අදහස් වන්නේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ සංශොධනයක් මෙම පාර්ලිමේන්තුවේ සම්මත කර ගත නොහැකිය යන්න නොවේ. ඒ සඳහා පහසුම තත්වය සාදන්නේ මෙවැනි අස්ථාවර පාර්ලිමේන්තුවක් තුළය. තනි පක්ෂයකට තුනෙන් දෙකේ බලය ලැබුණු සෑම විටකම ඔවුන්කර ඇත්තේ මෙම බලතල තව තවත් වැඩිකර ගැනීමය.

1978 දී ජයවර්ධන මහතා මෙම ක්‍රමය නිර්මාණය කළේ ඔහුට ලැබුණු හයෙන් පහක බලය උපයෝගී කරගෙනය. ඉන්පසු මහින්ද රාජපක්ෂ මහතා එ.ජා.ප. මන්ත්‍රීවරු මිලදී ගෙන

15 වැනි පිටුවට



"අප සටන් කරන්නේ පරාජය වීමට නොව, ජය ගැනීමටය. තත්වය ඉතාමත් නරක වුවත්, යටත් පිරිසෙයින් අර්ධ සාර්ථකත්වයක්වත් අපි අපේක්ෂා කරන්නෙමු. අප පරාජය වුවත්, අපි අර්ධ සාර්ථකත්වයක් අත් කර ගන්නෙමු. අපි ප්‍රතිසංස්කරණ දිනා ගන්නෙමු. ප්‍රතිසංස්කරණ පංති අරගලයේ උපකරණයකි."

**ලෙනින්**
**තෝරාගත් කෘති, 05 වැනි වෙළුම, 95 වැනි පිටුව**

# දේශපාලන නිදහස උදෙසා

"ප්‍රජාතන්ත්‍රවාදය ලැබුණාම බඩ පිරෙනවද?", "රටේ ජනතාවට කන්න බොන්න තියෙනවා නම් ප්‍රජාතන්ත්‍රවාදයක් මොකටද?" "ප්‍රජාතන්ත්‍රවාදය දෙන්න ඉස්සෙල්ල රටේ ජනතාවගේ බඩ කට පුරවන්න ඕන"

මෙවෙනි ප්‍රකාශ, මතවාද ආදිය පසුගිය කාලය පුරා දැනුවත්ම හෝ නොදැනුවත්ම ජනතාව අතර හුවමාරු වන්නට විය. නමුත් මෙවෙනි මතවාද ඕපපාතිකව සමාජය මත පතිත වන්නේ නැත. එහි මූලයන් සොයා යැමේදී ඒවා ජනතාවගේ මත නොව වත්මන් තත්වය තුළ ප්‍රජාතන්ත්‍රවාදී ඉඩකඩ යම් පමණකට හෝ පුළුල් වනවාට එරෙහි කොටස් විසින් ජනතාව මත පොම්ප කරන ලද ඒවා බව ඉතා පැහැදිලිය.

"දේශපාලන නිදහස ලැබූ පමණින් වැඩ කරන ජනතාව එක්වරම දුප්පත්කමෙන් නිදහස නොලැබුවත්, එයින් ඔවුනට ලැබෙන්නේ දුප්පත්කමට විරුද්ධව සටන් කිරීමට උපයෝගී කරගත හැකි අවියකි. කම්කරුවන්ගේම සමගිය හැර දුප්පත් කමට විරුද්ධව සටන් කිරීමේ වෙනත් මගක් නැත; වෙනත් මගක් තිබිය නොහැකිය. එහෙත් දේශපාලන නිදහස ඇතොත් මිස කෝටි ගණන් ජනතාවට සමගි විය නොහැකිය."( වී.අයි. ලෙනින්, කම්කරු පංතිය හා ගොවි ජනතාව අතර සන්ධානය, පිටුව-27)

මෛත්‍රී-මහින්ද කුමන්ත්‍රණයට එරෙහිව ජනතා විමුක්ති පෙරමුණ ක්‍රියාත්මක වන්නේ යම් පමණකට හෝ ප්‍රජාතන්ත්‍රවාදී ඉඩ කඩ පුළුල් කර ගැනීමටය. එයින් ලැබෙන දේශපාලන නිදහස තුළ පීඩකයන්ට එරෙහිව සංවිධානය වීම තවදුරටත් පහසු කරන හෙයිනි.

මෙම කුමන්ත්‍රණයට එරෙහිව ජ.වි.පෙ. ගෙන ගිය අරගලයේ තීරණාත්මක ජයග්‍රහණයක් ලැබෙන්නේ පසු ගිය දෙසැම්බර් 13වැනිදා ජනාධිපතිවරයාට වසර 41/2ක් යන තෙක් පාර්ලිමේන්තුව විසිරවිය නොහැකි බවට ශ්‍රේෂ්ඨාධිකරණය දුන් තීන්දුවත් සමගය. එම මොහොතේ අධිකරණ භූමියේ සිටිමින් මාධ්‍ය වෙත අදහස් දක්වමින් ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා ප්‍රකාශ කර සිටියේ මේ විවර වී ඇති ප්‍රජාතන්ත්‍රවාදයේ දොරටු තවදුරටත් පුළුල් කර ගනිමින් ඉදිරියට ගමන් කරන බවය.



මේ අවස්ථාව සඳහා ජ.වි.පෙ. පාර්ලිමේන්තු මන්ත්‍රීන් වන බිමල් රත්නායක, නලින්ද ජයතිස්ස, සුනිල් හඳුන්නෙත්ති සහ නීතිඥ සුනිල් වටගල යන සහෝදරුවරු සහභාගි වී සිටියහ.

# ජනතාව දැනුවත් කරමින්



ඔක්තොබර් 26 කුමන්ත්‍රණය හමුවේ මෙරට බොහෝ විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය සිටගත්තේ කුමන්ත්‍රණකරුන් සමගය. එනිසාම ජනතාවට සැබෑ කුමන්ත්‍රණකරුවන් කවුරුන්දැයි යන්න සොයාගැනීම අපහසු විය. බහුතරයක් මාධ්‍ය පෙළගැසුණේ මහින්ද-මෛත්‍රී කුමන්ත්‍රණය සාධාරණීකරණය කිරීමටය.

එමෙන්ම සරල බෙදීමට අනුව යමින් ජ.වි.පෙ. ක්‍රියාත්මක වන්නේ එ.ජා.ප. මෙන්ම රනිල් වික්‍රමසිංහ ආරක්ෂා කිරීමට බවද අධිපති මාධ්‍ය තුළින් ජන මනසට පොම්ප කරන ලදී. එසේම කුමන්ත්‍රණයට එරෙහි යැයි පවසන මාධ්‍ය පෙනී සිටියේ එ.ජා.ප. ය ආරක්ෂා කරන පියවරකය.

මේ තත්වය තුළ කුමන්ත්‍රණයේ සැබෑ ස්වරූපය ජනතාවට පැවසීම සඳහා සාකච්ඡා, සම්මන්ත්‍රණ, රැස්වීම් පැවැත්වීම මෙන්ම අත්පත්‍රිකා ආදිය බෙදාහැරීමට ජ.වි.පෙ. කටයුතු කරන ලදී.

ඒ අනුව ගෙයින් ගෙට යමින් පත්‍රිකා බෙදාහැරීමේ වැඩපිළිවෙළක් දෙසැම්බර් 22 වැනිදා ආරම්භ කරන ලද අතර දිවයිනේ ප්‍රදේශ ගණනාවක මෙය සාර්ථකව ඉටු කිරීමට ජ.වි.පෙ.ට හැකි විය.

පසුගිය දෙසැම්බර් 25 වෙනිදාද බස්නාහිර පළාත් සභා මන්ත්‍රී නීතිඥ සුනිල් වටගල සහෝදරයාගේ මූලිකත්වයෙන් අත් පත්‍රිකා බෙදාහැරීමක් කොළඹ රාජගිරිය, ඔබේසේකරපුරදී පැවැත්වුණු අතර එහිදී එම ජනතාගෙන් උණුසුම් ප්‍රතිචාර ජ.වි.පෙ. සාමාජිකයින්ට හිමි විය.

# පොරොන්දු වූ මුදල ඉල්ලා

පැවති රාජපක්ෂ ආණ්ඩුව මෙන්ම කුමන්ත්‍රණයට පෙර යහපාලන ආණ්ඩුවද රටේ අනෙක් ක්ෂේත්‍රයන්ට මෙන්ම ගොවි ජනතාවගේ ගැටලු සඳහාද විසඳුම් ලබා දීම යන කාරණය අමතක කර කටයුතු කරන්නට විය. එහෙත් ඇතැම් අවස්ථාවන්හිදී ජ.වි.පෙ.ට අනුබද්ධ සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ අරගලයන් හමුවේ ඔවුනට එසේ සිටීමට හැකි වූයේ නැත. මේ හේතුව නිසාවෙන් ඉල්ලීම් දිනා ගැනීමට නම් සමස්ත ගොවිජන සම්මේලනය සමග එක් විය යුතු බවට ගොවි ජනතාව අතර මතයක් තහවුරු වී තිබේ.

ඒ අනුව යමින් ශක්ති ලොකු එණු බීජ නිෂ්පාදකයින්ගේ සංගමය, සමස්ත ලංකා ගොවිජන සම්මේලනය සමග එක්ව තම ඉල්ලීම් දිනා ගැනීම සඳහා පසුගිය දෙසැම්බර 10වැනිදා දඹුල්ල නගරයේ උද්ඝෝෂණ ව්‍යාපාරයක් පවත් වන ලදී. 2018 වසරේ යල කන්නයේදී රජයේ ලොකු ළූණු වගාව ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ රජයට ලොකු ළූණු බීජ ලබාදුන් ගොවීන්ට මාස ගණනාවක් ගත වී ඇතත් එයට අදාළ ගෙවීම් ආණ්ඩුව විසින් පැහැර හැර තිබීම මෙම උද්ඝෝෂණයට මූලික හේතුව විය. පොරොන්දු වූ ලොකු ළූණු බීජ කිලෝ එකකට රුපියල් 4500ක මුදල වහා ලබාගැනීම මෙහි ප්‍රධාන අරමුණ වී තිබිණ.

මෛත්‍රී-මහින්ද කල්ලිය කුමන්ත්‍රණකාරී ලෙස බලය ඩැහැ ගැනීමට කටයුතු කළ වටපිටාවක් තුළ මෙම උද්ඝෝෂණය පැවැත්වීම විශේෂයක් විය. මෙම උද්ඝෝෂණය සමස්ත ලංකා ගොවිජන සම්මේලනයේ සභාපති නාමල් කරුණාරත්න සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණු අතර දඹුල්ලේ ගොවීහු විශාල පිරිසක් ඊට එක්වී සිටියහ.




# කුමන්ත්‍රණ පරදවා ඉදිරියට

ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය යනු දිගේලි කළ එකක් බව ජ.වි.පෙ.ට ඉතා හොඳ අවබෝධයක් ඇත. එහෙත් එම තිබෙන ප්‍රජාතන්ත්‍රවාදී අවකාශයද කිසියම් කණ්ඩායමක් හෝ කල්ලියක් විසින් අහෝසි කිරීමට තැත් කරන්නේ නම් එය කොන්දේසි විරහිතව පළමු පැයේදීම පරාජය කළ යුතුය. ජ.වි.පෙ. විසින් පසුගිය කාලයේ සිදුකරන ලද්දේ එම කාර්යභාරයයි. සතුරා කෙතරම් අවලාද නැගුවද ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පුළුල් එකතුවක් ගොඩ නැගීමට ජ.වි.පෙ.ට හැකි විය.

"කුමන්ත්‍රණ පරාදයි; සැබෑ ජනතාවාදී පාලනයක් වෙනුවෙන් පෙළගැසෙමු" යන තේමාව යටතේ පසුගිය දෙසැම්බර් 15 වෙනිදා කිරුළපනදී දැවැන්ත ජනතා රැලියක් පැවැත්වීමට



ජනතා විමුක්ති පෙරමුණ කටයුතු කරන ලදී. ජ.වි.පෙ. සාමාජිකයින් මෙන්ම විශාල පොදු ජනතාවක්ද මෙම රැලිය සඳහා සහභාගී වී සිටිම විශේෂත්වයක් විය.

ජ.වි.පෙ. නායකයින්, විශ්වවිද්‍යාල ආචාර්යවරු, උගත්තු, බුද්ධිමත්හු, සිවිල් සංවිධාන ක්‍රියාධරයෝ මෙම රැලියේ ආරාධිත දේශකයෝ වූහ. ජ.වි.පෙ. නායක අනුර දිසානායක, ප්‍රචාරක ලේකම් විජිත හේරත් යන සහෝදරවරුන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය විජිත රෝහණ, සමස්ත ලංකා තරුණ හින්දු සම්මේලනයේ ලේකම් සතිස් සිවලිංගම්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හරිනි අමරසූරිය, සාහිත්‍යවේදී කමල් පෙරේරා, අලුත් පරපුර සංවිධානය වෙනුවෙන් චිත්‍රපට අධ්‍යක්ෂ ප්‍රියන්ත කළුආරච්චි, නීතීඥ උපුල් කුමාරප්පෙරුම, රංගන ශිල්පිණී දීපානි ද සිල්වා, නීතීඥ සංගමයේ හිටපු උප ලේකම් නීතීඥ චරිත් ගල්හේන සහ වමේ කේන්ද්‍රයේ සම කැඳවුම්කරු මයිකල් ප්‍රනාන්දු යන මහත්ම මහත්මීන් විසින් රැස්ව සිටි ජනතාව අමතන ලදී.

# ආර්ථිකයේ අගාධය: අතුරු සම්මත ගිණුම හා 2019 අයවැය

ඔක්තෝබර් 26 ඇරඹි දේශපාලන කුමන්ත්‍රණය සමනය වෙමින් පසුගියදා දින 51 කින් පසු තාවකාලික සටන් විරාමයකට ඇතිවිය. ඊට සමගාමීව අයවැය ඉදිරිපත් කරනු වෙනුවට යළි බලය මාරුකරගත් එක්සත් ජාතික පක්ෂ පාලනය විසින් ඉදිරි මාස 4ක වියදම සඳහා (අයවැය වෙනුවට) පාර්ලිමේන්තුවේ අතුරු සම්මත ගිණුමකින් මුදල් අනුමත කරගන්නා ලදී. මීට පෙරද අතුරු සම්මත ගිණුම මගින් මුදල් අනුමතකර ගත් අවස්ථා පැවැතියද මෙවර අතුරු සම්මත ගිණුම ඉන් ඔබ්බට යන ඉදිරි මැතිවරණයකට අවශ්‍ය ප්‍රචාරක ව්‍යාපෘති සඳහාද මුදල් වෙන් කළ බවක් බැලූ බැල්මටම පෙනීයයි.

අතුරු සම්මත ගිණුමක් අයවැයත් දෙකම එකක් ලෙස සමහරු සලකන බැවින් අතුරු සම්මත ගිණුමේ කාර්යභාරයත්, අයවැය කාර්යභාරයත් වෙන් කොට හඳුනා ගැනීමද අත්‍යාවශ්‍යය. අයවැයක් මුළු වර්ෂය සඳහාම ඉදිරිපත් කරනු ලබන ආණ්ඩුවේ ආදායම හා වියදම දෙපාර්ශවයම පෙන්නුම් කරන ලියවිල්ලයි. ආණ්ඩුව ඉදිරි වර්ෂයේ සිදුකිරීමට අපේක්ෂා කරන වියදම සහ එම වියදම් පියවා ගන්නා ආදායම ආකාරය පෙන්නුම් කරන ලේඛනය ලෙසද අයවැය හඳුන්වයි. 2019 වසරට අදාළ අයවැය ලේඛනය නියමිත පරිදි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ නම් නොවැම්බර් 05 වැනි දින ඉදිරිපත් කිරීමට නියමිතව තිබුණි. එම ආණ්ඩුවේ අයවැය ලේඛනයට අදාළ වියදම්වල, වියදම් කළ හැකි උපරිම සීමාවන් දක්වන මුදල් පණත් කෙටුම්පත වන්නේ අයවැය ඉදිරිපත් කිරීමට පෙර පාර්ලිමේන්තුව හමුවේ සභාගත කරන විසර්ජන පනත් කෙටුම්පතයි. 2019 වසරේ අයවැය අදාළ විසර්ජන පනත් කෙටුම්පත 2018 ඔක්තෝබර් 09 වැනි දින පාර්ලිමේන්තුව හමුවට සභාගත කරන ලදී. ආණ්ඩුව අයවැය ඉදිරිපත් කළ යුතු වන්නේ විසර්ජන පනතේ වියදම් සීමාවන්ට යටත්වය.

විසර්ජන පනතේ වියදම සීමාවන්ට අනුව අදාල වර්ෂයට (2019ට) ආණ්ඩුවේ වියදම පිළිබඳව දළ අදහසක් ඒ නිසාම බැලූ බැල්මට ගත හැකිය.

උදාහරණ ලෙස 2018 ඔක් 09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ විසර්ජන පනතට අනුව 2019 ජනවාරි 01 සිට 2019 දෙසැම්බර් 31 දිනයෙන් අවසන් වන කාල සීමාවේ සේවා වියදම සඳහා රු. බිලියන 2281ක් ඇස්තමේන්තුකර ඇති බව දක්වා ඇත. ආණ්ඩුවේ ණය ගැනීමේ සීමාවද එලෙසම බිලියන 1944ක් ලෙස දක්වා ඇත.




දැන් ආණ්ඩුව අයවැය වෙනුවට මාස 4ක් කාලයක් සඳහා ආණ්ඩුවේ අත්‍යාවශ්‍ය වියදම් සඳහා අතුරු සම්මත ගිණුමකින් මුදල් වෙන් කරගෙන ඇත. ඒ සඳහා ආණ්ඩුවේ මන්ත්‍රීවරු 102ක් පක්ෂව ඡන්දය දුන් අතර ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් 6දෙනා විරුද්ධව ඡන්දය භාවිතා කරන ලදී. ආණ්ඩු පෙරළීමෙන් අනතුරුව යළි විපක්ෂයට වැටුණු සන්ධාන කල්ලිය පළමු විපක්ෂයේ ඡන්ද විමසීමේදීම මගහැර යමින් ආණ්ඩුවට අනියම් සහාය පළකිරීමක් කරන ලදී. ඔවුන්ගේ සහාය නොදීම වෙනුවට විරෝධය පළකළේ නම් අතුරු සම්මත ගිණුමද පාර්ලිමේන්තුවේ පරාජයට පත් කළ හැකිවනු ඇත.

### ජ.වි.පෙ. විරෝධයේ හේතුව

අයවැය ඉදිරිපත් කිරීමට නොහැකි තත්වය යටතේ රජයේ අත්‍යාවශ්‍ය සේවා සහ රජයේ සේවකයින්ගේ වැටුප් ගෙවීම වැනි අත්‍යාවශ්‍ය සේවා සඳහා මාස 04කට ගෙනෙන අතුරු සම්මත ගිණුමට ජනතා විමුක්ති පෙරමුණ විරුද්ධ වූයේ ඇයිදැයි යමකුට සාධාරණ ප්‍රශ්නයක් පැන නැගිය හැකිය.

පාර්ලිමේන්තුවේදී පැවැති විවාදයේදී ද ජ.වි.පෙ. මන්ත්‍රීවරුන් කරුණු දැක්වූ පරිදිම මෙම අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කළේ රජයේ නිලධාරීන්ගේ වැටුප් අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහන, වැනි අත්‍යාවශ්‍ය සේවා පවත්වා ගැනීමට නම් එයට විරෝධය දැක්වීමට නොව සිදු කළ හැක්කේ සහාය පළකිරීමය. නමුත් කලින් පැහැදිලි කළ විසර්ජන පනතේ රජයේ සේවා වියදම ලෙස උපරිමයට වියදම් කළ හැකි (ණය වාරික හා පොලී හැර) සේවාවන්ගේ සීමාව රු. බිලියන 2281ක් ලෙස දක්වා ඇති තත්වය යටතේ ආණ්ඩුව මාස 04ක් සඳහා පමණක් (එක් කාර්තුවකට පමණක්) අතුරු සම්මත ගිණුමින් වියදම් කිරීමට ඉවන් කර ඇති මුළු මුදල රු. බිලියන 1765කි. එය මුළු වසරටම වියදම් කළ හැකි උපරිම සීමාවෙන් 77%කටත් වැඩි ප්‍රමාණයකි. මාස 09කටත් වඩා වැඩි කාලයක් සඳහා වන මුදලක් මාස 4කට වියදම් කිරීමට අතුරු සම්මත ගිණුමක් ආණ්ඩුව විසින් ඉදිරිපත් කරන්නේ කවර විශේෂ හේතු දැක්වීමක් යටතේද? එක්කෝ මෙම මාස 04 සඳහා රජයේ සේවකයින්ගේ පඩි වැඩි කිරීමක් යෝජනා කළ යුතුව තිබේ. එවැනි කිසිදු යෝජනාවක් නොමැති තත්වයක් තුළ මෙම වැඩිපුර වියදම යෝජනා සම්මත කරනු ලබන්නේ පැහැදිලිවම මහින්ද රාජපක්ෂ බලය බලහත්කාරයෙන් පැහැර ගෙන සිදු කිරීමට අපේක්ෂා කළ මැතිවරණ ප්‍රචාරක ව්‍යාපෘති සඳහා වියදම් කිරීමට එක්සත් ජාතික පක්ෂයද අපේක්ෂා කරන නිසාවෙනි.

> විසර්ජන පනතේ රජයේ සේවා වියදම ලෙස උපරිමයට වියදම් කළ හැකි (ණය වාරික හා පොලී හැර) සේවාවන්ගේ සීමාව රු. බිලියන 2281ක් ලෙස දක්වා ඇති තත්වය යටතේ ආණ්ඩුව මාස 04ක් සඳහා පමණක් (එක් කාර්තුවකට පමණක්) අතුරු සම්මත ගිණුමින් වියදම් කිරීමට ඉවන් කර ඇති මුළු මුදල රු. බිලියන 1765කි. එය මුළු වසරටම වියදම් කළ හැකි උපරිම සීමාවෙන් 77%කටත් වැඩි ප්‍රමාණයකි. මාස 09කටත් වඩා වැඩි කාලයක් සඳහා වන මුදලක් මාස 4කට වියදම් කිරීමට අතුරු සම්මත ගිණුමක් ආණ්ඩුව විසින් ඉදිරිපත් කරන්නේ කවර විශේෂ හේතු දැක්වීමක් යටතේද?

**ජ.වි.පෙ. විරෝධය මැද අනුමත කරගත් වියදම් සාරාංශය**

| | |
|---|---|
| පොදු සේවාවන්ට ගෙවිය යුතු මුදල් බිලියන | 790 |
| ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු රජයේ වියදම බිලියන | 970 |
| රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් වියදම බිලියන | 05 |
| එකතුව | 1765 |

මීට අමතරව මෙම වියදම්වලින් ජනාධිපතිවරයාටද මාස 04කට සැලකිය යුතු මුදලක් වෙන් කිරීමට අමතක කර නැත. එය මිලියන 4395කි.

එසේම විසර්ජන පනතේ ලබන වසර ගත හැකි ණයවල උපරිමය රු. බිලියන 1944ක් ලෙස දක්වා ඇත. එයින් අතුරු සම්මත ගිණුමින් මෙම පළමු මාස 04ට පමණක් ණය ලෙස රු. බිලියන 990ක් (50% කට වැඩිපුර) ලබා ගැනීමට යෝජනා කර ඇත. මේ සියලු කරුණු එකට ගත් විට පැහැදිලි වන්නේ මෙම අතුරු සම්මත ගිණුම ආදායම් මාර්ග ලෙස ණය ගැනීම පමණක් පෙන්වන ආණ්ඩුවේ මැතිවරණ ප්‍රචාරක ව්‍යාපෘතියක් සඳහා මුදල් වෙන් කර ගැනීමට ගත් උත්සාහයක් බවයි.

### 2019 ආර්ථික අභියෝගය

2019 වසරට අපි සුභ පතා ගත්තද 2019 ආර්ථිකයට අපට සුභ පතා ගන්නට කොහෙත්ම නොහැක. 2019 අප්‍රේල් 15ට පෙර අඩු තරමේ ඩොලර් බිලියන 1000ක් වත් ලංකාව උපයා ගත යුතුමය. ඒ 2018 ණයවල ගෙවිය යුතු වාරික හා පොලී ගෙවීමටය. 2019 පළමු මාස 04ට යළි රු. බිලියන 990ක් ණය ගැනීමටද අපේක්ෂිතය.

දැනටමත් එළවළු, මාළු ඇතුළු අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල ඉහළ යන්නේ, ලෝක වෙළඳපොළේ තෙල් මිල පහළ බසින විටදීය. 2000 දී 16.8% ක්ව පැවැති රජයේ ආදායම අද වනවිට 13.8%ට අඩු කර ඇත. 2000 දී 20%ක් පැවැති රජයේ වියදම 14.5% ට කප්පාදු කර ඇත. 07% ක මට්ටමේ තිබුණු රජයේ ආයෝජන 4.9%ට අඩු කර ඇත. නමුත් 2000 වසරේදී ඇමරිකානු ඩොලර් බිලියන 7.3ක් වූ ආනයන වියදම තුන් ගුණයකින් වැඩිවී 2019 වනවිට ඩොලර් බිලියන 21ක් වී තිබේ. ඩොලර් බිලියන 5.5ක් වූ 2000 වසරේ අපනයන ආදායමද 2017 වනවිට ඩොලර් බිලියන 11.4ක් ලෙස දෙගුණයකින් ඉහළ ගියද එය රජයේ වියදම හා ඉහළ යන අපනයන වියදමවලට ඔරොත්තු දිය හැකි ඉතිහාසයක් පුරා ණය වී යළි යළිත් කරමතට වැඩිපුර කඩා වැටෙන ණය ගොඩට පිළියමක් වී නොමැත.

ඇති නැති පරතරය අඩු කරනු වෙනුවට සෑම රජයකම ප්‍රතිපත්ති දිශානතිය සකස්වී ඇත්තේ එම පරතරය තවත් පුළුල් කරන දිශාවටමය. ශ්‍රී ලංකාවේ බහුතර ජනතාවක් (ජනගහනයෙන් 72%) ජීවත් වන්නේ ශ්‍රමිකයන්ය. ඔවුන්ගේ ණයගැතිභාවය ප්‍රතිශතය 61.1%කි. එය වතුකරයේදී 93% කි. නාගරික පවුලක මාසික සාමාන්‍ය ආදායම රු. 88,692 ක් ලෙස ගණනය කරනවිට එය ග්‍රාමීයව රු. 58,137කි. වතුකරයේදී රු. 34,804කි.

අප හැමවිටම සිහිපත් කරන පරිදි මෙම සියලු ආදායම් පොදුවේ බෙදී නොයයි. සමාජයේ ආදායම බෙදීයන්නේ දුප්පත්ම ජනගහනයෙන් 20% ක් සඳහා ආදායමෙන් 4.8% ක් සහ පොහොසත්ම 20% ක් ජනගහනයට ආදායමෙන් 50.8%ක් ලෙසටය. මේ ඇති නැති පරතරයට තාවකාලික පැලැස්තර විසඳුම් නැති බව තේරුම් ගැනීමට හොඳම කාලය දැන් එළඹ ඇත.

ගතවූ දින 51ක කුමන්ත්‍රණ කාලය රට අකර්මණ්‍ය කළ අතර ඉන් ආර්ථිකයට විශේෂයෙන් සංචාරක කර්මාන්තයට සිදුකළ පාඩුවද සුළුපටු නොවේ.

අයවැය අතුරු සම්මත ගිණුම සහ විසර්ජන පනත මේ සියල්ලම පාර්ලිමේන්තුව තුළ ජනතාවට මුදල් පාලනයට ඇති බලයේ පිළිබඳ ප්‍රකාශයන්ය. නමුත් ඒ සියල්ල ජනතාව පෙළන පීඩනයට පත් කරන වුවමනාවන් වෙනුවෙන් යොදවන පාලනයකට ජනතාවටත් රටටත් අලුතින් ලබාදියහැකි යමක් නැති බව අප තේරුම් ගත යුතුව ඇත.



අදක්ෂ බොහෝ දෙනෙකුගේ මැතිවරණය යනු දූෂිතයින් අතලොස්සකගේ පත්කිරීම් වෙනුවෙන් ප්‍රජාතන්ත්‍රවාදය ආදේශක කරගැනීමකි.

**ජෝර්ජ් බර්නාඩ් ෂෝ**

# ප්‍රංශය: කහ කබාකරුවන්ට මැදිවී




ප සුගිය නොවැම්බර් 17න් පසු ප්‍රංශය වසර 50 කාලය තුළ මුහුණ දුන් බරපතලම ජනතා විරෝධයට මුහුණ දුන්නාය. 'කහ කබා' (Yellow Vest) ව්‍යාපාරය ලෙස හැඳින්වූ එය මේ වන විටත් අවසන් වී නැත.

ට්‍රක් රියදුරන් දෙදෙනෙක් සහ කුඩා වෙළඳසැල් හිමියෙක් විසින් සමාජ ජාලා ඔස්සේ ජනතාවගෙන් කෙරුණ ආයාචනයකට ප්‍රතිචාර ලෙස මෙම විරෝධතා ව්‍යාපාරය ආරම්භ විය. වැඩි කළ තෙල් මිලට විරෝධය දැක්වීම වෙනුවෙන් තම තමන්ගේ නගරවල හා මංසන්ධිවලදී වාහන ගමනාගනමටය අඩාල වන ලෙස විරෝධය දක්වන ලෙසත් එහි දී ප්‍රංශයේ සෑම වාහනයකම අනිවාර්යයෙන් රැගෙන යා යුතු කහ කබාය පළඳින ලෙසත් එමගින් ඉල්ලා තිබිණි. ඊට ප්‍රතිචාර දක්වමින් නොවැම්බර් 17 දින 300,000ක් පමණ විරෝධතාකරුවෝ මහා මාර්ගවලට පැමිණ අධිවේග මාර්ග අවහිර කරමින් විරෝධතා දැක්වූහ. ඉන්පසු එය වේගයෙන් ප්‍රංශය පුරා පැතිර ගිය අතර පැරීසියේදී එම විරෝධතාවය කලහකාරී තත්වයක් දක්වා වර්ධනය විය. නොවැම්බර් 24දින සිදු වූ එම විරෝධතාවයට 10,600ක් පමණ සහභාගි වූ අතර ඇති වූ ගැටුම්වලින් මරණ 4ක් සිදුවිය. 400ක් පමණ විරෝධතාකරුවන් පිරිසක් අත්අඩංගුවට ගැනුණි.

ප්‍රංශයේ මැක්‍රෝන් පාලනය 2018 වසරේදී පමණක් ඉන්ධන මිල 20%කින් පමණ ඉහළ දැමීය. (මේ වන විට ඩීසල් ලීටරයක මිල ඩොරල් 1.68ක් පමණ වී තිබුණි.) මීට අමතරව 2019 වසරේදී තවත් ඉන්ධන මිල ඉහළ දැමීමක් සිදු කිරීමට නියමිතව තිබුණි. මෙම කහ කබා විරෝධතාකරුවන්ගේ ප්‍රධාන ඉල්ලීම වූයේ වහාම තෙල් මිල අඩු කරන ලෙසය. පසුව මීට තවත් ඉල්ලීම් ගණනාවක් එක් වූ අතර මේ වන විට 'පොහොසතුන්ගේ ජනාධිපති' වූ මැක්‍රෝනි වහාම ඉල්ලා අස්විය යුතු බවටත් උද්ඝෝෂණකරුවෝ හඬ නගති. මේ වන විට යුරෝපයේ වැඩිම ඉන්ධන බදු ප්‍රතිශතය ඇත්තේ ප්‍රංශයේය.

මෙම විරෝධතා කොතරම් ප්‍රබලවීදයත්, මැක්‍රෝන්ගේ ආණ්ඩුවට ඉන්ධන මිල වහාම අඩු කිරීමට සිදුවිය. ඉදිරියේ දී වැඩි කිරීමට නියමිතව තිබූ තෙල් මිල වැඩි කිරීම මාස 06කින් ද විදුලි හා ගෑස් මිල වැඩි කිරීම මාස 03කින් ද කල් තබා තිබේ.

ප්‍රංශයේ මෙම කහ කබා විරෝධතාවලට වැඩි වශයෙන්ම සහභාගී වූයේ කම්කරුවන් සහ පහළ මධ්‍යම පන්තියේ පුරවැසියන්ය. ප්‍රබල වෘත්තීය සමිති ව්‍යාපාරයක් පවතින ප්‍රංශයේ වෘත්තීය සමිති ව්‍යාපාරයට පවා මෙවැනි බලපෑම් සහගත විරෝධතාවයක් දැක්වීමට නොහැකි විය. මේ වන විට ඔවුහු කහ කබාකරුවන්ගේ විරෝධතාවයට සහාය පිණිස වර්ජන ක්‍රියාමාර්ගයකට එළඹීම පිළිබඳ සාකච්ඡා කරමින් සිටිති. මෙම කහ කබා විරෝධතා ආකෘතිය අනෙකුත් රටවලටද පැතිර ගොස් ඇත. කහ කබා විරෝධතා ව්‍යාපාරයට නිශ්චිත නායකත්වයක් නැත. එසේම එහි අවසන් ඉලක්කය කුමක්ද යන්නද නිශ්චිත නැත. මේ වන විට ප්‍රංශය තුළ එහි ක්‍රියාකාරීවය ක්‍රමයෙන් අඩු වෙමින් පවතී.

කෙසේ වෙතත් මින් සංඥා කරනුයේ ජනතාව මෙම ක්‍රමය විසින් බරපතළ පීඩාවකට ලක්ව ඇති බවත් එය ඕනෑම මොහොතක පුපුරා යාමට නියමිත බවත්ය. එහෙත් ජනතාවගේ මෙම විරෝධතාවය ගොනු කර ගනිමින් ඊට නායකත්වයක් ලබා දීමට සම්ප්‍රදායික දේශපාලන පක්ෂ, වෘත්තීය සමිති සහ අනෙකුත් සංවිධාන අසමත් වී තිබේ. මැක්‍රෝන් මැතිවරණය ජයග්‍රහණය කරනුයේ ඔහු නව බලවේගයක් ලෙස ජනතාව ඉදිරියේ පෙනී සිටි බැවිනි. එහෙත් එය සාර්ථක පිළිතුරක් නොවන බව දැන් ජනතාවට තේරුම් ගොස් තිබේ. නව ව්‍යාපාරයක් ලෙස කහ කබා ව්‍යාපාරය පැන නැගුණු වහාම ජනතාව ඒ වටා රොක් විය. එහෙත් එයට නිශ්චිත නායකත්වයක් හා වැඩපිළිවෙළක් නොතිබූ හෙයින් එයද ප්‍රතිඵල රහිත වී යාමට ඉඩ තිබේ. මෙයින් විශේෂයෙන් වමේ ව්‍යාපාර විසින් සලකා බැලිය යුතු තත්වයක් මතු වී තිබේ.

## කියුබාව: ලෝක සෞඛ්‍යයේ හොඳම රට බවට




2019 ජනවාරි 01 දිනට කියුබානු සමාජවාදී විප්ලවයට වසර 60ක් සම්පූර්ණ වේ. මේ වන විට කියුබාව ලෝකයේ හොඳම සෞඛ්‍ය සේවය සහිත රට බවට පත් වී තිබේ.

2018 දී එරට අයවැයෙන් 51%ක්ම වෙන්කරනු ලැබුවේ සෞඛ්‍ය සහ අධ්‍යාපනය සඳහාය. සෞඛ්‍ය සේවාව සඳහා පමණක් අයවැයෙන් 27%ක් වෙන් කරනු ලැබීය.

කියුබාව පුරා සෞඛ්‍ය සේවාව සපයන ආයතන 13,000ක් පමණ පවතින අතර ඉන් 150ක් රෝහල්ය. ආයතන 449ක් බහුසායන වන අතර 10,896ක් පවුලේ වෛද්‍යවරුන්ගේ සායන වේ. 2018 වන විට කියුබාවේ වෛද්‍යවරු 94,000ක් සිටි අතර සෑම පුරවැසියන් 1000කටම වෛද්‍යවරු 8.2ක් සිටී. කියුබාවේ දන්ත වෛද්‍යවරු 19,000ක්ද හෙදියෝ 85,000ක්ද සිටිති. වෛද්‍ය විද්‍යාල ඇතුළු සෞඛ්‍ය අධ්‍යාපන ආයතන 13ක සිසුන් 101,000ක් ඉගෙනුම ලබයි. කියුබානු කම්කරුවන්ගෙන් 57.4%ක් වෘත්තීය සේවාවල යෙදෙන අතර ඉන් 92%ක් සෞඛ්‍ය සේවාට අයත් වෙති. කියුබාවේ ළදරු මරණ අනුපාතිකය උපත් 100කට 3.9කි. එය ලොව අඩුම ළදරු මරණ අනුපාතිකයයි. එරට දරුවන් රෝග 13කින් ආරක්ෂාවීම සඳහා එන්නත් 11ක් රජය විසින් නොමිලේ ලබා දෙයි. මෙම එන්නත් අතරින් 8ක්ම නිපදවන්නේ කියුබාවේදී ය. කියුබාව තුළ සෞඛ්‍ය නිෂ්පාදන 1012ක් සිදු කරන අතර එයින් 482ක් ඖෂධ වේ.

එපමණක් නොව, සමාජවාදී කියුබාව ජාත්‍යන්තර වශයෙන්ද වෙනත් රටවල ජනතාවගේ සෞඛ්‍ය ප්‍රශ්න සඳහා විශාල මැදිහත්වීමක් සිදු කර තිබේ. 60 දශකයේ සිට මේ දක්වා ජාත්‍යන්තර මැදිහත්වීම් 600,000ක් සිදු කර ඇත. මේ දක්වා රටවල් 124ක මෙවැනි මැදිහත්වීම් සිදුකර ඇති අතර ඒ සඳහා කියුබානු සෞඛ්‍ය සේවාවේ 400,000ක් පමණ සහභාගි වී තිබේ. කියුබාව 2018 දී පමණක් හදිසි ආපදා අවස්ථාවලදී මෙන්ම විශේෂ සෞඛ්‍ය ව්‍යාපෘති සඳහා රටවල් 66කට සහාය ලබා දුන්නාය.

සමාජවාදී කියුබාව මෙවැනි සෞඛ්‍ය සේවාවක් පවත්වාගෙන යනු ලබන්නේ ඇමරිකා එක්සත් ජනපද සම්බාධක මැදය. එසේම ලෝක ජනතාවගෙන් බිලියනයක් සිය ජීවිත කාලය තුළ දී කිසිදු සෞඛ්‍ය වෘත්තිකයෙකු මුණ නොගැසී මිය යන තත්වයක් තුළදීය.

## ගෝලීය උණුසුම ඉහළයාමෙන් ජල හිඟයක්



දෙසැම්බර් 13වැනිදා ඕස්ට්‍රේලියානු පර්යේෂකයින් පිරිසක් නිකුත් කළ වාර්තාවක් අනුව ලෝකයේ වර්ෂාපතනය ඉහළ ගියද ලොව පුරා පැතිරුණු නියඟයක් ඇතිවීම නොවැළැක්විය හැකි බව පැවසේ. මෙලෙස වර්ෂාපතනය ඉහළ යාමට හේතුවී ඇත්තේ ගෝලීය උණුසුම වැඩිවීමයි. දැනට ගෝලීය උෂ්ණත්වය ද $0.9^0C$ ඉහළ ගොස් ඇති අතර 2100 වන විට එය $3.5^0$ Cකින් ඉහළ යනු ඇතැයි විශ්වාස කෙරේ.

වර්ෂාපතනය වැඩි වුවද පොළොවට වැටෙන ජලය පසට උරා ගැනෙන නිසා එම ජලය ප්‍රයෝජනයට ගත නොහැකි වී තිබේ. එවිට ගංගා සිඳී යයි. මේ තත්වය නිසැකවම උග්‍ර ජල හිඟයකට හේතු වනු ඇති බව ඔවුහු පවසති.

## එක්සත් ජනපදය: සිරියාවේ රැඳවූ හමුදා යළි කැඳවයි




සිරියාව තුළ ස්ථාන ගත කර තිබූ එක්සත් ජනපද හමුදා යළි කැඳවීමට එරට ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් තීරණය කර තිබේ. දැනට සිරියාව තුළ 2000ක් පමණ එක්සත් ජනපද හමුදාවක් සිටින අතර ඔවුන් කුර්දිස්ථාන් සටන්කාමීන්ට හා සිරියානු ප්‍රජාතන්ත්‍රවාදී හමුදා නම් සිරියානු ජනාධිපති අල් අසාද්ගේ පාලනයට එරෙහිව සටන් වදින හමුදාවන්ට සහාය ලබා දෙමින් සිටී.

එක්සත් ජනපදයේ මෙම තීරණය පිළිබඳව ඉරාකය, තුර්කිය සතුටට පත් වී සිටින අතර ඊශ්‍රායලයට ඉන් අවාසිදායක තත්වයක් වර්ධනය වී තිබේ. මේ නිසා කලාපය තුළ ඊශ්‍රායල මැදිහත්වීම් දුර්වලවීමට හෝ තම අවාසිදායක තත්වය මඟ හරවා ගැනීම සඳහා ඊශ්‍රයාලය විසින් ප්‍රහාර වැඩිකිරීමට ඉඩ ඇත.

කෙසේ වෙතත් මෙම තීරණයත් සමග තුර්කිය රුසියාවෙන් මිලදී ගැනීමට සිටි S- 400 මිසයිල ආරක්ෂක පද්ධතිය වෙනුවට එක්සත් ජනපදයෙන් පේට්‍රියට් මිසයිල මිලදී ගැනීමට තීරණය කර තිබේ.

## බංගලාදේශය: ෂෙයික් හසීනාට තෙවැනි වරත් ජය



බංගලාදේශයේ මහ මැතිවරණය දෙසැම්බර් 30 දිනට පවත්වන ලද මහ මැතිවරනයේදී වත්මන් අගමැති මෙයික් හසීනාගේ පාලක පක්ෂය සහ ඊට සහය දෙන කණ්ඩායම් විශාල ජයක් ලබා තිබේ. මෙම මැතිවරණයේදී ආසන 300ක් සඳහා නියෝජිතයින් තෝරා පත් කර ගැනීමට නියමිත වූ අතර එයින් ආසන 288ක ජය ඇයට සහය දෙන කණ්ඩායම් විසින් හිමිකර ගනු ලැබ ඇත. ඒ සඳහා අපේක්ෂකයින් 1861 ඉදිරිපත් විය.

ඒ අනුව 2009 වසරේ සිට ඇය අඛණ්ඩව තෙවැනි වරටත් අගමැති ධුරයට පත්වනු ඇති බවට විශ්වාස කෙරේ. කෙසේ වුවද විපක්ෂය චෝදනා කරන්නේ ආසන 300න් 221ක මැතිවරණ 'අක්‍රමිකතා' සිදුවී ඇති බවය. විපක්ෂ නායිකාව වූ කලිඩා ෂියා මේ වන විට දූෂණ චෝදනාවලට ලක්වී සිරගත වී සිටි බැවින් ඇයට මැතිවරණයට ඉදිරිපත් වීමට හැකියාවක් නොවීය.

# සමාජවාදය ගැන

# ඇල්බර්ට් අයින්ස්ටයින්

ඇල්බර්ට් අයින්ස්ටයින් විසින් මෙම ලිපිය ලියා ඇත්තේ 1951දී එක්සත් ජනපදයේ සමාජවාදී මාසික සඟරාවකටයි. සෝවියට් රුසියාව ඇතුළු සමාජවාදී කඳවුරට එරෙහිව සීතල යුද්ධය පවතිද්දී හා මැකාතිවාදය එක්සත් ජනපදය තුළ ජයග්‍රහණය කර තිබෙද්දී මෙතරම් ඍජු ලෙස ධනවාදය ප්‍රතික්ෂේප කරමින් සමාජවාදය ඇගයීමට ලක්කිරීමට තරම් ධෛර්යක් ඔහු සතුව පැවතීම අගය කළ යුතුය. මැකාතිවාදය යනු එක්සත් ජනපද සෙනෙට් සභික ජෝෂප් මැකාතිගේ නමින් හැඳින්වුණු සමාජවාදයට එරෙහි මතවාදයකි. ජෝෂප් මැකාති 1950 - 54 කාලයේදී සෙනෙට් සභිකයෙකුව සිටි අතර එක්සත් ජනපදයේ ආණ්ඩුවේ හා අනෙකුත් ආයතනවල සිටි පුද්ගලන් කොමියුනිස්ට්වාදීන් ලෙස හංවඩුගසා මේ කාලයේදී රැකියාවලින් පවා එළියට ඇද දමන ලදී. එබැවින් ඔහුගේ මෙම ලිපිය කියවිය යුත්තේ එකී වටපිටාවද සිත්හි තබාගනිමින් බව අපගේ අදහසයි.

අපි පළමුව විද්‍යාත්මක දැනුමේ කෝණයෙන් ප්‍රශ්නය විමසා බලමු. ආර්ථික විද්‍යාවේ හා තාරකා විද්‍යාවේ පරීක්ෂණ ක්‍රමවේදයන් අතර සැලකිය යුතු වෙනස්කම් ඇතැයි නොපෙනේ. ධාරා දෙකෙහිම විද්‍යාඥයන් කිසියම් සීමාසහිත සංකල්ප කණ්ඩායම් කිහිපයක් අතර ඇති අන්තර් සම්බන්ධය හැකි උපරිම ආකාරයෙන් තේරුනම් කිරීමට සමත් පොදු පිළිගැනීමක් සහිත නීති සොයා ගැනීමට උත්සාහ කරති. එහෙත් යථාර්ථයේදී එවැනි ක්‍රමවේදයන්ගේ වෙනස්කම් පවතී. වෙන වෙනම අගැයීමට ලක්කළ නොහැකි සාධක ගණනාවක් නිරීක්ෂණය කරනු ලැබූ ආර්ථික සංකල්ප මත බලපාන තත්වය විසින් ආර්ථික ක්ෂේත්‍රයේ පොදු නියාමයන් සොයා ගැනීම වඩාත් දුෂ්කර කරවයි. මීට අමතරව අප හොඳින් දන්නා පරිදි මානව ඉතිහාසයේ ඊනියා ශිෂ්ට යුගයේ පටන් රැස්කර ගත් අත්දැකීම් නිශ්චිතවම ආර්ථික නොවන සාධක විසින් සීමා කරවන අතර විශාල වශයෙන් බලපෑමට ලක් කරයි. උදාහරණයක් ලෙස විශාල රාජ්‍යයන් බොහොමයක ඉතිහාසය එහි යටත්විජිතයන්ගේ පැවැත්මට ණය ගැතිය. ආක්‍රමණික ජනතාව යටත් කරනු ලැබූ රටෙහි වරප්‍රසාද ලත් ජනතාව ලෙස නීතිමය වශයෙන් සහ ආර්ථිකමය වශයෙන් තහවුරු කරනු ලැබුණ ඔවුන්, ඔවුන් සඳහාම ඉඩම් අයිතියේ ඒකාධිකාරය අත්පත් කර ගත් අතර ඔවුන් අතරින් පූජක පැලැන්තියක් තෝරා ගනු ලැබිණි. පූජකවරුන් අධ්‍යාපනය පාලනය කිරීම මගින් සමාජයේ පන්ති බෙදීම ස්ථිර ආයතන බවට පත්කළ අතර එතැන් සිට ජනතාවට බොහෝ විට අවිඥානකවම, ඔවුන්ගේ සමාජ හැසිරීම පාලනය කර ගැනීමට වටිනාකම් පද්ධතියක්ද නිර්මාණය කර දුන්නේය.

නමුත් ඉතිහාසමය සම්ප්‍රදාය වන්නේ, එසේ කථා කරන්නේ නම්, ඊයේ මානව සමාජයේ කොල්ලකාරී යුගය ලෙස කෝර්ස්ටයින් වෙබ්ලේන් විසින් හැඳින්වූ යුගය ඇත්ත වශයෙන්ම අප තවමත් කොතැනකදීවත් අබිබවා ගොස් නැත. නිරීක්ෂණය කළ හැකි ආර්ථික දත්ත අයත් වන්නේ එකී යුගයටයි. එකී යුගයෙන් උකහා ගත හැකි එවැනි නියමයන් පවා අනෙකුත් යුගයන්ට යොදා ගත නොහැකිය. සමාජවාදයේ සැබෑ අරමුණ වන්නේ මානව සංවර්ධනයේ කොල්ලකාරී යුගය සැබෑ ලෙසම අභිබවා ඉන් ඉදිරියට ගමන් කිරීම බැවින් ආර්ථික විද්‍යාව හැකි වන්නේ සමාජවාදී සමාජයේ අනාගතය පිළිබඳව කුඩා එළියක් විහිදුවීමට පමණි.



දෙවැනිව, සමාජවාදය යොමුවී ඇත්තේ සමාජ - සදාචාරමය දිශාවටයි. කෙසේ වෙතත් විද්‍යාවට අවසානයක් නිර්මාණය කළ නොහැකිය. එවැන්නක් මනුෂ්‍ය වර්ගයා තුළ තහවුරු කළ හැක්කේ ඊටත් වඩා අඩුවෙනි. කිසියම් නිශ්චිත අවසානයක් කරා යා හැකි මාර්ගය සොයාදීම විද්‍යාවට කළ හැකි උපරිම දේ වන්නේය.

නමුත් අවසානය පිළිබඳ අදහස් පිළිසිඳ ගනුයේ අසස් සදාචාරවත්, පරමාදර්ශයන් සහිත පුද්ගලයන් තුළයි. අවසානය පිළිබඳ මෙම අදහස් උපතින්ම මියැදුණු ඒවා නොවේ. ඒවා අත්‍යාවශ්‍ය, ප්‍රබල අදහස්ය. බොහෝ මිනිසුන් විසින් මේවා සකස් කරනු ලදුව, අර්ධ වශයෙන් අවිඥානකව, ඉදිරියට ගෙනයනු ලබයි. සමාජයේ ක්‍රමික පරිණාමය එමගින් තීරණය කෙරේ.

මෙම හේතු නිසා එය මිනිස් වර්ගයාගේ ගැටලුවක් වූ කල අපගේ ආරක්ෂාව වෙනුවෙන්, විද්‍යාව හා විද්‍යාත්මක ක්‍රම අධිතක්සේරුවට ලක් නොකළ යුතුය. එසේම සමාජ සංවිධානය පිළිබඳ ප්‍රශ්නයකදී අදහස් දැක්වීමට අයිතිය ඇත්තේ විශේෂඥයන්ට ම පමණක් යැයි අප නොසිතිය යුතුය.

මැනිය නොහැකි තරම් පිරිසක් මේ මොහොතේ මානව සමාජය අර්බුදයක් හරහා ගමන් කරමින් සිටින බවත්, එහි ස්ථාවරභාවය බරපතළ ලෙස බිඳවට්ටවා ඇති බවත් කලක සිට අවධාරණය කර තිබේ. පුද්ගලයා ඔහු අයත් කණ්ඩායම ලොකු හෝ කුඩා වුවද, එය කෙරෙහි උදාසීන හෝ ඇතැම් විට සතුරු ආකල්පයන් පවා දැක්වීම මෙවැනි තත්වයකදී විශේෂයෙන් සිදුවේ. මා අදහස් කළ දේ වඩා පැහැදිලි කිරීමට පුද්ගලික අත්දැකීමක් සඳහන් කිරීමට ඉඩ දෙන්න. මම මෑතකදී බුද්ධිමත් හා සුහදශීලී පුද්ගලයෙකු සමග තවත් යුද්ධයක තර්ජනය පිළිබඳ සාකච්ඡා කළෙමි. එහිදී මගේ අදහස වූයේ යුද්ධයකදී මිනිස් වර්ගයාගේ පැවැත්ම පවා අනතුරේ හෙළනු ඇති බවයි. උපරි - ජාතික සංවිධිතයකට පමණක් එම අනතුරින් මිනිස් වර්ගයා ගලවා ගත හැකි බවත් එහිදී මම සඳහන් කළෙමි. එවිට එම පුද්ගලයා විසින් ඉතා සන්සුන්ව හා සාමකාමීව මෙසේ පවසනු ලැබුණි. "මිනිස් වර්ගයා, විනාශ වීම පිළිබඳ ඔබ මෙතරම් තදින් විරුද්ධ වන්නේ මන්ද?"

මීට ශත වර්ෂයකට අඩු කාලයකට ඉහතදී කිසිවෙකු මෙතරම් සැහැල්ලුවෙන්, මේ ආකාරයේ ප්‍රකාශයක් නොකරනු ඇති බව මට සහතිකය. එම ප්‍රකාශය තමන් තුළම සමතුලිතභාවය ඇතිකර ගැනීමට අසමත් වූ, සාර්ථකත්වය පිළිබඳ බලාපොරොත්තු අඩු වැඩි වශයෙන් අහිමි කරගත් පුද්ගලයෙකුගේය. එය මේ දිනවල බොහෝ මිනිසුන් අත්විඳින වේදනාකාරී තනිකමක හා හුදෙකලාවක ප්‍රකාශනයකි. ඊට හේතුව කුමක්ද? ඉන් මිදීමේ මඟක් තිබේද?

එවැනි ප්‍රශ්නයක් නැඟීම පහසුය. එහෙත් අවම සහතිකයක් හෝ සහිතව එවැන්නකට පිළිතුරු දීම අපහසුය. මට හැකි පමණින් ඊට පිළිතුරු දීමට උත්සාහ කරමි. එසේ වුවත් අපගේ හැඟීම් සහ උත්සාහයයන් නිතර ප්‍රතිවිරෝධී වන බවත්, ඒවා සඟවාලන බවත් සහ එය සරල හා පහසු සූත්‍රයකින් ඉදිරිපත් කළ නොහැකි බවත් මම හොඳින් දනිමි.

මිනිසා එක විට තනි හා සමාජයීය අයෙකි. තනි පුද්ගලයෙකු ලෙස ඔහු ඔහුගේ සමීපතමයන්ගේ හා තමාගේ පැවැත්ම ආරක්ෂා කරගැනීමටත්, තමාගේ පෞද්ගලික ආශාවන් තෘප්ත කර ගැනීමටත්, තමාගේ සහජ හැකියාවන් වර්ධනය කර ගැනීමටත් උත්සාහ කරයි. සමාජයීය සත්වයෙකු ලෙස ඔහු තම සහෝදර මිනිස් වර්ගයාගෙන් ආදරය හා පිළිග ැනීම අපේක්ෂා කරන අතර ඔවුන් සමග විනෝදය බෙදා ගැනීමටත් ඔවුන්ගේ දුකෙහිදී සහනයක් වීමටත්, ඔවුන්ගේ ජීවන තත්වය උසස් කිරීමටත් කටයුතු කරයි. විවිධත්වයෙන් යුක්ත, නිතර ගැටෙන්නා වූ මෙම උත්සාහයන්ගේ පැවැත්ම මිනිසාගේ විශේෂිත ස්වභාවයට එකම හේතුවයි. මෙම එක් එක් සාධකයන්ගේ (එනම් පුද්ගලික හා සමාජයිය සාධක පරිවර්තන) සාපේක්ෂ ප්‍රබල බව ප්‍රාවේණික වශයෙන් උරුම වේ. නමුත් අවසානාත්මකව මතුවන පෞරුෂත්වය ප්‍රධාන වශයෙන් හැඩ ගස්වනු ලබන්නේ, සිය සංවර්ධනයේදී මිනිසාට ජීවත්වීමට සිදුවන පරිසරය මගිනි. ඔහු වර්ධනය වන සමාජයේ ව්‍යුහය මගිනි. එකී සමාජයේ සම්ප්‍රදායන් මගිනි. එකී සමාජයේ විසින් අගය කරනු ලබන හැසිරීම් රටාව මගිනි. කිසියම් පුද්ගලයෙකුට 'සමාජය' නමැති අමූර්ත සංකල්පය විසින් අදහස් කෙරෙන්නේ පෙර පරම්පරාවන්ගේ සියලු මිනිසුන් සමග සිය සමකාලීනයන් සමග ඔහුගේ ඍජු හා වක්‍ර සම්බන්ධතාවන්ගේ සමස්ත එකතුව ලෙසිනි. පුද්ගලයෙකුට තනිවම සිතීමට, හැඟීමට, වෙර දැරීමට, සහ වැඩ කිරීමට පුළුවන. නමුත් එහිදී ඔහු -ඔහුගේ ශාරීරික, බුද්ධිමත් හැඟීම්වල පැවැත්ම මගින්- විශාල වශයෙන් සමාජය මත යැපේ. එබැවින් සමාජමය සැකැස්මෙන් පරිබාහිරව එකී පුද්ගලයා ගැන සිතීමට හා ඔහු තේරුම් ගැනීමට අපහසුය. මිනිසාට ආහාර, ඇඳුම්, පැළඳුම්, නිවාස වැඩ කිරීමට අවශ්‍ය උපකරණ, භාෂාව, චින්තන විධිය, චින්තනයේ අඩංගුව, ආදිය ලබා දෙන්නේ සමාජය විසිනි. ඔහුගේ ජීවිතය ශ්‍රමය විසින් සහ 'සමාජය' යන වචනය පිටුපස සැඟවී තිබෙන අතීත හා වර්තමාන මිලියන ගණනක්ගේ ජයග්‍රහණයන් විසින් ගොඩනගනු ලබයි.

එම නිසා කුහුඹින්ට හා මී මැස්සන්ට මෙන් පුද්ගලයෙකු සමාජය මත යැපෙන්නේය යන්න ප්‍රතික්ෂේප කළ නොහැකි ස්වභාවධාර්මික සත්‍යයකි. කෙසේ වෙතත් කුහුඹින්ගේ හා මී මැස්සන්ගේ සමස්ත ජීවන ක්‍රියාවලියේ ඉතා කුඩා තොරතුරු පවා දැඩි ප්‍රවේණික සහ ජානයන් මගින් නිශ්චිත කර තිබුණද මිනිසාගේ සමාජ ක්‍රියාකාරිත්වය සහ සමාජ රටාව විවිධත්වයෙන් යුක්ත වන අතර වෙනස්වීම්වලට ගෝචර වේ. මුවෙන් සන්නිවේදනය කර ගැනීමේ හැකියාව විසින් ත්‍යාග කොට ඇති මතකය, නව සංයෝගයන් සෑදීමට ඇති ධාරිතාව ජීව විද්‍යාත්මක අවශ්‍යතාවන් මගින් සීමා නොකෙරෙන සංවර්ධනයක් අත්පත් කර ගැනීමට හැකියාව ලබා දී තිබේ. මෙම සංවර්ධනයන් සම්ප්‍රදායය, ආයතන, සහ සංවිධාන හරහාත්, සාහිත්‍යයේ, විද්‍යාවේ, ඉංජිනේරු ක්ෂේත්‍රයේ හා කලාත්මක ක්ෂේත්‍රයේ ජයග්‍රහණ හරහාත් ප්‍රකාශයට පත්වේ. එය සිදුවනනේ කෙසේද යන්න හා කිසියම් දුරකට මිනිසාට තමාගේ ජීවිතයට තමා විසින්ම බලපෑම් කරගත හැකිය යන්නත් මෙම ක්‍රියාවලියේදී සවිඥානක චින්තනයට හා වුවමනාවට කාර්යභාරයක් කළ හැකිය යන්නත් මෙමගින් පෙන්වා දෙයි.

අප වෙනස් කළ නොහැකියයි හා නිශ්චිත යැයි සිතන මිනිස් වර්ගයාගේ අනන්‍ය ස්වභාවික ආශාවන්ද ඇතුළු ජීව විද්‍යාත්මක සැකැස්ම ප්‍රවේණික වශයෙන් මිනිසා උපතේදී අත්කර ගනී. මීට අමතරව සන්නිවේදනය මගින් සහ වෙනත් බලපෑම් ආකාර මගින් සකස්කර ගනු ලබන සංස්කෘතික සැකැස්ම ඔහු සිය ජීවිත කාලය තුළදී අත්පත් කර ගනී. කාලයත් සමග මෙම සංස්කෘතික සැකැස්ම වෙනස්වීමට නියමිතය. එම වෙනස්වීම්වල ස්වභාවය ප්‍රධාන වශයෙන් තීරණය කරනු ලබන්නේ පුද්ගලයා හා සමාජය අතර සම්බන්ධතාව විසිනි. සමාජයේ අධිකාරිත්වය දරන සමාජ සංවිධාන ආකාරයන් හා සංස්කෘතික රටාවන් මත යැපෙමින් මානව වර්ගයාගේ සමාජයීය හැසිරීම් විශාල වශයෙන් වෙනස් විය හැකි යයි ඊනියා ප්‍රාථමික සංස්කෘතීන්ගේ සංසන්දනාත්මක පරීක්ෂා කර බැලීම් මගින් නූතන මානව විද්‍යාව අපට උගන්වා ඇත. මිනිස් වර්ගයාගේ තත්වය උසස් කිරීමට අරගල කරන්නාවූ බොහෝ දෙනෙකු බලාපොරොත්තු අත්හැර ගන්නේ මේ නිසාය. මිනිස් වර්ගයා ඔවුන්ගේ ජීව විද්‍යාත්මක සැකැස්ම හේතුවෙන් ගර්භාවට ලක් විය යුතු නැත; එකිනෙකා සමූල ඝතනය කර ගත යුතු නැත. කෲරත්වයේ අනුකම්පාවට ලක්ව තමා විසින් ම සාදාගත් ඉරණමකට ගොදුරු විය යුතු නැත.

අපේ කාලයේ අර්බුදය සංයුක්තවී ඇත්තේ කුමකින්ද යන්න කෙටියෙන් පැහැදිලි කිරීමේ අවස්ථාව වෙත මම දැන් පැමිණ සිටිමි. ඉන් පුද්ගලයා, සමාජයට ඇති සබඳතාව පිළිබඳ සලකා බැලේ. පුද්ගලයා වෙන කවරදාකටත් වැඩියෙන් සමාජය මත තමාගේ යැපීම පිළිබඳ දැනුවත්භාවයකට පැමිණ ඇත. නමුත් ඔහු එකී යැපීම ධනාත්මක දෙයක් ලෙස නොසලකයි. එහි ඓන්ද්‍රීය බැඳීමක් සේ නොසලකයි: එය ආරක්ෂිත බලයක් ලෙස නොසලකයි. නමුත් ඒ වෙනුවට එය තමාගේ ස්වභාවික අයිතීන්ට තර්ජනයක් සේ සලකයි. නැතිනම් අඩු ගණනේ එය තමාගේ ආර්ථික පැවැත්මට තර්ජනයක් සේ සලකයි. තවද සමාජය තුළ පුද්ගලයා දරන තැන විසින් ඔහු තුළ ස්වභාවයෙන් ඇති සමාජයීය ගුණාංග ක්‍රම ක්‍රමයෙන් විනාශ වී යයි. සමාජය තුළ ඔහුගේ තත්වය කුමක් වුවද සියලු මිනිසුන් මෙම විනාශ වී යාමේ ක්‍රියාවලියෙන් පෙලෙමින් සිටී. ඔවුන්ගේ ආත්මාර්ථකාමිත්වය තුළ නොදැනීම සිරකරුවන් බවට පත් වූ ඔවුන්ට තනිකම, අනාරක්ෂාව, දැනෙන්නට ගනී. සරල, බුද්ධිමත් හා සුබෝපභෝගී නොවූ සතුට ඔවුන් කෙරෙන් පලායයි. මිනිසාට තම කෙටිකාලීන හා අනතුරුදායක ජීවිතයේ අරමුණු සොයා ගත හැක්කේ සමාජය වෙනුවෙන් කැපවීමෙන් පමණි.

මගේ අදහසට අනුව අද පවතින ධනවාදී සමාජයේ ආර්ථික අරාජිකත්වය මෙකී විනාශයේ උල්පතයි. අපි අප ඉදිරියේ නිෂ්පාදකයන්ගේ දැවැන්ත සමාජයක් දකිමු. එහි සාමාජිකයින් ඔවුන්ගේ සාමූහික ශ්‍රමයේ ඵල බලහත්කාරයෙන් නොව නීතිමය වශයෙන් ස්ථාපිත කරන ලද දෙයට විශ්වාසනීය අනුකූලතාවයකින් යුතුව එකිනෙකාගෙන් ඉවත් කිරීමට අඛණ්ඩ වෙහෙසක් දරමින් සිටී. නිෂ්පාදන මාධ්‍යයන්ගේ අතිමහත් බහුතරය තවදුරටත් කියන්නේ නම් අමතර ප්‍රාග්ධන භාණ්ඩ මෙන්ම පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනයට අවශ්‍ය සමස්ත නිෂ්පාදන ධාරිතාවම නීතිමය වශයෙන් පුද්ගලයන්ගේ පුද්ගලික දේපළක් ලෙස පවතින බව මෙහිදී තේරුම් ගැනීම වැදගත්ය.

එම වචනයේ සම්ප්‍රදායික තේරුමට සර්වසම නොවෙතත් සරලභාවයේ නාමයෙන් මෙම සාකච්ඡාවේදී මම 'කම්කරුවන්' ලෙස හඳුන්වන්නේ නිෂ්පාදන මාධ්‍යයන්ගේ හිමිකාරිත්වය නැති අයවයි. නිෂ්පාදන මාධ්‍යයන්ගේ හිමිකරු කම්කරුවාගේ ශ්‍රම ශක්තිය මිලදී ගැනීමේ හැකියාව සහිතව සිටී. නිෂ්පාදන මාධ්‍යයන් භාවිතයෙන් කම්කරුවා ධනපතියාගේ දේපළක් බවට පත්වන නව භාණ්ඩ

15 වැනි පිටුවට

> "මෙම මහා ව්‍යසනයන්ගෙන් මිදීමට ඇත්තේ එක් මඟක් පමණක් බව මට තහවුරු වී තිබේ. එනම් සමාජීය අරමුණු වෙනුවෙන් යොමු වූ අධ්‍යාපන ක්‍රමයක් සමග සමාජවාදී ආර්ථිකයක් ස්ථාපිත කිරීමයි. එවැනි ආර්ථිකයකදී නිෂ්පාදන මාධ්‍යයන් සමාජ අයිතියේ පැවතිය යුතු අතර පරිභෝජනය සැලසුම්ගත ආකාරයෙන් සිදුකළ යුතුය. සමාජයේ අවශ්‍යතාවන් අනුව නිෂ්පාදනය හැඩගස්වනු ලබන සැලසුම්ගත ආර්ථිකයක් වැඩ කළ හැකි සියලු දෙනා අතර වැඩ බෙදා දෙනු ලබන අතර සෑම ළමයෙකුටම, කාන්තාවකටම, හා සෑම පුද්ගලයෙකුටම ජීවිකාව සහතික කරනු ඇත. "



# පැතුම් ඉටුවන නව වසරක්...

ආරම්භ වී ඇත්තේ නව වසරකි. වසරක් ආරම්භ වීමේදී සෑම කෙනෙක්ම අලුත් බලාපොරොත්තුවලින් හිත් පුරවා ගනී. බලාපොරොත්තු තබා ගැනීමේ අරමුණ වන්නේ ජීවිතයට අලුතින් යම් දෙයක් ළඟාකර ගැනීමය. එසේ නැතහොත් තිබෙන දෙයක් තවත් වර්ධනය කර ගැනීමය. එනිසා බලාපොරොත්තු තබා ගැනීම හොඳ දෙයකි.

ගෙවී ගිය වසර ආරම්භයේදීත් බලාපොරොත්තුවලින් හිත් පුරවා ගත් ආකාරය ඔබට මතක ඇති. බලාපොරොත්තු තබා ගැනීම සේම, ඒ බලාපොරොත්තු ඉටු වුවාද නොවුවද යන්න සොයා බැලීමද වැදගත් දෙයකි.

සෑම ගැහැණු ළමයෙක්ම, ගෘහණියක්ම තුළ එක් බලාපොරොත්තුවක් හෝ බලාපොරොත්තු ගොන්නක් තිබිය හැකිය. මීට වඩා යහපත් සමාජයක, හොඳ පරිසරයක ජීවත් වීමේ බලාපොරොත්තුව, තම සුදුසුකම්වලට අනුව රැකියාවක් කිරීමේ, ඒ රැකියාවේ ඉදිරියට යාමේ බලාපොරොත්තුව, පවුලේ ආර්ථිකය ශක්තිමත් කර ගැනීමේ මෙන්ම සෑමට පෝෂණීය ආහාර වේලක් ලබා ගැනීමේ අරමුණ, ලෙඩ දුක් වළක්වා ගැනීමේත් ලෙඩදුක්වලට හොඳම පහසුකම් සහිත රෝහලකින් ප්‍රතිකාර ලබාගැනීමේත් බලාපොරොත්තුව, තමන්ගේ දරුවන්ට හොඳම පාසලකින් අධ්‍යාපනය ලබා දීමේ බලාපොරොත්තුව, තම පවුලේ අය සමඟ මසකට වරක් හෝ නිවාඩුවක් ගත කිරීමේ, විනෝද වීමේ බලාපොරොත්තුව ආදී වශයෙන් වූ සිහින රැසක් තිබෙන්නට පුළුවන.

මේ සියල්ල ගත් කළ යහපත් දියුණු සමාජයකදී අත්පත් කර ගැනීමට ලැබෙන දේවල්ය. සමාජවාදී රාජ්‍යයන් තුළ මිනිසුන්ව සූරාකෑමෙන් තොරව ලැබෙන දේවල්ය. ඒ තුළින් වඩාත් යහපත් මිනිසෙකු බිහි වෙයි. එහෙත් මෙරටදී ඒවා අපේ ජීවිතවලට වඩාත් දුරින්, ළඟා කර ගැනීමට දුෂ්කර දේවල් සේ පවතී. එබැවින් ඒවා බලාපොරොත්තු ලෙසින් අප සිත් තුළ පැළපදියම් වී ඇත.

අප ජීවත් වන්නේ මානව හිමිකම් සුරැකෙන; කාන්තා අයිතීන් සුරැකෙන සමාජයක නොවේ. අපරාධ, වංචා දූෂණ ක්‍රමයෙන් වැඩි වන, කාන්තා හිංසනය, අපචාර වැඩි වන සමාජයකය. රැකියාවක් ලබා ගැනීම දුෂ්කර වූ, ආර්ථිකය කඩා වැටෙන, ණය ගැනීම හැර වෙනත් විකල්ප තේරීමට අසමත් වූ, ඉතාම කුඩා නිෂ්පාදන ආර්ථිකයක් සහිත රටකය. මිනිසුන්ගේ ක්‍රය ශක්තිය (භාණ්ඩ මිලදී ගැනීමේ හැකියාව) අඩු රටකය. ළමුන්ගෙන් 52%කට, ගර්භනී මවුවරුන් ගෙන් සැලකිය යුතු පිරිසක් මන්ද පෝෂණයෙන් පෙළෙන, පෝෂණීය ආහාර වේල සිහිනයක් වූ රටකය. ඇතැම් සෞඛ්‍ය පරීක්ෂණ, බෙහෙත් පවා පුද්ගලික ස්ථානවලින් මුදල් දී ලබා ගැනීමට, සිදුව ඇති "නිදහස්" සෞඛ්‍ය සේවයක් පවතින රටකය. අධ්‍යාපනයෙහි සියලු බර දෙමාපියන් මත පැටවී ඇති "නිදහස්" අධ්‍යාපනයක් පවතින රටකය. පවුලේ අය සමඟ විනෝද වීමට මුදල් හා කාලය සොයා ගැනීම දුෂ්කර වූ රටකය.

මෙවැනි සමාජයක් තුළින් බිහි වෙන්නේ කෙබදු පුද්ගලයන්ද? රළු, ආත්මාර්ථකාමී, යහපත් මානව ගුණාංගවලින් ඈත් වූ පුද්ගලයින් නොවේද? එවන් සමාජයක් තුළ අපරාධ, වංචා දූෂණ, හොර මැරකම් වර්ධනය වීම, කාන්තා හිංසන, අපචාර වර්ධනය වීම පුදුමයක් නොවේ. ජීවන වියදමට සරිලන ආදායමක් නොමැති ජනතාවක් වෙසෙන රටක මන්ද පෝෂණය වැඩි වීමද, රෝගී ජනතාව වැඩි වීමද පුදුමයක් නොවේ. මුදල් නොමැතිකම මෙන්ම විධිමත් සැලසුම් හා වැඩපිළිවෙළක් නොමැතිකම නිසා අධ්‍යාපනය අතරමගදී කඩා වැටෙන පිරිසගේ ප්‍රමාණය ඉහළ යාම සම්බන්ධයෙන්ද අප පුදුම විය යුතු නැත.

කෙටියෙන් පවසතොත් එවැනි සමාජයක දැකිය හැකිවන්නේ ආර්ථික, සමාජීය, දේශපාලන, සංස්කෘතික වශයෙන් පිරිහුණු, පසුගාමී මිනිසුන්ය.

ඉදින්, මෙවැනි පසුබිමක් තුළ වුවද අප බලාපොරොත්තු අත්හැර නොගත යුතුය. අප තේරුම් ගත යුතු වැදගත් කරුණක් වන්නේ අපේ බලාපොරොත්තු ඉටු වන්නේ කුමන ආකාරයේ සමාජයක් තුළද යන්නයි. එය හොඳින් තේරුම් ගෙන එවැනි සමාජයක් බිහි කිරීම වෙනුවෙන් පෙළගැසීම අද දවසේ අපේ කාර්යභාරය වනු ඇත. එම කාර්යභාරය, වගකීම අත්හැර බලාපොරොත්තු පමණක් දල්වා ගන්නේ නම් අපේ බලාපොරොත්තු හුදු සිහින ලෙසින්ම ඊළඟ වසරේදීත් පවතිනු ඇත.



## හිනා කැන්දමු අලුත් වසරක...!

කටු පඳුරු මත පිපුණු
මල් නොමැත නපුරු
හැමදාම ආවත්
අවුරුද්ද නැත සොඳුරු

අත්නොහැර පුරුදු
ගෙවුණත් ලෙසට සුපුරුදු
අලුත් කිවු නමුදු
පරණමය හැම අවුරුදු

කටුක දුක් රුදුරු
ගෙනාවත් සිහින නපුරු
පුංචි මිදුලක නැත
ඉදිවුණේ මැදුරු

නෙතින් එන කඳුළු
තනයි නම් ගිනිපුපුරු
සිනාවක් ගෙනෙමු
අලුත් වසරක නුදුරු



## සිව්දෙසින්

### හිමාලයේ 'සුපර් වුමන්'...



ගැබිණි මව්වරුන් 100කට ආසන්න ප්‍රමාණයකගේ 'වින්නඹු මාතාව' ලෙස කටයුතු කර ඇති කාන්තාවක් පිළිබඳ පාකිස්ථානයේ හිමාලය ප්‍රදේශයෙන් වාර්තා වේ.

ෂබානෝ නම් මෙම කාන්තාව, ඇගේ පළමු දරුවා බිහි කරන්නේද පවුල් සෞඛ්‍ය සේවිකාවකගේ සහාය නොමැතිවය. විලිරුදාවෙන් දවස් දෙක තුනක් වේදනා විඳිමින් සිටින මොහොතේදී දරු ප්‍රසූතියෙන් පසුව ඇය පවුල් සෞඛ්‍ය සේවිකාවක් ලෙස පුහුණු වීමට සිතාගත් බව පවසයි.

ඉතා දුෂ්කර ප්‍රදේශයක් වූ හිමාලයේ ගමින් ගමට යමින් ඇය මේ දක්වාම සේවය කරන්නේ කිසිඳු මුදලක් අය නොකරමින් බවද වාර්තා වේ. කෙසේ වෙතත් පාකිස්ථාන ආණ්ඩුව මෑතකදී ඇයට වැටුපක් ලබා දී ඇතැයිද පැවසේ.

පාකිස්ථානයේ නිල වාර්තාවලට අනුව දැක්වෙන්නේ, ගැබිණි මව්වරුන් ගෙන් අඩකටත් වඩා වැඩි ප්‍රමාණයකට පවුල් සෞඛ්‍ය සේවිකාවන්ගේ සහාය නොලැබෙන බවත් විශේෂයෙන් ප්‍රවාහන පහසුකම් අඩු දුෂ්කර කලාපයක් වූ හිමාලය ප්‍රදේශයේ ගැබිණි මව්වරුන් බහුතරය දරුවන් ප්‍රසූත කරන්නේ පවුල් සෞඛ්‍ය සේවිකාවන්ගේ සහාය නොමැතිව බවත්ය.

ඉතිහාසයේ කතාව... 05

# ඉතිහාසයේ පළමු සමාජ පරිවර්තනය





"ගෘහය තුළ පුරුෂයා අධිපති බව අත් කර ගැනීම නිසා ඔහුගේ ස්වාධිපත්‍යයට තිබූ අවසාන අවහිරයද නැතිව ගියේය. මව් අයිතිය අහෝසිකර දැමීමද, පිය අයිතිය ඉදිරිපත් කිරීමද, යුගලන පවුලේ සිට ඒක භාර්යා වෘතය දක්වා ක්‍රම ක්‍රමයෙන් පරිවර්තනය වීමද නිසා මේ ස්වාධිපත්‍යය ස්ථිර වූ අතර එය චිරස්ථායී විය. පැරණි වංශ පිළිවෙත මේ නිසා උල්ලංඝනය වූ අතර ඒක භාර්යා වෘතය සහිත පවුල වංශයට තර්ජනය කරන බලයක් මෙන් නැගී සිටියේය."

**ෆෙඩ්රික් එංගල්ස්**
**පවුල පෞද්ගලික දේපළ හා රජය ඇතිවූ සැටි, 163වැනි පිටුව**

මානව වර්ගයාගේ ඓතිහාසික ගමන්මගේ ප්‍රථම සමාජ සංවිධානය වූ ප්‍රාථමික සාමූහික සමාජය බිඳ දමමින් ඊළඟට පැන නගින සමාජ ක්‍රමය පෞද්ගලික දේපළ මත පදනම් වූ පංති සහිත සමාජ ක්‍රමයක් විය. යුරෝපයේ හා සමහර ආසියාතික රටවල මෙය වහල් හිමි සමාජය ලෙස මතු වූ අතර ආසියාවේ (ලංකාව ඇතුළු) සමහර රටවලදී එය ආසියාතික නිෂ්පාදන රටාව ලෙස හඳුනා ගන්නා ලදී.

මානව සමාජයේ ගමන්මගේ සිදුවූ බරපතළම හා තීරණාත්මක ප්‍රථම පරිවර්තනය වූයේ මෙයය. මේ සමග එතෙක් පැවති සරල සාමූහික සමාජය වෙනුවට විවිධ ප්‍රතිවිරෝධතා ඇති සංකීර්ණ සමාජයක් නිර්මාණය විය. එම පරිවර්තනයත් සමග සමාජය තුළ සිදු වූ වෙනස්කම් අතර ප්‍රධාන වෙනස්කම් වූයේ පෞද්ගලික දේපළ බිහිවීම, ඒ මත පදනම්ව පංති බිහිවීම (ප්‍රථම ප්‍රධාන පංති දෙක වූයේ වහල් හිමියා හා වහලාය) පංති අතර ප්‍රතිවිරෝධය හා ඒ අනුව රජය නම් බලහත්කාරී ආයතනය බිහිවීම, දේශපාලනය නීතිය වැනි සංකල්ප ඇතිවීම, පවුල නම් ඒකකය බිහිවීම ආදිය වේ. පොදුවේ ගත් කල පොහොසතුන් හා දුප්පතුන් ලෙසද පීඩකයන් හා පීඩිතයන් ලෙසද බලය හොබවන්නන් හා ඊට යටත්වන්නන් ලෙසද සමාජය ප්‍රතිවිරෝධී ප්‍රධාන කණ්ඩායම් දෙකකට බෙදනු ලැබුවේත්, සූරාකෑම - ලාභ ලැබීම, යන සංකල්ප උපත ලැබුවේත් යුද ගැටුම්, කෝලාහල හා ලෝක යුද්ධ සඳහා මඟ සකස්කරනු ලැබුවේත් මෙම සමාජ පරිවර්තනය තුළ සිදුවූ වෙනස්කම් නිසාය.

## පංති බිහිවූ හැටි

පැවති සරල සාමූහික සමාජය බිඳවැටී පංති සමාජයේ පැන නැගීම පුද්ගල කැමැත්තක ප්‍රතිඵලයක් නොවේ. එය කිසිවකුගේ ද්‍රෝහීකමක හෝ හිතුවක්කාරකමක ප්‍රතිඵලයක්ද නොවේ. නරක මිනිසුන්ගේ නරක සිතුවිලි නිසා ඇතිවූවක්ද නොවේ. මෙය ඉතා පැහැදිලිවම නිෂ්පාදන උපකරණයන්ගේ සංවර්ධනය විසින් නිෂ්පාදනයේ සිදුකරනු ලැබූ වෙනස්කම් මගින් නිර්මාණය වූවකි. අප මෙය නිතර අවධාරණය කරන්නේ, ඉතිහාසයේ ගමන්මඟ තුළ නිෂ්පාදන උපකරණ හා නිෂ්පාදන ක්‍රම විසින් කරනු ලබන බලපෑම විශාල බවත් මිනිසාගේ හා සමාජයේ හැසිරීම් පවා ඒ මගින් තීරණය කරනු ලබන බවත් වටහාගත යුතු නිසාය.

ප්‍රාථමික සමාජයේ සූරාකෑම නොවූයෙත් පංති නොපැවතුණේත් මිනිසුන් සවිඥානිකව එවැන්නක් ප්‍රතික්ෂේප කළ නිසා නොව එකී සමාජයේ පැවති නිෂ්පාදන තත්වය එවැන්නකට ඉඩ සලසා නොතිබූ නිසාය. ප්‍රාථමික මානව සමාජය සූරාකෑම, පංති, රජය වැනි සංකල්ප දැන තිබුණේද නැත. ඒ එවැනි දේ දැන ගැනීමේ මඟක් හෝ අත්දැකීමක් ඉන් පෙර නොවූ නිසාය. ප්‍රාථමික සමාජයේ බිඳවැටීම සනිටුහන් කළ ප්‍රධාන සාධකය වූයේ නිෂ්පාදනයේ සිදුවූ වෙනස්කම්ය. නිෂ්පාදන උපකරණවල සිදුවූ වර්ධනයන්ය.

## පෞද්ගලික දේපළ ඇතිවීම

මානව සමාජයේ පංති බිහිවීමේදී එකී පංති බිහිවීමේ පදනම වූයේ පෞද්ගලික දේපළය. අද මෙන්ම එදාත් පංති අතර වෙනස්කම් තීරණය වූයේ දේපළ ඇති හා දේපළ නැති යන අර්ථයෙනි. අපගේ අවධානය මෙහිදී යොමුකළ යුත්තේ දේපළ පොදුවේ පාවිච්චි කළ සමාජයක් තුළින් පෞද්ගලික දේපළ සහිත සමාජයක් මතුවූයේ කෙසේද යන්න පිළිබඳවය.

ප්‍රාථමික සාමූහික ක්‍රමය තුළ තිබූ විශේෂය වූයේ (එය මිනිසාගේ පළමු සමාජය නිසා) නිෂ්පාදන උපකරණ ඉතාම නොදියුණු වීමය. ආරම්භයේදී එය මුගුරක් හෝ සත්ව ඇට කටුවක් විය. එවිට නිෂ්පාදිතයද ඉතාම කුඩාය. එය ජීවත්වීමට තරම්වත් ප්‍රමාණවත් නොවේ. පසුව මෙය හෙල්ල හා පොල්ල දක්වා වර්ධනය වුවද නිෂ්පාදිතයේ විශාල වෙනසක් වූයේ නැත. මේ නිසාම නිෂ්පාදනය, එනම් සතෙකු මරා ගැනීම, මසුන් අල්ලා ගැනීම, අලයක් හාරා ගැනීම තනිව කළ නොහැකි විය. ඊට සාමූහික මැදිහත්වීමක් අවශ්‍ය විය. ඒ නිසාම ගෝත්‍රයේ හා ගණයේ සියලු දෙනාගේ පැවැත්ම සියලු දෙනාට අවශ්‍ය විය. හැම දෙනාම ජීවත්විය යුතු නිසා උපයාගත් නිෂ්පාදනය සියලු දෙනා සාමූහිකව පරිහරණය කළෝය. 'කෙනෙකුගේ ශ්‍රමයේ ඵලය කොල්ලකෑමට' තවෙකෙකු හට නොහැකි විය. ඒ, මුල් කාලීන නිෂ්පාදනය තුළ 'අතිරික්තයක්' නොවූ නිසාය. එබැවින් ප්‍රාථමික සමාජය සූරාකෑමෙන් තොර වූයේ අන් අයගේ ශ්‍රමයේ ඵලයේ සූරාකෑමට තරම් යමක් ශ්‍රමය විසින් නිෂ්පාදනය නොකළ නිසාය. නිෂ්පාදන උපකරණ ඉතාම නොදියුණු වූ නිසාය.

> "ප්‍රාථමික සමාජයේ සූරාකෑම නොවූයෙත් පංති නොපැවතුණේත් මිනිසුන් සවිඥානිකව එවැන්නක් ප්‍රතික්ෂේප කළ නිසා නොව එකී සමාජයේ පැවති නිෂ්පාදන තත්වය එවැන්නකට ඉඩ සලසා නොතිබූ නිසාය. ප්‍රාථමික මානව සමාජය සූරාකෑම, පංති, රජය වැනි සංකල්ප දැන තිබුණේද නැත. ඒ එවැනි දේ දැන ගැනීමේ මඟක් හෝ අත්දැකීමක් ඉන් පෙර නොවූ නිසාය. ප්‍රාථමික සමාජයේ බිඳවැටීම සනිටුහන් කළ ප්‍රධාන සාධකය වූයේ නිෂ්පාදනයේ සිදුවූ වෙනස්කම්ය. නිෂ්පාදන උපකරණවල සිදුවූ වර්ධනයන්ය."

එහෙත් වසර දස දහස් ගණනක් ගතවෙද්දී මේ තත්වයන් ක්‍රමානුකූලව වෙනස් විය. නිෂ්පාදන උපකරණ දියුණු වන්නට විය. ඒ සමග නිෂ්පාදිතයන්ද වැඩි විය. මෙහිදී එංගල්ස් විසින් මෙම ප්‍රාථමික සමාජය ම්ලේච්ඡත්වය හා අශිෂ්ටත්වය ලෙස යුග දෙකකට බෙදනු ලබන අතර ඒ ඒ අවධියද පහළ, මැද, ඉහළ ලෙස උප අවධීන්ට බෙදා විස්තර කරයි. එහිදී එම අවධි බෙදීම සඳහා ඔවුන් පදනම ලෙස යොදා ගත්තේ නිෂ්පාදන ක්‍රමවල ඇතිවූ වර්ධනයයි.

## දුන්න හා ඊතලය

ප්‍රාථමික සමාජයේ එක්තරා අවධියකදී මිනිසා විසින් දුන්න හා ඊය නිපදවා ගන්නා ලදී. මෙය වසර දහස් ගණනක අත්දැකීම් අනුව නිර්මාණය කරගත් සංකීර්ණ අවියක් විය. මේ සමග සතුන් මරා ගැනීම තරමක් පහසු වූ අතර එමගින් නිෂ්පාදනය ඉහළ ගියේය. ඒ අතර සතුන් දඩයම් කරමින් තැනින් තැනට යමින් සංචාරක ජීවිතයක් ගත කළ මිනිසුන් එක් තැනක ස්ථිර පදිංචිකරුවන්ගේ තත්වයට පත්විය. ඒ සතුන් ඇතිකිරීම ආරම්භ කිරීමත් සමගය. සතුන් ඇතිකිරීම හා සත්ව පාලනය නිසා ගෝත්‍රයේ නිෂ්පාදිතයන්ගේ ප්‍රමාණය ඉහළ ගියේය. සත්ව පාලනය ආරම්භ කළ මිනිසා ඒ සමගම ධාන්‍ය වගාවද ආරම්භ කර තිබේ. එංගල්ස් පවසන පරිදි එකල මිනිසා මුලින්ම ධාන්‍ය වගාකර ඇත්තේ සතුන්ට ආහාර පිණිසය. පසුව එය මිනිසාගේද ආහාර බවට පත්විය. මේ කාලයේ ලෝකඩ සොයා ගැනීමත් සමග ලෝකඩ පොරව, නගුල ආදියද බිහිවිය. ඒ අනුව ප්‍රාථමික සමාජයේ අවසාන කාලය වනවිට නිෂ්පාදන උපකරණ සංවර්ධනය වීමත් (දුන්න හා ඊය, පොරව, නගුල) නිෂ්පාදනය ඉහළ යාමක් සිදුවිය. එහි ප්‍රතිඵලය වූයේ ගෝත්‍රයක් සතුව සත්ව රංචුවක් හා ගොවිපළක් නිර්මාණය වීමය. එහි මස්, ලොම්, හම්, කිරි ආදියද ධාන්‍ය, එළවළු, පලතුරු ආදියද විය. මේ සමග මිනිසාගේ ශ්‍රමයට ඔහුගේ යැපීමට අවශ්‍ය ප්‍රමාණයට වඩා නිපදවීමේ හැකියාව ඇතිවිය. එය ඇතිවූයේ නිෂ්පාදන උපකරණවල දියුණුව නිසාය. එවිට මිනිසාගේ ජීවත්වීමට අත්‍යාවශ්‍ය ප්‍රමාණයට වඩා ඔහුගේ ශ්‍රමය විසින් නිෂ්පාදනය කරන ලද ප්‍රමාණය හෙවත් අතිරික්ත නිෂ්පාදනය සමාජය තුළ බිහිවිය. මෙම අතිරික්තයන් පාවිච්චි කරමින් වැඩ නොකර සිටීමේ ඉඩක් මේ අනුව තවත් පිරිසකට ඇතිවිය. ප්‍රාථමික සමාජය තුළ තිබූ පොදු දේපළ පෞද්ගලික දේපළ බවට පත්වූයේ මේ සමගය. සූරාකෑමට හැකි තරම් නිපදවීමට ප්‍රමාණවත් දියුණුවක් නිෂ්පාදන උපකරණවල ඇතිවූ විට එම තත්වය තුළ සූරාකෑම ආරම්භ විය.

## ගෘහමය වහල්භාවයේ සිට

ප්‍රාථමික සමාජයේ අවසාන කාලයේ දේපළ වර්ධනය වීමත් සූරාකෑමට හැකියාව ඇතිවීමත් සමග එම ගෝත්‍රික සමාජයේ (මේ වන විට ඒ තුළ වංශ නම් ව්‍යුහයක් නිර්මාණය වී තිබිණි) වංශ තුළ සිටි ප්‍රධානීන් විසින් වංශයේ දේපළ තමන්ගේ පෞද්ගලික දේපළ බවට පත්කර ගෙන වංශයේම සමහර අය වහලුන් බවට පත්කර ගනු ලැබ තිබිණි. ගෘහමය වහල් ක්‍රමය ලෙස මෙය හඳුන්වන අතර වහල්

15 වැනි පිටුවට

## අනියමින් මිනී මරණ

# කුඩු එතනෝල් ජාවාරම

අනාගතයේ දවසක ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ ලාස් වේගාස් යනුවෙන් හඳුන්වනු ඇති බවට ආතර් සී. ක්ලාක් සිය අවසන් සිද්ධාන්තය ග්‍රන්ථයේ ලියා තැබීය. එය එසේ විය හැකි බවට පෙර නිමිති පෙන්වමින් මේ වන විට ශ්‍රී ලංකාවේ ඇස්තමේන්තුගත හෙරොයින් භාවිත කරන්නන් 45,000ක් සිටින අතර ඔවුන්ට දෛනිකව හෙරොයින් කිලෝ ග්‍රෑම් 04ක් අවශ්‍ය බව අලුත්ම වාර්තාවලින් හෙළිවී තිබේ. ඒ අනුව හෙරොයින් ලෝලීන් වෙනුවෙන් වසරකට හෙරොයින් කිලෝ 1460ක් අවශ්‍ය බව ඇස්තමේන්තු ගතකර ඇත.

හෙරොයින් යනු ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන මත්ද්‍රව්‍යයක් නොවේ. රසායන විද්‍යාත්මකව ඩයිඇසිටයිල් මෝෆීන් (Diacetyl morphine) ලෙස හෙරොයින් හැඳින්වේ. මෝෆීන් නම් ද්‍රව්‍යයට තවත් රසායන ද්‍රව්‍යයන් කිහිපයක් එක්කර හෙරොයින් නිෂ්පාදනය කරනු ලබයි. මොර්ෆීන් යනු පොපි ශාඛයෙන් නිෂ්පාදනය කරන ද්‍රව්‍යයකි. පොපි ශාකයෙන් නිපදවන අබිංවලින් මෝර්ෆීන් නිෂ්පාදනය කරයි. සුදු, කහ, සහ දුඹුරු පැහැයෙන් සහ කුඩු, කැට සහ දියර වශයෙන් හෙරොයින් දැකිය හැකිය. ශ්‍රී ලංකාවේ වැඩි වශයෙන්ම හෙරොයින් ඇත්තේ කුඩු ලෙසය. ඇසිඩ් හෝ විනාකිරි මෙන් ගඳක් වහනය වන හෙරොයින්වල හොඳම වර්ගය සුදු පැහැයෙන් යුක්ත බව කියති. ලංකා වෙළෙඳපොළේ එවැනි හෙරොයින් නැත. ලංකාවේ හෙරොයින් භාවිතය ප්‍රචලිත වන්නේ 1980 දශකයෙන් පසුවය.

ශ්‍රී ලංකාවට වැඩි වශයෙන් හෙරොයින් ගෙනඑන්නේ ඇෆ්ගනිස්ථානයේ සිට බව සොයාගෙන ඇත. ඇෆ්ගනිස්ථානයේ සිට පකිස්ථානය සහ ඉන්දියාව හරහා හෙරොයින් ගෙන ඒම එක් මාර්ගයක් ලෙස යොදා ගැනෙන අතර ඉරානය දෙසින්ද මාර්ගයක් දැනට හඳුනාගෙන තිබේ. අතීතයේ තත්ත්වය එලෙස වුවත් ලංකාවට දැන් වැඩි වශයෙන් හෙරොයින් එන්නේ පකිස්ථානයේ සිට බව සොයා ගෙන ඇත.

එසේම ශ්‍රී ලංකාවට හෙරොයින් ඇතුළුවන ප්‍රධාන ක්‍රමවේදයන් දෙකකි. පළමුවැන්න මුහුදෙනි. දෙවැන්න ගුවනෙනි. අතීතයේ ලංකාවට හෙරොයින් වැඩි වශයෙන් ගෙනඑන්නේ ගුවන් මගින් බව පැවසුණද වර්තමානය වන විට අනාවරණය වී ඇත්තේ ලංකාවට වැඩි වශයෙන් හෙරොයින් ගෙනඑන්නේ මුහුදු මාර්ගයෙන් බවයි. මුහුදු මගින් හෙරොයින් ලංකාවට ගෙනෙන ප්‍රධාන ක්‍රම අතර කන්ටේනර් සහ බෝට්ටු යොදා ගැනීම බහුලව සිදුවේ. එසේ කන්ටේනර් මගින් කුඩු ගෙන ඒම පිළිබඳ ප්‍රධාන සිද්ධි රැසක් පසුගිය කාලයේ වාර්තා විය.

ඉන්දියාවේ සිට ලංකාවේ බටහිර වෙරළ තීරයට බෝට්ටු මගින් බහුල වශයෙන් හෙරොයින් ගෙන එනු ලබන බවටද ලංකාවේ ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ආයතනවලට තොරතුරු ලැබී ඇත. මීගමුවේ සිට හලාවත දෙසට මුහුදු තීරය ඒ අතර විශේෂත්වයක් ගනී. බෝට්ටු මගින් ගෙන එන හෙරොයින් ලංකාවේ නැගෙනහිර වෙරළ තීරයේ ඇතැම් ස්ථානවලින්ද ලංකාවට ඇතුළුවන බව කියවේ.

එසේම වර්තමානයේ මත්ද්‍රව්‍ය බෙදාහැරීම අන්තර්ජාලය හරහා ගජරාමෙට සිදු වන්නකි. විශේෂයෙන්ම අන්තර්ජාලයේ අඳුරු පැතිකඩක් ලෙස පෙන්විය හැකි 'ඩීප් වෙබ්' හි ඇති 'සිල්ක් රෝඩ්' නමින් හැඳින්වෙන වෙබ් අඩවි හරහා ඕනෑම අයෙකුට ඕනෑම මත්ද්‍රව්‍යයක් මිලදීගත හැකි අතර ඔවුන් එම මුදල අන්තර්ජාලයෙන් 'බිට් කොයින්'වලින් (ඩිජිටල් මුදල් ඒකකයකි) ගෙවූ විට 'සිල්ක් රෝඩ්' මාර්ගයෙන් ඒවා තැපැල් මාර්ගිකව ගෙදරටම එවනු ලබයි.

'සිල්ක් රෝඩ්'හි කොලොම්බියානු කොකේන් ග්‍රෑම් 10ක් බිට් කොයින් 67.3කි. ඉතාම උසස් තත්ත්වයේ ක්‍රිස්ටල්වල (සීයට අසූවකට වඩා පිරිසිදු අයිස්) මිල බිට් කොයින් 188කි. ගංජාවල මිල බිට් කොයින් 999කි. මේවා පමණක් නොව ZOMBI, BATH, SALT, CROCODILE, SPICE ආදී ඕනෑම මත්ද්‍රව්‍යයක් මෙහිදී මිලට ගත හැකිය.

'බිට් කොයින්' ගනුදෙනු බැංකු ආදියෙහි සටහන් වන ගනුදෙනු නොවන නිසා තොරතුරු අනාවරණය වීමේ විශාල ගැටලුවක් තිබේ. ඒ නිසා එක් එක් රටවල් මේ ජාවාරම්වලට සම්බන්ධ වී ඇති ප්‍රමාණය පිළිබඳ ජාත්‍යන්තර පොලිසිය සතුව පවා නිවැරදි තොරතුරු නොමැත. ඒ නිසා පරණ සේද මාවතේ සහ අලුත් සේද මාවතේ ලංකාව ඉන්නා තැන පිළිබඳවද ඇත්තේ බරපතළ ගැටලුවකි. අනෙක් ප්‍රශ්නයනම් ලංකාවේ ඇස්තමේන්තුගත හෙරොයින් භාවිතා කරන්නක් 45,000 අතරින් කීයක් 'සිල්ක් රෝඩ්'හි පාරිභෝගිකයන්ද යන්නයි. ඊළඟ ප්‍රශ්නය දෛනික කිලෝ හතරක හෙරොයින් අවශ්‍යතාවෙන් කිලෝ කීයක් 'සිල්ක් රෝඩ්' මගින් සපයනවාද යන්නයි.

ශ්‍රී ලංකාවේ එක්තරා පන්තියකට අයත් පිරිසක් අතීතයේ හෙරොයින් භාවිත කළත් වර්තමානය වන විට එය වෙනස් වී තිබේ. පාසල් සිසුවාගේ සිට වයස් සීමාවකින් තොරව විවිධ පිරිස් හෙරොයින් භාවිත කරති. අතීතයේ ධනවත් පවුල්වල දරුවන් හෙරොයින් භාවිතයට ඇබ්බැහි වී සිටියත් වර්තමානය වන විට හෙරොයින් භාවිතයට වැඩියෙන් ඇබ්බැහි වෙමින්



සිටින්නේ දුප්පත් පවුල්වල පිරිස්ය. පසුගිය වසරේ හෙරොයින් වැරදි සම්බන්ධයෙන් පාසල් සිසුන් සියයක් පමණ අත්අඩංගුවට ගත් බව පොලිස් ආරංචි කියයි.

ලංකාවේ වැඩි වශයෙන් හෙරොයින් භාවිත කරන්නේ චයිනීස් ක්‍රමයටයි. එනම් දුම ඉරීමේ ක්‍රමයකි. ඊට අමතරව එන්නත් මගින් විද ගැනීමද ලංකාවේ සුළු වශයෙන් සිදුවේ. හික්කඩුව, මීගමුව ආදී සංචාරකයන් වැඩියෙන් ගැවසෙන ප්‍රදේශවල හෙරොයින් විද ගැනීමේ ක්‍රමය භාවිත වෙයි.

ශ්‍රී ලංකාවට ගෙන්වන හෙරොයින් අවසන් පාරිභෝගිකයා හෙවත් 'කුඩු ගසන්නා' අතට පත්වන්නේ තැරැව්කරුවන් කිහිප දෙනකු අතට පත්වීමෙන් පසුවය. එලෙස පත්වන විට ගෙන්වන ලද හෙරොයින්වලට තවත් විවිධ අහිතකර දෑ එක් කරයි. හෙරොයින්වල ශුද්ධතාව යනු 'ඩයි ඇසිටයිල් මෝර්ෆීන්' අඩංගු ප්‍රමාණයයි. ලංකාවට ගෙන්වන විට වැඩි ප්‍රතිශතයක් ඩයි ඇසිටයිල් මෝර්ෆීන් අඩංගු වුවත් විවිධ දෑ එක් කිරීම නිසා වීදි හෙරොයින්වල එම එම ප්‍රතිශතය සියයට 15ක් පමණ වේ. තැරැව්කරුවන් අතින් අතට පත් වෙද්දී ඔවුන් වැඩිපුර ලාබයක් තබා ගැනීම සඳහා හෙරොයින්වල ශුද්ධතාව අඩු කරයි. එනම් ඩයිසිෆෑම්, ඇසිටමිනෝෆීන් සහ කැෆෙන් වැනි විවිධ වර්ග එකතු කරයි.

හෙරොයින් යනු නීතියෙන් තහනම් දෙයක් නිසා සත්‍ය වශයෙන්ම ඊට වෙළෙඳපොළ මිලක් නියම කළ නොහැකිය. එහෙත් සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ හෙරොයින් කිලෝවක් රුපියල් ලක්ෂ හැටකට පමණ අලෙවි වන බව හඳුනාගෙන ඇත. ඒ අනුව ලංකාවේ හෙරොයින් ග්‍රෑම් එකක මිල රුපියල් 6500ක් පමණ වෙයි.

මහා පරිමාණ හෙරොයින් ජාවාරම්කරුවන්ගේ මිල ගණන් එසේ වුවත් හෙරොයින් වීදි වටිනාකම ඊට වෙනස්ය.

1984 අංක 13 දරන විෂ වර්ග, අබිං සහ අන්තරායකර ඖෂධ වර්ග (සංශෝධන) පනතට අනුව හෙරොයින් ග්‍රෑම් දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ජාවාරම් කිරීම, සන්තකයේ තබා ගැනීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම සම්බන්ධයෙන් වැරදිකරුවකු වුවහොත් මරණ දණ්ඩනය හෝ ජීවිතාන්තය දක්වා බන්ධනාගාර ගත කළ හැකිය. එමෙන්ම හෙරොයින් ග්‍රෑම් එකකට අඩු ප්‍රමාණයක් ළඟ තබා ගැනීම, ජාවාරම් කිරීම, ආනයනය කිරීම හෝ අපනයනය කිරීම සම්බන්ධයෙන් වැරදිකරු වුවහොත් රුපියල් පහළොස් දහසකට නොඅඩු, රුපියල් පනස් දහසකට නොවැඩි දඩයකටද, අවුරුදු තුනකට නොඅඩු, අවුරුදු හතකට නොවැඩි කාලයක් දෙයාකරයකින් එක් ආකාරයකට බන්ධනාගාර ගත කිරීමටද ලක් කළ හැකිය.

නීතිපති දෙපාර්තමේන්තුවෙන් 2012/04/18 දාතමින් සිආර්3/විවිධ05/12 අංකයෙන් පොලීසියට නිකුත් කර ඇති උපදෙස් පත්‍රිකාවක දැක්වෙන්නේ ශුද්ධතාව අනුව හෙරොයින් මිලි ග්‍රෑම් පන්සියයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සමග අත්අඩංගුවට ගන්නා සැකකරුවන්ට මහාධිකරණයේ නඩු පැවරිය යුතු බවයි. හෙරොයින් මිලිග්‍රෑම් 500ට අඩු වුවත් හෙරොයින් ජාවාරම් කිරීම සම්බන්ධයෙන් පැහැදිලි සාක්ෂි ඇත්නම් හෝ හෙරොයින් සම්බන්ධයෙන් පෙර වැරදි තුනක් හේ ඊට වැඩියෙන් ඇත්නම් මහාධිකරණයේ නඩු ගොනු කරන ලෙසද නීතිපති දෙපාර්තමේන්තුව පොලිසියට උපදෙස් දී ඇත. නීතිපති දෙපාර්තමේන්තුව පවසන්නේ 'ජාවාරම් කිරීම' හා 'විකිණීම' යනු දෙකක් බවයි. සුළු පරිමාණයෙන් අවසන් පාරිභෝගිකයාට හෙරොයින් අලෙවි කිරීම 'විකිණීම' ලෙස ඔවුන් දක්වා ඇත. එවැනි වැරදි සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය යුතුයි.

ලංකාවේ සංසරණය වෙන්නේ හෙරොයින් පමණක් නොවේ. ලෝක ප්‍රසිද්ධ මත්ද්‍රව්‍ය වර්ග වූ එක්ස්ටසි, රෝයිපොනෝල්, කැට්ටිනේට් පවා ශ්‍රී ලංකාවේ අද සංසරණය වෙයි. එමෙන්ම ලෝකයේ අඩුවෙන්ම දුම්වැටි භාවිතා කරන තරුණයන් සිටින රට ශ්‍රී ලංකාව වුවද ලංකාවේ දුම්කොළ ආශ්‍රිත නිර්මාණ 21ක් පමණ සංසරණය වෙයි. මාවා, බාබුල්, හාන්ස් ගුට්කා, බීඩා ආදී නිෂ්පාදනද මේ අතර ඇත. එසේම ශ්‍රී ලංකාවේ විශේෂයෙන් වියළි කලාපයේ නැගෙනහිර, ඌව සහ දකුණු පළාත් සීමාවන් තුළ නීත්‍යානුකූල නොවන ආකාරයට ගංජා වගා කර ඇති ඇස්තමේන්තු ගත ඉඩම් ප්‍රමාණය අක්කර 1250ක් පමණ වේ.

හෙරොයින් ඇතුළු මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන් නිසා සිදුවන සමාජ ගැටලු රාශියකි. සමාජයේ ඇතැමුන් 'කුඩු ගහල උන් මැරිල ගියාවෙ' කියා ප්‍රශ්නය ලඝු කොට සිතුවද ඔවුන් මේ සියල්ල පසුපස තිබෙන බේදවාචකය දකින්නේ නැත. දවසට වුවමනා කැටය (හෙරොයින් ප්‍රමාණය) උපයා ගන්නට 'සික්කාරයන්' ඕනෑම දෙයක් කරති. සමාජයේ පික් පොකට්කරුවන්, මංකොල්ලකාරයන්, ගෙවල් බිඳින්නන්, ලිංගික ශ්‍රමිකයන් ආදී පිරිස් සමාජයේ වැඩි වන්නේ මේ හේතුවෙන්ය. ගැටලුව එතැනින් නවතින්නේයැයි සිතුවාට එය එසේ නොවේ. එන්නත් කටු මගින් හෙරොයින් ශරීරයට එන්නත් කරගැනීම ඒඩ්ස් ඇතුළු සමාජ රෝග සමාජයේ පැතිර යෑමට බලපායි. විශේෂයෙන් මොවුන් සිටින්නේ සමාජ රෝග වැළඳීමේ ප්‍රවණතාව ඇති කණ්ඩායම්වල මුල්තැනය. එමෙන්ම ලංකාවේ බන්ධනාගාර රැඳවියන්ගෙන් 43%ක් විවිධ මත්ද්‍රව්‍යවලට පුරුදුව සිටින්නන් බව වාර්තා මගින් පැහැදිලිව දැක ගත හැකිය. මත්ද්‍රව්‍ය හා මධ්‍යසාර නිසාවෙන් රෝගී වන්නන් සඳහා වසරකට රජයේ සෞඛ්‍ය වියදමින් 22%ක් වැය කරයි.

**හෙරොයින් හා අනෙකුත් මත්ද්‍රව්‍ය බෙදා හැරීම වටා පාතාලය ගෙතී ඇත. සෑම ප්‍රදේශයකම පාතාලය මත්ද්‍රව්‍ය හා බලය වෙනුවෙන් යුද වදියි. පසුගිය සමයේදී අපට අසන්නට ලැබුණු විවිධ පුවත් තුළින් මේ බේදවාචකයේ තරම සියල්ලන්ටම දැක ගත හැකි විය. එහෙත් කුඩු කන්ටේනර්, එතනෝල් කන්ටේනර් ආනයනය කරන අයුරු අපට දක්නට ලැබුණත් ඒවායේ සැබෑ ජාවාරම්කරුවන් හා පිටුපස සිටින දේශපාලන අධිකාරිය නීතියේ රැහැනින් මඟහැර සිටින බව නොරහසකි.** බොහෝ විට නීති හදන පාර්ලිමේන්තුවේත්, ඒවා ක්‍රියාත්මක කරන අධිකරණයේත්, පොලිසියේ හා සියල්ලේ ඇස් ඇරවන ජනමාධ්‍යයේත් ජාවාරම්කරුවන්ගේ සහායකයන් සිටින බව කියැවේ. එසේම ලංකාවේ සමාජ, ආර්ථික, දේශපාලන ක්ෂේත්‍රයේ මහා ගරාවැටීමකට මඟ පෑදූ කුඩු, එතනෝල්, ගංජාවලට එරෙහිව මෙතෙක් කිසිදු ආණ්ඩුවක් විධිමත් වැඩපිළිවෙළක් ඉදිරිපත් කර නැත. ඇස් බැන්දුම් හා පැලැස්තර ඇලවීම් පමණක් දේශපාලන න්‍යායපත්‍ර මත සැකසෙද්දී ජාවාරම තවමත් යෙහෙන් වැජඹෙමින් තිබෙන්නේ ඒ නිසාය.

> හෙරොයින් හා අනෙකුත් මත්ද්‍රව්‍ය බෙදා හැරීම වටා පාතාලය ගෙතී ඇත. සෑම ප්‍රදේශයකම පාතාලය මත්ද්‍රව්‍ය හා බලය වෙනුවෙන් යුද වදියි. පසුගිය සමයේදී අපට අසන්නට ලැබුණු විවිධ පුවත් තුළින් මේ බේදවාචකයේ තරම සියල්ලන්ටම දැක ගත හැකි විය. එහෙත් කුඩු කන්ටේනර්, එතනෝල් කන්ටේනර් ආනයනය කරන අයුරු අපට දක්නට ලැබුණත් ඒවායේ සැබෑ ජාවාරම්කරුවන් හා පිටුපස සිටින දේශපාලන අධිකාරිය නීතියේ රැහැනින් මඟහැර සිටින බව නොරහසකි.

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2018 දෙසැම්බර් 18

# විධායක ජනාධිපති ධූර අහෝසි කිරීමේ තීරණය ජනතාවට ලබා දෙමු!

(සභාව කල්තැබීමේ යෝජනාව ඉදිරිපත් කරමින්)

## පාර්ලිමේන්තු මන්ත්‍රී නලින්ද ජයතිස්ස සහෝදරයා



පසුගිය දිනවල සිදුවූ දේශපාලන කලබැගෑනියෙන් අනතුරුව, මම හිතන විධියට පාර්ලිමේන්තුව හැටියට අපි ප්‍රජාතන්ත්‍රවාදය සම්බන්ධයෙන් ගත යුතු ඉතාම කඩිනම් සහ ශක්තිමත් පියවරක් තමයි, මේ විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීම. පසුගිය අවුරුදු 40 පුරාම අපේ රට මේ විධායක ජනාධිපති ධූරයේ ආදීනව අත්දැක, අත්විඳ තිබෙනවා. ඒ නිසා තමයි මෙවැනි බලසම්පන්න ඒකාධිපති ධූරයක් අහෝසි කළ යුතුය යන මතය ඉදිරිපත් වුණේ; සියලු ජනාධිපතිවරණවලදී එය ප්‍රධාන සටන් පාඨයක් බවට පත් වුණේ. ඒ නිසා මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන, මේ රටේ දේශපාලන ශිෂ්ටත්වයක් අපේක්ෂා කරන, දේශපාලන සදාචාරයක් අපේක්ෂා කරන රටේ සාතිශය බහුතර ජනතාවගේ පැතුම බවට පත් වෙලා තිබෙන්නේ. මේ අත්තනෝමතික, ඒකාධිපති විධායක ජනාධිපති ධූරය අහෝසි කළ යුතුය යන්නයි.

1978 මේ තනතුර හඳුන්වා දුන් අවස්ථාවේ සිටම, විශේෂයෙන් අපේ රටේ වමේ ව්‍යාපාරය පැත්තෙන්, අපේ රටේ ප්‍රගතිශීලී ව්‍යාපාරය පැත්තෙන් ඒකට බරපතළ විරෝධයක් එන්න පටන් ගත්තා.

### මැතිවරණ පොරොන්දු ඉතිහාසය

1982 පැවැති ජනාධිපතිවරණයේ ඉඳලාම අපේ රටේ දේශපාලන ව්‍යාපාර මේ සඳහා විවිධ උත්සාහයන් ගත්තා. 1988දී පැවැති ජනාධිපතිවරණයේදී ප්‍රජාතන්ත්‍රවාදී ජනතා බලවේගය හැටියට සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඉදිරිපත් කළ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ අංක 2 යටතේ සඳහන් වුණු කාරණය මම මේ අවස්ථාවේ මතක් කරන්න කැමැතියි. එහි සඳහන්ව තිබුණේ, "විධායක ජනාධිපති ධූරය අහෝසි කොට, විධායක බලය පාර්ලිමේන්තුව හා කැබිනට් මණ්ඩලය සතු කිරීම" කියන කාරණයයි.

1994දී පැවැති ජනාධිපතිවරණයේදීත්, එම අවුරුද්දේ පවත්වන ලද මහ මැතිවරණයේදීත් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියත්, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියත් පොදුජන එක්සත් පෙරමුණේ ප්‍රතිපත්ති ප්‍රකාශනය එළිදක්වන කොට බොහොම පැහැදිලිව කිවුවා, "විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීම අපේ වැඩසටහනේ ඉතාම ප්‍රමුඛ තැනක් ගැනෙයි" කියා.

1995 ජූලි 15වැනිදාට කලින් මේ අත්තෝනෝමතික, විධායක ජනාධිපති ධූරය අහෝසි කරනවාය කියා චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය ජාතිය ගලවා ගැනීමේ මේ පෙරමුණ මගින් රටට පණිවුඩයක් දුන්නා. ඇය ඒක ලිඛිතව ලබා දුන්නා. අපේ නිහාල් ගලප්පත්ති සහෝදරයා ජනාධිපති අපේක්ෂක ධූරය සඳහා තරඟ කරනකොට, එතුමා ඉන් ඉවත් වීමට බලපෑවේ එතුමිය ජනතාවට දුන් ඒ ලිඛිත පොරොන්දුවයි. එතුමිය අවුරුදු 06ක් මේ රට පාලනය කරලා, 1999 ජනාධිපතිවරණයෙන් පස්සේ අලුත් ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවක් සකස් කරන්න යෝජනා සාකච්ඡා කර තිබුණා. විධායක ජනාධිපති ධූරය අහෝසි කරලා, පාර්ලිමේන්තුවට වගකියන ආණ්ඩු ක්‍රමයක් පිළිබඳව ඒ සාකච්ඡාව ඇතුළෙත් කථා වුණා.

ඊළඟට, 2005දී තවත් ජනාධිපතිවරණයක් තිබුණා. එම ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ මහතා ඉදිරිපත් කළ, "මහින්ද චින්තන - අලුත් ඉරක් අලුත් රටක් උදෙසා" කියන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ මෙසේ සඳහන් වුණා:

"විධායක ජනාධිපති ධූරය අහෝසි කෙරෙන්නා වූ හා රටේ සෙසු ප්‍රශ්නවලටද විසඳුම් ලබා දෙන්නා වූ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සියල්ලන්ගේ සම්මුතියෙන් ඉදිරිපත් කිරීම"

ඒ නිසා 2005 ජනාධිපතිවරණයේ ප්‍රධාන සටන් පාඨයක්, විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීම. ඊළඟට 2010 "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" මැතිවරණ ප්‍රකාශයේත් විධායක ජනාධිපති ධූරය මුළුමනින්ම අහෝසි කරනවා කියා සෘජුව කිවුවේ නැති වුණාට, එය පාර්ලිමේන්තුවට වගකියන භාරකාර ධූරයක් බවට පත් කරන බවට තමයි එවකට මහින්ද රාජපක්ෂ මහත්මයා පොරොන්දු වුණේ. මම හිතන්නේ, විධායක ජනාධිපති ධූරය සම්බන්ධයෙන් යම්කිසි මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශයක විස්තර සහිතව ලියවුණා නම්, ඒ ලියවුණේ 2010 "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" මැතිවරණ ප්‍රකාශයේයි. මම කැමැතියි, එතුමන්ලාට අහගන්නත් එක්ක එය කියවන්න. එහි මෙන්න මෙහෙම කියනවා.

"අතීතයේදී විධායක ජනාධිපති ධූරය යොදා ගන්නා ලද්දේ මැතිවරණ කල් දැමීමට, මැතිවරණවලින් පත් වූ ආණ්ඩු පෙරළා දැමීමට, අධිකරණයට බාධා කිරීමට, පක්ෂ තහනම් කිරීමට, උද්ඝෝෂණ මර්දනය කර ඝාතක සංස්කෘතියකට රට ගෙන යාමට, රාජ්‍ය ආයතන කුණු කොල්ලයට විකුණා දැමීමට, අපරාධකරුවන් රැකීමට සහ ජාවාරම්කරුවන්ට සහන ලබා දීමටය. රට පාවා දෙන ගිවිසුම් ඇති කර ගත්තේද විධායක ජනාධිපති ධූරය යොදාගෙනය."

විධායක ජනාධිපති ධූරය විසින් රටට කරන ලද අතිමහත් හානිය පිළිබඳව විස්තර සහිත, කරුණු සහිතව ඉදිරිපත් කළේ, 2010 "මහින්ද චින්තන - ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයේයි. ඊළඟට 2015 ජනාධිපතිවරණය ආවා. තමන්නාන්සේලා දන්නවා, ඒ ජනාධිපතිවරණයේදී මහින්ද රාජපක්ෂ මහත්තයාගේ අවුරුදු 10ක පාලනය පිළිබඳව, විධායක ජනාධිපති ධූරය භාවිත කිරීම පිළිබඳව බරපතළ විරෝධයක් පැන නැගුණු බව. ඒ විරෝධයේ ප්‍රතිඵලයක් හැටියට විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීම සඳහා වන සමාජ ව්‍යාපාරයන්, දේශපාලන ව්‍යාපාරයන් නිර්මාණය වුණා. මාදුළුවාවේ සෝභිත හාමුදුරුවන් ප්‍රමුඛ සාධාරණ සමාජයක් සඳහා වූ ජනතා ව්‍යාපාරය, ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු තවත් පක්ෂ විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීම සඳහා වන ක්‍රියාවලියට අවතීර්ණ වුණා. 2014 නොවැම්බර් මාසයේ මෛත්‍රීපාල සිරිසේන මහත්තයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් එළියට එන්නේ විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීමේ පොදු අපේක්ෂකයා හැටියටයි. එතුමා 2014 නොවැම්බර් 21වැනිදා නව නගර ශාලාවේ පවත්වන පළමුවැනි මාධ්‍ය හමුවේදී කියන්නේ "දින 100 ඇතුළත විධායක ජනාධිපති ධූරය අහෝසි කරනවා" කියා.

මැතිවරණය ව්‍යාපාරය ඇතුළත එතුමා කියන්නේ මෙන්න මෙහෙමයි. මතුගම රැස්වීමකදී කරපු කථාව 2014 දෙසැම්බර් 12 "ලංකාදීප" පුවත් පතේ මෙසේ පළ වෙනවා:

"විධායක ක්‍රමය ආරම්භ කළ දවසෙ සිට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එයට විරුද්ධයි. කලින් ජනාධිපතිවරුන් මැතිවරණ ප්‍රකාශයට පමණක් විධායකය අහෝසි කරනවා යැයි පැවසුවා. නමුත් මා සම්මුතියකට එකඟතාවකට පැමිණ සිටිනවා, අනිවාර්යයෙන්ම විධායක ජනාධිපති ක්‍රමය මා අහෝසි කරනවා. පක්ෂ ගණනාවක් එකතුව නායකයින් 47 දෙනෙකු එකඟතා සම්මුතියකට අත්සන් තැබුවා. මීට කලින් කිසිම කෙනෙකු නොකළ දේ සම්මුතියට අනුව මම කරන බව සියලු දෙනාට සිහිපත් කරනවා."

ඒ මැතිවරණ ව්‍යාපාරය ඇතුළේ මෛත්‍රීපාල සිරිසේන කියන අපේක්ෂකයා වැඩිපුරම කියපු දේ තමයි, "විධායක ජනාධිපති ධූරය අහෝසි කරනවා" කියන කාරණය. එතුමා ජනාධිපති ධූරයට පත් වුණාට පස්සේ, මේ ව්‍යාපාරයේ මුල් පෙළේ හිටපු මාදුළුවාවේ සෝභිත හාමුදුරුවන්ගේ ආදාහන උත්සවයේදී -උන්වහන්සේගේ මෘත දේහය ඉදිරිපිටදී- ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්මයා මෙහෙම පොරොන්දුවක් දෙනවා.

"සෝභිත හිමි පැතූ පරිදිම විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීමට කළ හැකි සියල්ල කරනවා."

මේ රටේ ජනාධිපතිවරණ ගණනාවකදී මේ පොරොන්දුව ප්‍රධානම මැතිවරණ පොරොන්දුවක් බවට පත් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. 2015 ජනාධිපතිවරණයේදී එක පැත්තකින් විධායක ජනාධිපති ධූරය අහෝසි කරන පොදු අපේක්ෂකයෙක් ඉදිරියට එනකොට ඊට ප්‍රතිපක්ෂව ආපු අපේක්ෂකයාටත් විධායකය රකිනවා කියලා හරි, විධායක බලතල තවත් වැඩි කරනවා කියලා හරි කියන්න බැහැ. ඒක නිසා අඩු ගණනේ ප්‍රතිපත්ති ප්‍රකාශයටවත් ඔහුට දමන්න සිදු වුණා. "විධායක ජනාධිපති ක්‍රමය ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයේ තීරණය අනුව සුදුසු පරිදි සංශෝධනය කරමි." කියා. එහෙම තමයි, මේ ක්‍රියාවලිය අවුරුදු 40ක් තිස්සේ දියත් වුණේ.

"විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීම" 1982 ඉඳලා ජනාධිපති අපේක්ෂකයින්ගේ ප්‍රධාන සටන් පාඨය වුණා. නිශ්චිතවම ගත්තොත් 1994, 2005 සහ 2015 වර්ෂවල පැවැති මැතිවරණවලදී මේ රටේ බහුතර ජනතාවක් ඡන්දය දීලා ඒ සඳහා තමන්ගේ කැමැත්ත ප්‍රකාශ කර තිබෙනවා. එම නිසා මේක අපි නැවත නැවත සාකච්ඡා කළ යුතු මාතෘකාවක් නොවෙයි. අපි ක්‍රියාකාරිව, විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීම සඳහා කටයුතු කළ යුතුව තිබෙනවා.

> මේ දින පණහ ඇතුළතදී විධායක ජනාධිපති ධූරයෙන් රටට කළ හානි මොනවාද කියා අහපු ප්‍රශ්නයට උත්තරයක් ලැබුණා වාගේම මීට අවුරුදු 40කට කලින් ගරු එන්.එම්. පෙරේරා මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයකටත් මේ රටේ ජනතාවට උත්තරයක් හම්බ වුණා. විධායක ජනාධිපති ධූරය රටට හඳුන්වා දෙනකොට එන්. එම්. පෙරේරා මැතිතුමා ඇහුවාලු, "හදිසියෙන්වත් මේ පුටුවේ පිස්සෙක් වාඩි වුණොත් මොකද වෙන්නේ?" කියා. අපට අවුරුදු 40ක් ගියා එතුමාගේ ප්‍රශ්නයට උත්තරයක් සොයා ගන්නට, ඒකට ප්‍රත්‍යක්ෂ කාරණා එකතු කරන්නට, මේ පුටුවේ පිස්සෙක් වාඩි වුණොත් මොකද වෙන්නේ කියා ඇස් පනාපිට දැක ගන්න.

### සජීවී අත්දැකීම

ඇත්තටම අපි මැතිවරණවලදී විධායක ජනාධිපති ධූරය අහෝසි කරන්නට ජනතාව ඉස්සරහා කළ කථිකාවටත් වඩා ජනතාව දැන් අත්දැකීමෙන් විධායක ජනාධිපති ධූරයේ ආදීනව තේරුම් අරගෙන ඉන්නවා. ඒකට වෙන මොනවත් අවශ්‍ය නැහැ. පසුගිය දින පණහ ප්‍රමාණවත්. අපි මීට මාස කිහිපයකට කලින් විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාපු වෙලාවේ විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට එරෙහි වුණු, විධායක ජනාධිපති ධූරය ආරක්ෂා කර ගන්නට ඕනෑයි කියපු අය එක එක රූපවාහිනී සංවාදවලදී අපට කිවුවා, "හරි, කියන්න බලන්න, විධායක ජනාධිපති ධූරයෙන් රටට කළ හානි පහක්" කියා. අපට ඒවාට උත්තර දෙන්නට ඕනෑ නැහැ. පසුගිය දින පණහ ඇතුළතදී මෛත්‍රීපාල සිරිසේන මහතා හැසිරුණු ආකාරය ප්‍රමාණවත් විධායක ජනාධිපති ධූරය කියන්නේ මොකක්ද කියන එක තේරුම් කරවන්නට. විධායක ජනාධිපති ධූරය අහෝසි කිරීම සඳහා යන ගමනේදී සපුරා ගත යුතු නිර්ණායක කිහිපයක් අපට තිබුණා. විධායක ජනාධිපති ලෙස පත් වෙන කෙනාට පාර්ලිමේන්තුවේ බහුතරයක් තිබෙනවා නම්, ඔහුට පක්ෂයේ බලයක් තිබෙනවා නම්, -ඒ පත් වෙන කෙනා මොන පොරොන්දු දුන්නත්- ඔහු විධායක ජනාධිපති ධූරය අහෝසි කරන්නේ නැහැ කියා පරණ අත්දැකීම අපට තිබුණා. දැන් මෛත්‍රීපාල සිරිසේන මහත්තයට පක්ෂයක බලයක් නැහැ, පාර්ලිමේන්තුවේ බහුතරයත් නැහැ. එහෙම තියාගෙනත් මේ විධියට තමයි ඔහු අත්තනෝමතිකව හැසිරුණේ.

අපි විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාපු වෙලාවේ සමහර අය කියන්නට පටන් ගත්තා විධායක ජනාධිපති ධූරය ආරක්ෂා කර ගන්නට ඕනෑ. එහෙම නැත්නම් රට බේරා ගන්නට බැහැයි කියා. අපි අහන්නේ මේ දින පණහ ඇතුළතදී මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට, ශිෂ්ටත්වයට, දේශපාලන සදාචාරයට විධායක ජනාධිපති ධූරය විසින් කරන ලද හානිය දිහා බලල, ඒ හානි විඳවලා, ඒකෙන් රටට අත් වුණු අපකීර්තිය ඇස් පනාපිට දැක දැක තවත් දවසක් හෝ විධායක ජනාධිපති ධූරය ඉදිරියට ගෙන යන්න තමුන්නාන්සේලා අත ඔසවනවාද කියායි.

මේ දින පනහ ඇතුළතදී විධායක ජනාධිපති ධූරයෙන් රටට කළ හානි මොනවාද කියා අහපු ප්‍රශ්නයට උත්තරයක් ලැබුණා වාගේම මීට අවුරුදු 40කට කලින් ගරු එන්.එම්. පෙරේරා මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයකටත් මේ රටේ ජනතාවට උත්තරයක් හම්බ වුණා. විධායක ජනාධිපති ධූරය රටට හඳුන්වා දෙනකොට එන්. එම්. පෙරේරා මැතිතුමා ඇහුවාලු, "හදිසියෙන්වත් මේ පුටුවේ පිස්සෙක් වාඩි වුණොත් මොකද වෙන්නේ?" කියා. අපට අවුරුදු 40ක් ගියා එතුමාගේ ප්‍රශ්නයට උත්තරයක් සොයා ගන්නට, ඒකට ප්‍රත්‍යක්ෂ කාරණා එකතු කරන්නට, මේ පුටුවේ පිස්සෙක් වාඩි

15 වැනි පිටුවට

කවුළුව හැර තබමි

# උන්මත්තකාගාරය

ඔවුන් සමග කිරිබත් කති. ජයපැන් බොති. ආගමික නායකයෝ ඔවුන්ට සෙත්පතති. හොරුන් උදෙසා කිරිබත් කන ජයපැන් බොන, ඔවුන්ට සෙත් පතන මිනිසුන් සිටින එකම රට ලෙස මේ ශ්‍රී ලංකාව දූන් ලෝක ප්‍රකට වී ඇත.




කප් පිට කප් ගහපු චෞරයන් රට කරවද්දීත් කිරිබත් කෑමට තරම් මන්ද මානසිකත්වයකට රටේ ජනයා පත්වූයේ කෙසේද? මෙය නම් ගැඹුරින් පරීක්ෂාවට භාජනය කළ යුතු තත්වයකි. රටේ පුරවැසියාගේ මේ අසාමාන්‍ය හැසිරීම් රටාව තේරුම් ගැනීමට තරම් විද්‍යාවක් තවමත් අප සතුව නැද්ද? එක අතකට මිත්‍යාව රජ වී විද්‍යාව පසෙකලා ඇති රටක මෙයද අරුමයක් නොවේ.

එ.ජා.ප. ආණ්ඩුව යළි බලය තහවුරු කරගත් පසු යළි පරණ හොරු සුපුරුදු සෙල්ලමේම යෙදෙනු මේ දිනවල බලාගත හැකිය. රට ආරාජික වන බව පවසමින් එය ශක්තිමත් කිරීමට යයි කියමින් සමහර දේශපාලුවෝ රනිල්ගේ ඔඩොක්කුවට පැන්නෝය. ඔවුන් පනින හැම සීමාවක්ම ඔවුන්ට අනුව රට වෙනුවෙනි. ජනතාව වෙනුවෙනි. පුදුමය නම් මේ දේ නරුම දේශපාලන හැතිකරය මේ රටේ ජනයා තවමත් පිළිගැනීමය. මෙතරම් ප්‍රසිද්ධියේ ජනමතයට පස්ස හරවා එය හැල්ලුවට ලක්කරද්දීත් මේ දේශපාලන ගෙම්බන් තම ගැලවුම්කරුවන් ලෙස භාරගන්නා රටක ජනයාට අත්වන ඉරණම සිතා ගැනීමටවත් නොහැකිය. තවම කැබිනට්ටුව පත්කර අවසන් නැත. පත්කළ අය දෙස මදක් ඇස් ඇර බලන්න. විදුලි බලය ලෝක හොරෙකුට භාරය. සෞඛ්‍යය තවත් පල්හොරෙකුට භාරය. හොරුන් ප්‍රිය ජනයා

# මේ වසරත් ඒ මඟමද?

2019 වසරද උදාවිය. මෙයටද සුපුරුදු පරිදි නව වසරක් කියනු ඇත. රටේ ප්‍රධාන පුරවැසියාගේ සිට එදාවේල සොයා ගැනීමට නොහැකි පුරවැසියා දක්වා සුභ නව වසරක් වේවායි එකිනෙකාට සුභ පතා ගනිති. එහෙත් පුරා වසර 71ක් තිස්සේ කරන ලද මෙම ප්‍රාර්ථනය මෙතෙක් කිසිදා සඵල වී නොමැත. උදා වන සෑම වසරක්ම රටේ ජනයාට නම් අපල පිට අපලය. කරවටක් ප්‍රශ්න රාශියක ගිලී එකිනෙකාට සුභපතාගෙන යළි සුපුරුදු පරිදි මේ නාරා වලේ පැසී පැසී දැවෙන ජනයා මේ විදියට තව කොතෙක් කලක් දිවි ගෙවන්නද? මේ නාරාවලෙන් ගොඩ ඒමට ඔවුන්ට අධිෂ්ඨානයක් ඇත්තේම නැද්ද? එයට මාවතක් ඇත්තේම නැද්ද? මෙය මේ රටේ ජනයා නැවත නැවතත් තමන්ගෙන්ම ප්‍රශ්න කළ යුතු කාරණය නොවන්නේද?

රටේ ජනයාට ඇත්තටම සුභ වන්නේ කිනම් මාවතක ගමන් කළොත්ද? සිය තෝරා ගැනීම පසෙක තබා සුපුරුදු මාවතේම ඔවුන් කරබාගෙන ඔහේ ඉබාගාතේ ගමන් කරන තාක් කල් රටට හෝ ජනයාට සුගතියක් වේද? මෙය තේරුම් ගැනීමට මෙම වසර 71 හොඳටම ප්‍රමාණවත් නොවේද? මේ විනාශකාරී ගිනිගත් මාවතේ ගමන් කරමින් ගින්නේ දැවී දැවී එකිනෙකාට සුභපතා ගැනීම තරම් තවත් විහිළුවක් ලොව ඇද්ද? ඉන් ගැලවීමේ මාවත පෙනි පෙනීත් එය පසෙක දමා සුපුරුදු මාවතේම ගමන් කිරීමට තරම් තවමත් අප



රටේ ජනයා අවාසනාවන්තයින් වී ඇත්තේ ඇයි? නව වසරේ සිතට ගත යුතු දෑ එයයි. එසේ නොමැති වුවහොත් සියල්ල ගින්නෙන් දැවෙනතුරුම ඔවුන් සුපුරුදු මාවතේම ගමන් කරනු ඇත.

# වැරදුණු කුරුමානම




රාජපක්ෂ ප්‍රමුඛ ඔහුගේ ප්‍රවේණිදාසයන්ට අනුව මෙය රට බේරා ගැනීමේ මහා ප්‍රයත්නයකි. රාජපක්ෂලාගේ ඉඳුල් ලෙවකන, අතවැසි ජනයා හැර ඒ කුජීත කුමන්ත්‍රණය පරාජය කිරීම රටේ ප්‍රජාතන්ත්‍රවාදය යම් තරමකට හෝ ශක්තිමත් කිරීමක් ලෙස හිතන මතන ජනයා සලකති. මෙහිදී පිස්සු කෙළීම නිසා වැඩිපුරම නාගත්තේ රටේ ජනාධිපතිවරයාය. ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමට ගොස් හැල්ලු වූයේ ඔහුය.

ජනාධිපති පාර්ලිමේන්තු මන්ත්‍රී වී පසුව දින පනස්දෙකේ අගමැති වී අවසන විපක්ෂ නායක වී රාජපක්ෂගේ කුමන්ත්‍රණ මාවත තාවකාලිකව ඇහිරිණි. මෙය සැබෑ ජනතා ජයග්‍රහණයක් වීමට නම් රාජපක්ෂ ප්‍රමුඛ නඩයත්, රනිල් ප්‍රමුඛ නඩයත් සදාකාලිකවම පරාජය කළ යුතුය. මෙයින් සිදු වූ නරක දෙයක් නම් කුජීත වී සිටි රනිල්ලාගේ නඩය නැවත යම් ප්‍රමාණයකට ශක්තිමත් වීමය. එහි වගකීමද ජනාධිපතිවරයා ප්‍රමුඛ රාජපක්ෂ නඩය භාරගත යුතුය. රට ඇත්තටම බේරා ගැනීමට නම් කළ යුත්තේ මේ රටට වින කටින හොර කල්ලි දෙකම දේශපාලන භූමියෙන් සදාකාලිකවම අතුගා දැමීමය. එතෙක් එක ප්‍රපාතයකින් තව ප්‍රපාතයකට රටත් ජනතාවත් ඇද වැටීම හැර සිදු වන කිසිවක්ම නැත.

ගේමක් දී හොර පාරෙන් අගමැති වී බහුතරය ලබාගැනීමට අසමත්ව අනතුරුව කඩිනම් මහා මැතිවරණයකට ගොස් සමස්ත රාජ්‍ය බලයම පාවිච්චි කර ජය ලබා ව්‍යවස්ථාවටද ගේමක් දී නැවත ජනාධිපතිවීමේ සිහිනය දින 52කින් බිඳ වැටුණු රාජපක්ෂ රජාණෝ අන්තිමට නැවතුණේ යන්තම් විපක්ෂ නායකකම ලබාය. ඔහු වටා සිටි සියලු පුරෝහිතයන්ගේද, වන්දිභට්ටයන්ගේද ගෙවලයන්ගේද ඔජ දැමීම්, උපදේශයන් සියල්ල වතුරේ ගසාගෙන ගියේය. ජනාධිපතිවරයා ප්‍රමුඛ සියලු කුමන්ත්‍රණකරුවන්ගේ සිහින ලෝකය සිය දෙපා මුලම බිඳ වැටුණි.

# පොලිටිකල් පංතිය

පොලිටික්ක මාස එකහමාරක් විතර පංතියට ආවෙම නෑ. කිසිම ආරංචියක් තිබුණෙත් නැහැ. පොලිටික්ක වගේ කෙනෙක් මහින්ද මහත්තයගෙ රැස්වීම්වල අප්පුඩි ගහනව ටීවී එකෙන් දෙතුන් දෙනෙක් දැකල තිබුණ.

දෙසැම්බර් එක දවසක උදේ, හුඹහෙන් ඇදලා ගත්ත වගේ රූපකායක් පංතියෙ දොරෙන් ඇතුළට ඇදුණා.

"දෙයියනේ...සර්... ඔව්මයි සර්... ඒ සර්ම තමයි..." ඉස්සරහ බලන් හිටපු ළමයිගෙ කටින් පිටවුණා.

"හානේ සර්... ගුඩ් මෝනිං... අඳුරන්නත් බෑ. බලන්න... ඇදිලා ගිහින්," වසන්තිය හීල්ලුව.

"අනේ සර්... ලෙඩ වෙලා හිටියද? අපි දන්නෙවත් නෑ. කවුරුවත් කිවුවෙත් නෑ," අනුරුද්ධිය විස්සෝප වෙනව.

"ගුඩ් මෝනිං ළමයිනේ," පොලිටික්ක නෑහුණා වගේ මේසෙ ගාවට ඇවිදගෙන ඇවිත් සමාව භජනය කරන හිනාවක් දැම්ම.

"කියන්නකො සර් මොකද වුණේ?" පොලිටික්කට විසුමක් නෑ. "ලෙඩ වෙලා හිටියද සර්." "මොකද සර් ඔය?" "මූණ ඇදිලා" "හකු බැහැලා" තැන් තැන්වලින් ප්‍රශ්න පත්තරයක්.

"ළමයිනේ පහුගිය කාලෙ මම හරියට බිසි. වෙලාවට කෑමක් කන්න බැරිවුණා. නිදා ගන්න බැරිවුණා. ඒකයි." පොලිටික්ක හරය හංගලා පෙනුමට හේතුව කිවුව.

"මොකද්ද සර් ඔය තරම් බිසි. විභාගයක් තිබුණද? එක දිගට මළ ගෙවල්ද දානෙ ගෙවල්ද?" මංජුව රිංගන්න කොණක් පාදනව.

"ඒවා වැඩක් නෑ ළමයො" පොලිටික්ක ළඟ නැමුව.

"වැඩක් නෑ කියන්න එපා සර්. සර්ට නිදාගන්න බැරිවෙච්ච එක අපිට ප්‍රශ්නයක් නෙමෙයිද?" කනියත් ඇස් පොඩි කර කර සංවාදෙට එන්ටර් වුණා.

"ඔව්... ඔව් සර්. නිදා ගැනීම කියන්නෙ මානව අයිතියක්. අපි නිදාගැනීමේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය වෙනුවෙන් අවදියෙන් ඉන්න සූදානම්" මංජුව ඇඟිලිවලින් ඇහි බැම් පළල් කළා.

"මතක් කරන්න එපා ඔය ඉලව් ප්‍රජාතන්ත්‍රවාදෙ" පොලිටික්ක කිවුව නෙමෙයි කියවුණා, හිම්හිට. ඒත් අවාසනාවට හැමෝටම ඇහුණ.

"පොලිටිකල් උගන්නන සර්ට ප්‍රජාතන්ත්‍රවාදෙ එපා වුණානම් ඒක සෑහෙන්න බරපතළ ප්‍රශ්නයක්. නේද සර්?" සමනගෙ ප්‍රශ්නෙ පොලිටික්කට දැනුණෙ තමන් දිහාට ඇදෙන ඊතලයක් වගේ.

"ඔයාලට ඒකත් ඇහුණද? නෑ සමන් මම වැඩිය හිතල නෙමෙයි කිවුවෙ... පහුගිය දවස්වල වෙච්ච දේත් එක්ක...." පොලිටික්ක මොකද්දෝ කියන්න ඇවිල්ල කොණ ගිල්ල.

"පහුගිය දවස්වල සිද්ධ වුණේ සර් ප්‍රජාතන්ත්‍රවිරෝධී පාලනයක් හදන්න ගියපු එක පාර්ලිමේන්තුවෙනුයි අධිකරණෙනුයි රිවස් වෙච්ච එකනෙ. කවුද හිතුවෙ මහින්ද මහත්තය දුවන කෝච්චියකට බෙල්ල තියයි කියල. ඉතින් බෙල්ල නොගියනම් තමයි පුදුමෙ." සමන කියද්දි පොලික්කට පොළොව පළාගෙන යන තරම්.

"අයියෝ සර්... කිවුවෙනම් මහින්ද මහත්තය යුද්දෙට නායකත්වය දුන්න පරිණත නායකයෙක් කියලනෙ. දැන් බලාගෙන යනකොට ඒකත් ෂුවර් නෑ... මෛත්‍රී මහත්තගෙ ලණු කාලා දවස් 50ක අගමැතිකමකට කරගැහුවනෙ." මංජුව තොල පෙරළුව.

"නෑ නෑ, මහින්ද මහත්තය බැළුවෙ ආණ්ඩුව හයිජැක් කරල උසාවි කේස් ටික බේරගන්න. හැබැයි ටිකිරි මොළේ පොඩ්ඩක් එහා මෙහා වුණා. අන්තිමට විපක්ෂ නායක සැනසිලි තෑග්ගෙන් සැනසෙන්න සිද්ධ වුණා" චමිය ඔලොක්කු හිනාවක් දැම්ම.

"විපක්ෂ නායකකම තියා මන්ත්‍රීකමවත් රැකෙයිද කියල ෂුවර් නෑ. චණ්ඩියා වගේ පොහොට්ටු සාමාජිකත්වය අරගෙන අනිත් අයටත් සාමාජිකත්වය පිරිනමලා දැන් කියනවා පොහොට්ටුවෙ සාමාජිකත්වය ඉල්ලුවා විතරයි ගත්තෙ නෑ කියලා. කාටද කියන්නෙ... මේ රටේ මිනිස්සු රටේ මෝඩයො කියල හිතනවද දන්නෙ නෑ." සමන විග්‍රහය පටන් ගත්ත.

"එතකොට අර පොඩි කොළයක් අතේ තිබුණෙ. ඒ ඇප්ලිකේෂන් එකද?" කනිය බැට් එකටම බෝල් කළා.

"කැරැට්ටුව හොයල බලලනෙ සාමාජිකත්වය දෙන්නෙ. ඒක වෙන්න ඇති පරක්කු වෙන්න ඇත්තෙ. ටීවී ඉස්සරහ සාමාජිකත්වය අරගෙන, මෙම්බෂිප් කාඩ් එක පෙන්නල පෝස්ට් හදල දාල දැන් ගත්තෙ නෑ කියල පරසක්වල ගහනකොට මිනිස්සු දැනගන්න ඕනෙ, නොපෙන්න කරපු හොරකම් ගැන මෙයාල ටීවී ඉස්සරහ මොනව නොකියයිද කියල." සමන කියාගෙන යනකොට පොලිටික්ක විගහට කැන්ටිම පැත්තට ඇදෙනව කීපදෙනෙක් දැක්ක.

## ගොඩනගන පෙරමුණෙන්... 03 පිටුවෙන්



තුන් දෙනාම වෙන වෙනම හුදු පටු පුද්ගලික බල පොරයක ඉන්නවා. අශීලාචාර අශිෂ්ට බල පොරයක ඉන්නවා. ඉතින් මේ පොරය තවත් දිග්ගැස්සෙනවා. මේක ඉවර නැහැ. අද විධායක ජනාධිපතිවරයා එක පැත්තක - ආණ්ඩුව තව පැත්තක. ඒ හැප්පිල්ල එහෙමම යනවා. විධායක ජනාධිපතිවරයායි විපක්ෂ නායකවරයායි එක පැත්තක. ආණ්ඩුවේ ප්‍රධානියායි විපක්ෂනායකවරයායි එක පැත්ක. ඉතින් ආණ්ඩුව තවත් පැත්තක. මේ බලපොරය හැප්පි හැප්පි දිගට යනවා. කුමන්ත්‍රණය පරාද කළාට බල පොරය පරාද වෙලා නැහැ.

ඒ නිසා ජනතා විමුක්ති පෙරමුණ අපි අවධාරණය කරන්නේ පශ්චාත් කුමන්ත්‍රණ අවස්ථාවේ මේ බල පොරයත් මුළුමනින්ම පැරැද්දිය යුතුයි. ඒ වගේම ඒ බල වුවමනාවත් එක්ක රටේ ප්‍රජාතන්ත්‍රවාදය, ව්‍යවස්ථාව නැවත උල්ලංඝනය කරන්නට පටන් අරන් තියෙනවා. ඒක ඇතුලෙන් රිංගන්න පටන් අරන් තියෙනවා. ඒක රටේ අනාගත නිදහසට ප්‍රජාතන්ත්‍රවාදයට බාධාවක්. ඒ නිසා මේ කුමන්ත්‍රණය පරාද කිරීමෙන් පසු තත්වය සැබෑ ජනතා ජයග්‍රහණයක් දක්වා ඉදිරියට ගෙන යාම ජ.වි.පෙ. සතු කාර්යභාරයක්; වගකීමක්. අපි මේ රටේ ජනතාවත් එක්ක ඒකාබද්ධ වෙලා පරාද කරපු කුමන්ත්‍රණය ජනතාවගේ සැබෑ ජයග්‍රහණයක් දක්වා ඉදිරියට ගෙන යන්න කටයුතු කළ යුතුව තිබෙනවා.

***නියමුවාඃ- කැලඹිලිකාරී වසර අවසානයකින් පසු නව වසරක් එළඹ තිබෙනවා. ජනතාව හමුවේ නව අභියෝග මෙන්ම අවස්ථාවන්ද නිර්මාණය වී තිබෙනවා. මෙම ජනතාව බල මුළු ගැන්වීම සඳහා ජනතා විමුක්ති පෙරමුණේ සූදානම කවරාකාරද?***

***විජිත හේරත් සහෝදරයාඃ-*** ඉතා පැහැදිලිව වසර 70ක දේශපාලන අතීතයේ අපි ගොඩක් පාඩම් ඉගෙන ගෙන තියෙනවා. යූ.එන්.පී. - ශ්‍රීලංකා කොළ පාට නිල් පාට දෙපැත්තෙම රහ රටක් විදිහට අපි බලලා තියෙනවා. අන්තිමට මේ දෙගොල්ලොම එකතු වෙලා ආණ්ඩු කරන හැටි අපි දැක්කා. ඒ නිසා දැන් මේ මඩ ගොහොරුවෙන් රට මුදා ගත යුතුව තියෙනවා. නව වසරේ අප ඉදිරියේ තියෙන අභියෝගය ඒක. මාධ්‍ය ඉස්සරහා නිරන්තරයෙන් දෛනිකව අපි දකින අපට ඇහෙන මේ අශිෂ්ට බල පොරය වෙනුවට ජනතාවගේ බඩගින්න, විරැකියාව, අධ්‍යාපනය, සෞඛ්‍ය දුප්පත්කම, ඒ වගේම ඉන්න නිවාසයක් නැතිකම මේ ප්‍රශ්න ගොඩ ගැහිලා තියෙනවා. බදු බර, ණය බර, ජීවන බර ඒ ඔක්කොම ජනතාව මත පැටවිලා තියෙනවා. ඒ නිසා මේ ඇත්ත ප්‍රශ්නෙට දැන් අපි මුහුණ දිය යුතුව තියෙනවා.

මෛත්‍රීගේ රනිල්ගේ මහින්දගේ අශිෂ්ට බල පොරය බල බලා ඉන්නවා වෙනුවට ජනතාවගේ ඇත්ත ප්‍රශ්න විසඳන්න අපි මැදිහත් විය යුතුව තියෙනවා. ඒ නිසා හට ගත් සමාජ කතිකාව එතෙන්ට වෙනස් වෙන්න ඕනෑ. බල පොරයේ මාධ්‍ය සෙල්ලම් වෙනුවට ජනතාවගේ ඇත්ත ප්‍රශ්න ජනතාවත් එක්ක කතා කරන තැනට යන්න ඕනෑ. ඒ නිසා අපි හිතන්නේ නව වසරේ අපට තිබෙන අභියෝගය මේ රටේ දුක් විඳින තැලෙන පෑගෙන පොඩි වෙන ජනතාවගේ ඇත්ත ප්‍රශ්නවලට විසඳුම් ලබා ගන්නේ කොහොමද කියන එකයි; ඒ වෙනුවෙන් නව පාලනයක් ගොඩනගන්නේ කොහොමද කියන එකයි.

ඒ අභියෝගය අප ඉදිරිපිට තියෙනවා. ඒකට ජනතාව සූදානමින් ඉන්නවා. ජනතාව මේ හැත්තෑ අවුරුදු පාලනය ගැන හොඳටම කලකිරිලා ඉන්නේ. ජනපීඩක ආණ්ඩුව දැන් අප්‍රසන්න වෙලා තියෙන්නේ. ඒ නිසා ජනතාව පුල පුලා බලන් ඉන්නේ අලුත් විකල්ප බලයක් ගොඩනැගෙන තෙක්. ජනතා විමුක්ති පෙරමුණ මේ දවසින් දවස අගාධයට තල්ලු වෙමින් තියෙන මේ රට ගොඩනැගීම සඳහා පුළුල් ජාතික පෙරමුණක් එක්ක අලුත් ගමනක් යන්න සූදානම්. ජනතාව බලමුළු ගන්වන්න සූදානම්. ඒ වෙනුවෙන් අපි වසර ආරම්භයේ සිටම දැවැන්ත දේශපාලන ක්‍රියාමාර්ග ගණනාවක් ගන්නවා. අපි අනිවාර්යයෙන්ම මේ තත්වය වෙනස් කරනවා. මේ රට, ජනතාව දිනවන වැඩපිළිවෙළක් අපි අනිවාර්යයෙන්ම ජනතාව හමුවේ තබනවා. එය දිනවීම සඳහා ජනතාව එක් රැස් කරනවා බලමුළු ගන්වනවා.

## ප්‍රජාතන්ත්‍රවාදය... 05 පිටුවෙන්

පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලයක් නිර්මාණය කර ගත් අතර ඔහු එම බලය යොදාගත්තේ ජනාධිපති බලතල තවත් වැඩිකරන හා ජනාධිපති ධුරයට පත්වීමේ වාර 02 සීමාවද ඉවත් කරන 18වැනි සංශෝධනය සම්මත කර ගැනීමටය. මෙම පාර්ලිමේන්තුවේ විධායක ජනාධිපති බලතල තරමක් අඩුකරන ප්‍රජාතන්ත්‍රවාදී සංශෝධන 2ක් සම්මතව ඇති අතර 17වැනි හා 19වැනි සංශෝධන ඒ අවස්ථා දෙකය. ඒ දෙකම සම්මත කර ගැනීමට හැකිවූයේ පාර්ලිමේන්තුවේ ධනපති ආණ්ඩුවල බලය අස්ථාවර වූ අවස්ථාවල එම තත්වය උපයෝගී කර ගෙනය. එම අවස්ථා දෙකේම ඊට මූලිකත්වය ගත්තේද ජ.වි.පෙ.ය. ඒ, ප්‍රජාතන්ත්‍රවාදයේ අගය ජ.වි.පෙ. හොඳින් දන්නා නිසාය.

කෙසේ වුවත් රනිල් වික්‍රමසිංහ යළිත් අගමැති වීමෙන් පසු පැවැත් වූ රැලියේදී ප්‍රකාශකර තිබුණේ කුමක්ද? බලලා මල්ලෙන් එළියට පැන ඇත්තේ එහිදීය. ඔහු ප්‍රකාශකර තිබුණේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන නව ව්‍යවස්ථාවකට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් අවශ්‍ය බවත් ඊළඟ මැතිවරණයේදී ඒ සඳහා තම පක්ෂයට තුනෙන් දෙකක බලය ලබාදෙන ලෙසත්ය. "ගොනා හැරෙන්නෙ පොල් පැළය වෙත බව" තේරුම් ගැනීමට දේශපාලනයේ න්‍යායික විග්‍රහ අවශ්‍ය වන්නේ නැත. පෙර පාලකයන් මෙන්ම රනිල්ද මේ යළිත් සූදානම් වන්න් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ හා ප්‍රජාතන්ත්‍රවාදය දිනාගැනීමේ අරගලය හා උත්සාහය තම මැතිවරණ සටන් පාඨයක් ලෙස කොල්ලකෑමටය. ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් සටන් කරන බලවේග ඉඩ නොදිය යුත්තේ එයටය. මන්ද රාජපක්ෂලා මෙන්ම එ.ජා.ප.ය කිසිවිටෙක තම තනි බලයක් තුළ මෙය ඉටුනොකරන නිසාය.

දැන් ප්‍රජාතන්ත්‍රවාදයේ ධජය ඉහළින් ඔසවාගෙන ඒ යටතේ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා සටන් වදින බලවේග මෙම අනතුර හොඳින් හඳුනාගත යුතුය. තම සටන කොල්ලකෑමට එ.ජා.ප.යට ඉඩ නොදීමට එම බලවේග අදිටන් කර ගත යුතුය. ජ.වි.පෙ. ඇතුළු එම බලවේග ඉදිරිපිට ඇත්තේ එකිනෙක බැඳුණු ක්‍රියාමාර්ග දෙකකි. ඉන් පළමුවැන්න මේ පාර්ලිමේන්තුව තුළම 20වැනි සංශෝධනය සම්මත කොට විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා සටන් කිරීමත් ඒ සඳහා එ.ජා.ප.යට ශ්‍රීල.නි.ප.යට ඇතුළු පක්ෂවලට බලපෑම් කිරීමය. ඒ වෙනුවෙන් දැවැන්ත ජනමතයක් හැදීමය. ඒ අතරම ඔවුන් එය මෙම පාර්ලිමේන්තුව තුළ ඉටුකිරීමට සූදානම් නොමැති නම් ඒ සඳහා වන දැවැන්ත සමාජ බලවේගයක් නිර්මාණය කර ඊළඟ මැතිවරණයකදී එම බලවේගය පාර්ලිමේන්තුවේ බලය අත්පත් කරගැනීම හෝ අවම වශයෙන් තීරක බලයක් ලබාගැනීමය. එහිදී මෙරට ප්‍රජාතන්ත්‍රවාදය අගයන බලවේගයන්ට විශ්වාස කළ හැකි එකම පක්ෂය වන්නේ ජනතා විමුක්ති පෙරමුණය. එසේම එම කාර්යයේදී එම සටනේ මූලිකත්වය ගැනීමේ වගකීම ජ.වි.පෙ. සතුය. දැන් කළ යුතු වන්නේ, ප්‍රජාතන්ත්‍රවාදයේ සටන කොල්ලකෑමට රනිල්ට ඉඩ නොතබා රනිල් - මහින්ද මෛත්‍රී සියලු කණ්ඩායම්වලින් ස්වාධීන හා ඔවුන්ට එරෙහි ජනතාවාදී බලයක් ජනතා මධ්‍යස්ථානයක් නිර්මාණය කිරීමය. ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් අවංකවම සටන් වදින සැමගේ වගකීම එයයි.

## ඉතිහාසයේ පළමු... 11 පිටුවෙන්

හිමි ක්‍රමය බිහිවූයේ ප්‍රථමයෙන් ගෘහමය වහලුන් මගින් බව පෙනේ. පසුව වහලුන් ලෙස මිනිසුන් අල්ලා ගැනීම සඳහා වෙනත් ගෝත්‍ර ආක්‍රමණය කරන ලද අතර ඒ සඳහා ගෝත්‍ර යටත් කර ගැනීමේ සටන් හා යුද්ධද නිර්මාණය විය.

අවසානයේ වහල් හිමි සමාජය හා වහල්හිමි රජය බිහිවිය. එහිදී මිනිසා ඒ සඳහා පොළඹවනු ලැබුවේ නිෂ්පාදනයේ ඇතිවූ වර්ධනය බව පැහැදිලිය. ප්‍රාථමික සමාජයේ අග භාගයේදී ඒ තුළ බිහිවූ දේපළ හා අතිරික්ත ධනය පාලනය කර ගැනීමට තරම් එකී සමාජයේ ගෝත්‍රික හා වංශමය සංවිධානය සවිමත් හෝ දියුණුවී තිබුණේ නැත. ඒ අනුව වංශ සංවිධානය බිඳවැටී වහල් හිමි සමාජයට පදනම වැටුණි. ඒ සමග පෞද්ගලික දේපළ මත පංති බෙදීමද, පංති අතර ගැටුම්වලදී දේපළ අහිමි පංතිය පාගාගෙන පාලනය කිරීම සඳහා දේපළ හිමි පංතියෙ උපකරණය ලෙස රජයද ඇතිවුණි. ඒ සමගම දේපළ මතම පදනම්ව පවුල නැමති ඒකකයද නිර්මාණය වුණි. මෙම සමාජ පරිවර්තනය සිදුවූයේ එසේය.

පංති සමාජයේ ඓතිහාසික ගමන් මඟ පිළිබඳ කථා කිරීමට මීළඟට හමුවෙමු.

## විධායක ජනාධිපති... 13 පිටුවෙන්



වුණොත් මොකද වෙන්නේ කියා ඇස් පනාපිට දැක ගන්න.

අද මේ රටේ ජනතාවට වුවමනාවටත් වඩා හොඳින් ඔප්පු කර තිබෙනවා. එවැනි කෙනෙක් මේ පුටුවේ වාඩි වුණාට පසුව කුමන ආකාරයට හැසිරෙනවාද කියා. ඒ නිසා මේ අවස්ථාව පැහැර හරින්නට අපට කිසිදු සදාචාරාත්මක අයිතියක් නැහැ. එක පැත්තකින් පාර්ලිමේන්තුව, ඒ විධායකයේ තිබෙන අත්තනෝමතිකත්වය යම් ආකාරයකට පාලනය කර තිබියදී, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් එයට තීන්දු ලැබී තිබියදී, ජනාධිපතිවරයා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කඩ කළා කියා ශ්‍රේෂ්ඨාධිකරණයෙන් කියා තිබියදී, තවදුරටත් අපි මෙය පවත්වා ගෙන යනවාද?

අපි විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථා සංශෝධනය ගෙනාපු වෙලාවේ සමහර කුඩා කණ්ඩායම්, -ඒ ගොල්ලන්ට ලොකු පක්ෂයක එල්ලෙන්නේ නැතිව පාර්ලිමේන්තුවට එන්න බැහැ. පාර්ලිමේන්තුවට නොව ප්‍රාදේශීය සභාවකටවත් එන්න බැහැ- කල්පනා කරනවා, බල්ලාගේ ආගේ වහන මැක්කෝ වාගේ, කොහොම හරි මේකේ එල්ලිලා එන්න. එවැනි අය ලොක්කෙකුගේ ඔවැනි තනතුරු තියාගන්නට උත්සාහ කරනවා.

### තීරණය ජනතාවට

පසුගිය කාලයේ මෙහෙම කථාවක් කිවුවා. ඒ තමයි, "රටේ ලක්ෂ 159ක් වු ඡන්දදායකයන්ට තමයි පරමාධිපත්‍ය තිබෙන්නේ" කියන එක. ඇත්ත, පරමාධිපත්‍ය තිබෙන්නේ ජනතාව ළඟයි. ඒ වාගේම කිවුවා, "මේ රටේ මොකක්ද වෙන්න ඕනෑ කියන එක තීන්දු කරන්න ඕනෑ ඒ අයයි. ඒ නිසා ඒ ලක්ෂ 159ට අප ඉඩ දෙන්න ඕනෑ"යි කියලා.

ඒක හොඳයි. ඡන්ද දායකයාට එය තීන්දු කරන්න අපි අවස්ථාව දෙමු. ඡන්ද දායකයාට තීන්දු කරන්න අවස්ථාව දෙන්න නම් විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමේ යෝජනාවට පාර්ලිමේන්තුවෙන් බාධා නොකළ යුතුයි. පාර්ලිමේන්තුව ඒ - යෝජනාව අත්හිටුවීම නොකළ යුතුයි.

විධායක ජනාධිපති ධුරය තවදුරටත් පවත්වා ගෙන යා යුතුද, නැද්ද කියන එක තීන්දු කරන්න අපි මේ රටේ ජනතාවට අවස්ථාවක් දෙමු. විධායකය හොඳයි කියලා ජනතාව තීන්දු කරනවා නම් අපි ඒක පිළිගනිමු. හැබැයි, ඒක මෙතැනින බ්ලොක් කරන්න එපා. ඒ අවස්ථාව ජනතාවට දෙන්න.

තුනෙන් දෙකක බලය ගත්ත එක පාර්ලිමේන්තුවක්වත් ඒක 'වෙනස් කළේ නැහැ. මහින්ද රාජපක්ෂ මහත්මයා 2010 පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් හදාගෙන කරපු එකම දේ මොකක්ද? ඒ, දහහත්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරලා, දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැල්ලා විධායකයේ බලය තවදුරටත් වැඩි කරගත්ත එකයි. ජේ.ආර්. ජයවර්ධන මහත්මයා අඩු තරමින් මේ අත්තනෝමතික විධායක ජනාධිපති ධුරය වාර දෙකකට සීමා කර තිබුණා. මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේ ඒ සීමාවත් අයින් කර දැම්මා. තුනෙන් දෙකක් හදාගෙන. ඒ නිසා තුනෙන් දෙකක බලයක් ගත්ත කිසිම නායකයකු, පක්ෂයක බලයක් ගත්ත නායකයකු, පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලයක් තිබෙන නායකයකු කිසි දවසක ඔය විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්නේ නැහැ. අහෝසි කරනවා නම් මේක තමයි අවස්ථාව. ඒ, කාටවත් සරල බහුතරයක්වත් හදා ගන්න බැරි මේ අවස්ථාව.

මේ අවස්ථාවේදී අපි සියල්ලෝම එකතු වෙමු. අඩු තරමින් ඒ කුමන්ත්‍රණය පරාජය කරන්න පසුගිය දින 50 ඇතුළත එකතු වුණු සියලුදෙනාටම අපි කියනවා, මේ වෙලාවේ ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන්, දේශපාලන සදාචාරය සහ ශිෂ්ටත්වය වෙනුවෙන් එක පෙළට සිටගෙන විධායක ජනාධිපති ධුරය අහෝසි කරලා අපි මේ පාර්ලිමේන්තුව පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් දක්වා ගමන් කරවමු කියලා.

එම නිසා තවදුරටත් ප්‍රමාද නොකර අපි ඉදිරිපත් කර තිබෙන විසිවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකකින් අනුමත කරලා අපි ජනතාව ඉස්සරහට ගිහිල්ලා ජනතාවගේ අනුමැතිය අරගෙන මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ශක්තිමත් පදනමක් දැමීම -හොඳ අත්තිවාරමක් දැමීම- සඳහා මේ මහඟු කටයුත්තට අපි හැමදෙනාම එක සේ දායක වෙමු කියන ඉල්ලීම කරමින් මම නතර වෙන්නම්.

## සමාජවාදය ගැන... 09 පිටුවෙන්

නිෂ්පාදනය කරයි. මෙම ක්‍රියාවලියේ අත්‍යාවශ්‍ය ලක්ෂණය වන්නේ -දෙකම මූර්ත වටිනාකම ලෙස ගණන් බැලූ කල- කම්කරුවා නිපදවන දෙය හා ඔහුට ගෙවනු ලබන දෙය අතර සම්බන්ධයයි. ශ්‍රම ගිවිසුම 'නිදහස්' බැවින් ඒ තාක් දුරට කම්කරුවා ලබන දෙය තීරණය වන්නේ, ඔහු නිපදවන දෙයෙහි පූර්ණ වටිනාකම අනුව නොව ඔහුගේ අවම අවශ්‍යතාව සහ රැකියා සඳහා තරගයේ යෙදෙන කම්කරුවන්ගේ ගණනට සාපේක්ෂව ශ්‍රම ශක්තිය සඳහා ධනපතියාගේ අවශ්‍යතාව යන කරුණු දෙකෙනි. න්‍යායිකව පවා කම්කරුවාගේ වැටුප තීරණය වන්නේ ඔහුගේ නිෂ්පාදනයේ වටිනාකම විසින් නොවන බව තේරුම් ගැනීම ඉතාම වැදගත්ය.

ධනපතියන් අතර ඇති තරගය නිසාත් තාක්ෂණික සංවර්ධනය හා ශ්‍රම විභජනය තිව්‍ර වීම විසින් කුඩා දෙයකින් දැවැන්ත නිෂ්පාදනයක් සිදු කිරීමට හැකි වන නිසාත් පුද්ගලික ප්‍රාග්ධනය කිහිප දෙනෙකු අත සංකේන්ද්‍රණය වීමට පෙළඹේ. මෙම වර්ධනයන්ගේ ප්‍රතිඵලය වන්නේ, ප්‍රජාතාන්ත්‍රිකව සංවිධානය කරනු ලැබූ දේශපාලන සමාජයකදී පවා සාධාරණ ලෙස පාලනය කළ නොහැකි පුද්ගලික ප්‍රාග්ධන ඒකාධිකාරයේ අතිමහත් බලයයි. ව්‍යවස්ථාදායක සභාවක් සඳහා සභිකයින් තෝරා පත් කර ගනු ලබන්නේ පුද්ගලික ධනපතියන්ගෙන් විශාල වශයෙන් මූල්‍යමය ආධාර හා වෙනත් ආකාරයන්ගේ බලපෑම්වලට නතුවන දේශපාලන පක්ෂ විසින් වන බැවින් මෙය සත්‍යය. ඔවුන් සියලු ප්‍රායෝගික කරුණුවලදී ඡන්දදායකයා ව්‍යවස්ථාදායක සභාවන්ගෙන් වෙන් කරනු ලබයි. එහි ප්‍රතිඵලය වන්නේ වරප්‍රසාද අහිමි ජනතාවගේ වුවමනාවන් ජනතා නියෝජිතයින් විසින් ප්‍රමාණවත් පරිදි ආරක්ෂා නොකිරීමයි. තවද මෙකී තත්වයන් යටතේ පුද්ගලික ධනපතියින් විසින් තොරතුරු දැනගැනීමේ ප්‍රධාන ධාරාවන් (පුවත් පත්, ගුවන් විදුලිය, අධ්‍යාපනය) නොවැළැක්විය හැකි ලෙසම පාලනය කරනු ලබයි. ඇත්ත වශයෙන්ම තනි පුරවැසියෙකුට බොහෝ අවස්ථාවලදී ඔහුගේ දේශපාලන අයිතීන් බුද්ධිමත්ව පාවිච්චි කිරීමට හෝ විෂය මූලික ගණන් බැලීමකට අනුව තීරණයකට එළඹීම අතිශය දුෂ්කර වන්නේ මෙන්න මේ නිසාය.

ප්‍රාග්ධනයේ පුද්ගලික අයිතිය මත පදනම් වූ ආර්ථිකයක් මූලධර්ම දෙකක් මගින් හැඩ ගැසේ. පළමුව නිෂ්පාදන බලවේගයන්ගේ පුද්ගලික අයිතිය සහ දෙවනුව ශ්‍රම ගිවිසුම නිදහස්වීමයි. ඇත්තවශයෙන්ම මේ ආකාරයේ 'පිරිසිදු' ධනපති සමාජයක් නොපවතී. කම්කරුවන් දීර්ඝ හා කටුක දේශපාලන අරගලයන්ගේ ප්‍රතිඵලයක් ලෙස සමහර කම්කරු ශ්‍රේණිවල හෝ 'නිදහස් ශ්‍රම ගිවිසුම්'වල දියුණු ආකාරයක් දිනා ගැනීමට සමත් ව සිටින බව විශේෂයෙන් සඳහන් කළ යුතුය. නමුත් සමස්තයක් ලෙස ගත් විට අද දවසේ ආර්ථිකය පිරිසිදු ධනවාදයෙන් බොහෝ දුරකට වෙනස් නොවේ.

මෙම මහා ව්‍යසනයන්ගෙන් මිදීමට ඇත්තේ එක් මඟක් පමණක් බව මට තහවුරු වී තිබේ. එනම් සමාජීය අරමුණු වෙනුවෙන් යොමු වූ අධ්‍යාපන ක්‍රමයක් සමග සමාජවාදී ආර්ථිකයක් ස්ථාපිත කිරීමයි. එවැනි ආර්ථිකයකදී නිෂ්පාදන මාධ්‍යයන් සමාජ අයිතියේ පැවතිය යුතු අතර පරිභෝජනය සැලසුම්ගත ආකාරයෙන් සිදුකළ යුතුය. සමාජයේ අවශ්‍යතාවන් අනුව නිෂ්පාදනය හැඩගස්වනු ලබන සැලසුම්ගත ආර්ථිකයක් වැඩ කළ හැකි සියලු දෙනා අතර වැඩ බෙදා දෙනු ලබන අතර සෑම ළමයෙකුටම, කාන්තාවකටම, හා සෑම පුද්ගලයෙකුටම ජීවිකාව සහතික කරනු ඇත. අද දවසේ සමාජය තුළදී සිදු කෙරෙන සාර්ථකත්වය හා බලය උත්කර්ෂයට නැංවීම වෙනුවට පුද්ගල අධ්‍යාපනය ඔහුගේ සහජ හැකියාවන් වැඩි දියුණු කරන අතරම සිය සහෝදර මිනිසුන් කෙරෙහි වගකීම් සහගතභාවය වර්ධනය කිරීමට උත්සාහ දරනු ඇත.

අපගේ මෙම සංක්‍රමණික යුගයේදී සමාජවාදයේ අරමුණු හා ගැටලු පිළිබඳ පැහැදිලිතාවය ඉතාම වැදගත්ය. මෙම ගැටලු පිළිබඳ නිදහස් හා බාධාවකින් තොර සාකච්ඡාවක් ඇතිවීම තදබල තහනමකට ලක්කර ඇති නිසා මෙම සඟරාවේ ආරම්භය ඉතා වැදගත් මහජන සේවාවක් වනු ඇතැයි මම සිතමි.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




කිලිනොච්චියේ ගංවතුරින් විපතට පත් ජනතාව හමුවී...



ජනතාවාදී පාලනයක් ගැන ජනතාව දැනුවත් කරමින්...



ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙළගැසුණු තාරුණ්‍යය...



ඓතිහාසික නඩු තීන්දුවෙන් පසු නීතිඥවරුන් සමග




එතෙර අපි සහයෙන් අනුරපුර දරුවන්ට පාසැල් උපකරණ

# සැකයෙන් බැලූ අය ජ.වි.පෙ දෙස සුභවාදීව බැලීමට පටන් ගෙන තිබෙනවා

## ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා



මේ වන විට දේශපාලනයේ හොඳම වටපිටාව නිර්මාණය වෙමින් තිබෙන බවට කරුණු දැක්වූ ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා ජ.වි.පෙ. පිළිබඳව සැකයෙන් බැලූ අය ජ.වි.පෙ දෙස සුභවාදීව බැලීමට පටන් ගෙන ඇති බවත් ඒවා ජනතා ජයග්‍රහණයක් වෙත හරවා ගන්නේ කෙසේද යන වගකීම තම පක්ෂයට ඇති බවත් අවධාරණය කළේය.

ඔහු මෙම අදහස් පළ කළේ පසුගිය 15වැනි දින කිරුළපන ක්‍රීඩාංගණයේ පැවති ජනතා විමුක්ති පෙරමුණේ උද්ඝෝෂණ රැලියේදීය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"මේ පස අස්වද්දන්න ඕනෑ. සාරවත් බීජ පැළකරන්න පුළුවන් පසක් බවට පත්කරන්න ඕනෑ. කිසිවෙකුට එම දේශපාලනය මඟහරින්න පුළුවන්කමක් නැහැ. එයට පාර කැපුවේ මහින්ද මෛත්‍රී රනිල් කැත දේශපාලන සූදුවයි. තව ටික දිනකින් රනිල් වික්‍රමසිංහලාගේ බොරු ප්‍රජාතන්ත්‍රවාදය දැකගන්න පුළුවන්කම ලැබෙනවා. රනිල් වික්‍රමසිංහ කියන්නේ පක්ෂයේ ප්‍රජාතන්ත්‍රවාදයවත් රැකපු නැති පුද්ගලයෙක්. පහුගිය කාලේ වෙළඳ ගිවිසුම් ගහනකොට, හම්බන්තොට වරාය විකුණනකොට අවම ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම භාවිතා කළේ නැහැ. අලුත් ව්‍යවස්ථාව හදනකොට ජනතා අදහස් විශාල ප්‍රමාණයක් ආවා. නමුත් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදය මූලික අයිතිවාසිකම් ආරක්ෂා වෙන විදියේ නව ව්‍යවස්ථාවක් හදන්න රනිල් වික්‍රමසිංහලාගේ කඳවුරට වුවමනාවක් නැහැ. රනිල් වික්‍රමසිංහ කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ හොර මුරකරුවා.

රාජපක්ෂගේ කඳවුරේ දේශපාලන ජාතිවාදය, ගෝත්‍රවාදය, ආගම්වාදය. ඒ රංගනයට තමයි නැවත පොරකන්නේ. කුමන්ත්‍රණයෙන් පරාජය වුණාට පස්සේ යළි සීග්‍රයෙන් ආගම්වාදයට ජාතිවාදයට ගමන් කරමින් ඉන්නවා. නඩු තීන්දුවෙන් පස්සේ අගවිනිසුරුතුමාට ආගම් පදනම් කරගෙන විවේචන එල්ල කරනවා. සමහර ස්වාමින්වහන්සේලා දේශනා කරනවා නඩු තීන්දුව මාතෘභූමියට එරෙහිව කරන ලද කුමන්ත්‍රණයක්ලු. රාජපක්ෂලා දේශප්‍රේමීන්ද? මාතෘභූමියට ආදරය කරනවද? රාජපක්ෂ පවුලම රටේ ධනය හොරකම් කරලා තිබෙනවා. තාත්තයි අම්මයි පුතයි මල්ලියි බාප්පයි සියලු දෙනා එකට හොරකම් කළා. එහෙම අය කොහොමද මාතෘභූමියට ආදරය කරන්නේ. රාජපක්ෂ කණ්ඩායමේ සමහර අයට මහත්තයටයි නෝනටයි දෙන්නටම නඩු. එනිසා ඔවුන්ට තිබෙන්නේ තවරගත්තු පොරවාගත්තු දේශප්‍රේමයක්. එනිසා තවදුරටත් මේ බොරු දේශප්‍රේමයට, ආගම්වාදයට ජාතිවාදයට තවත් ඉඩ ලබානොදිය යුතුයි. එයට එරෙහිව පෙරමුණක් ගොඩනැගිය යුතුයි."

මෙම රැලියේදී කැළණිය විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය විජිත් රෝහණ මහතා, සමස්ත ලංකා තරුණ හින්දු සම්මේලනයේ ප්‍රධාන ලේකම්, සතිස් කුමාර් මහතා, අලුත් පරපුර සංවිධානය වෙනුවෙන් චිත්‍රපට අධ්‍යක්ෂක ප්‍රියන්ත කළුආරච්චි මහතා, විවෘත විශ්විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය හරිනි අමරසූරිය මහත්මිය, ප්‍රවීණ සාහිත්‍යවේදී කමල් පෙරේරා මහතා, නීතිඥ උපුල් කුමරප්පෙරුම මහතා, ප්‍රවීණ රංගන ශිල්පිනි දීපානි සිල්වා මහත්මිය, ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ හිටපු උප ලේකම් නීතිඥ චරිත් ගල්හේන මහතා, වමේ කේන්ද්‍රයේ සම කැඳවුම්කරු මහාචාර්ය මයිකල් ප්‍රනාන්දු මහතාද අදහස් දැක්වූහ.

















# අධිනීතිඥ ප්‍රින්ස් ගුණසේකර මහතාට
# ජනතා විමුක්ති පෙරමුණේ ගෞරවාචාරය

ප්‍රතිපත්තිගරුක මිනිසෙක් වූ ප්‍රින්ස් ගුණසේකර මහතා අයුක්තිය අසාධාරණය හමුවේ මුනිවත රකිනවා වෙනුවට ඊට එරෙහිව හඬ නැගූ බවත් සෑමවිටම ඔහු ගෞරවයෙන් සිහිපත් කළ යුතු බවත් අවධාරණය කරන ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩලය ඔහු සමුගෙන තිබෙන මේ මොහොතේ අධිනීතිඥ ප්‍රින්ස් ගුණසේකර මහතාට ජනතා විමුක්ති පෙරමුණේ ගෞරවාචාරය පුදකර සිටිමු යැයි පසුගිය 31වැනි දින නිවේදනයක් නිකුත් කරමින් කියා සිටී. එම නිවේදනය සම්පූර්ණයෙන් මෙසේය.

ශ්‍රී ලංකාවේ වමේ හා ප්‍රගතිශීලී කඳවුර නියෝජනය කළ දේශපාලනඥයෙක් වූද, ප්‍රබල මානව හිමිකම් ක්‍රියාකාරිකයෙක් වූද, අධිනීතිඥ ප්‍රින්ස් ගුණසේකර මහතාගේ අභාවය පිළිබඳව ජනතා විමුක්ති පෙරමුණ සිය බලවත් සංවේගය පළකර සිටී.

ප්‍රින්ස් ගුණසේකර මහතා හා ජනතා විමුක්ති පෙරමුණ අතර පැවැති සම්බන්ධය 1970 දශකයේ ආරම්භය දක්වා දිවෙන්නකි. ඔහු දිගු කලක් තිස්සේ ජ.වි.පෙ. සමගත් ජ.වි.පෙ. නිර්මාතෘ රෝහණ විජේවීර සහෝදරයා සමගත් සමීප සබඳතාවයක් පවත්වාගෙන ගියේය.

1970 මැතිවරණයේදී ශ්‍රීල.නි.ප මන්ත්‍රීවරයෙක් ලෙස හබරාදූව ආසනය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට තේරී පත් වුවද 1971 අරගලයේදී ඔහු ජ.වි.පෙ. මර්දනය කිරීමට එරෙහිව කටයුතු කළේය. 71 අරගලය පවතින සමයේ බ්‍රිතාන්‍ය සාමි මන්ත්‍රී මණ්ඩලයේ මානව හිමිකම් ක්‍රියාකාරිකයෙක් වූ ඇවබරි සාමිවරයා ලංකාවට පැමිණි විට ඔහු සමඟ දකුණේ ප්‍රදේශවල සංචාරය කළේ ප්‍රින්ස් ගුණසේකර මහතාය.

එසේම 1971 අරගලයේදී සිරගතවූවන් වෙනුවෙන් නීති ආධාර ලබාදීමට ඔහු ඉදිරිපත් විය. එතැන් සිට දිගටම ජනතා විමුක්ති පෙරමුණේ නීතිමය කටයුතුවලදී ඔහු ලබාදුන් සහාය විශාලය.

1977න් පසු ජ.වි.පෙ. ප්‍රසිද්ධ දේශපාලන තලයේ සක්‍රීය වෙද්දී ප්‍රින්ස් ගුණසේකර මහතා ජ.වි.පෙ. සමඟ එක්ව බොහෝ අවස්ථාවල කටයුතු කළේය. 1978 කාලයේ ලංකාව පුරා පැතිර ගිය ජාතිවාදී කෝලාහලවලට එරෙහිව ජාතික සමගිය වෙනුවෙන් ජ.වි.පෙ. රට පුරා පැවැත්වූ ප්‍රසිද්ධ රැලි මාලාවේදී ඔහුද කථිකයෙක් විය.

1982 ජනාධිපතිවරණයට රෝහණ විජේවීර සහෝදරයා සටන්වදින විට ඔහුගේ නීති උපදේශක ලෙස කටයුතු කළේද ප්‍රින්ස් ගුණසේකර මහතාය. එසේම 1982 දෙසැම්බර් පැවැති ජනමතවිචාරණ ඡන්ද මංකොල්ලයට එරෙහිව නඩු පැවරීමට ජ.වි.පෙ. තීරණය කළ විට රෝහණ විජේවීර සහෝදරයා වෙනුවෙන් එම නඩුව ගොනු කිරීමේ කාර්යය භාරගත්තේද ප්‍රින්ස් ගුණසේකර මහතාය. එසේම එම නඩුව සඳහා කලක් ජ.වි.පෙ.ට විරුද්ධ කඳවුරේ සිටි ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායක මහතා සම්බන්ධ කර දීම කළේද ඔහුය.

1983 මුල පැවැති අතුරු මැතිවරණවලදී ඔහු හබරාදූව ආසනයට ස්වාධීනව තරඟවදින විට ජ.වි.පෙ. එයට තරඟ නොවැදී ප්‍රින්ස් ගුණසේකර මහතාට සහය දැක්වීය. ඒ ඔහු සමඟ තිබූ සමීප දේශපාලන සබඳතාවය නිසාය.

1983 ජවිපෙ මර්දනය කිරීමෙන් පසු අතිවූ මර්දනකාරී තත්වය තුළද ප්‍රින්ස් ගුණසේකර මහතා ජ.වි.පෙ.ට ප්‍රජාතන්ත්‍රවාදී ලෙස දේශපාලනය කිරීමට ඇති අයිතිය



වෙනුවෙන් පෙනී සිටියේය. එවකට පැවැති එ.ජා.ප. පාලනය මානව හිමිකම් අමු අමුවේ උල්ලංඝනය කරන විට මානව හිමිකම් රැකීම සඳහා ඔහු විශාල කාර්යභාරයක් කළේය. අවසානයේ ප්‍රේමදාස පාලනය තුළ මානවවාදී නීතිඥයින් පවා ඝාතනය කරන විට සිය ජීවිතය බේරාගැනීම සඳහා රටින් පිටවීමට ප්‍රින්ස් ගුණසේකර මහතාට සිදුවිය. ඔහු විදේශගතව ලන්ඩනයේ සිටියදී පවා හැකි හැම විටම ජ.වි.පෙ.ට උදව් කළේය.

ප්‍රින්ස් ගුණසේකර මහතා ප්‍රතිපත්තිගරුක මිනිසෙක් විය. මානවවාදී මිනිසෙක් විය. අයුක්තිය අසාධාරණය හමුවේ මුනිවත රකිනවා වෙනුවට ඊට එරෙහිව හඬ නැගීය. සෑම විටම ඔහු ගෞරවයෙන් සිහිපත් කළ යුතු වන්නේ ඒ නිසාය.

අවසාන වශයෙන් ඔහු අපෙන් සමුගෙන තිබෙන මේ මොහොතේ ඔහුගේ පවුලේ සියලුදෙනා වෙත අපගේ බලවත් ශෝකය පළකරන අපි අධිනීතිඥ ප්‍රින්ස් ගුණසේකර මහතාට ජනතා විමුක්ති පෙරමුණේ ගෞරවාචාරය මෙසේ පුදකර සිටිමු.


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.